# රෙදෙව්සරෙහි සරාසඳ

## ශාස්ත්‍රීය සංග්‍රහය
(e - journal)



ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රකාශනයකි

SLBC
Sri Lanka Broadcasting Corporation

# රෙදෙව්සරෙහි සරාසඳ

ජාතික ගුවන් විදුලියේ
මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මැදිරිය
නාමීකරණෝත්සව සමගාමී
ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුවන් විදුලි විද්‍යුත් වෙළුම

**ප්‍රථම සංස්කරණය**
2023 මාර්තු

**ප්‍රවර්ගය**
අනුස්මරණ ඊ වෙළුමකි
(Commomarative E Volume)

ISBN

ISBN 978-624-6383-00-8

9 786246 383008

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

**සංස්කරණය**

ඉන්දික ජයරත්න
නාලක ජයසේන

මෙම කෘතියේ එන අදහස්වල වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර සංස්කාරකවරුන්ගේ හෝ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අදහස් ඒවායේ නියෝජනය නො වෙයි.

පටුන


ගරු සභාපතිතුමාගේ පණිවුඩය 4

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය 5

සංස්කාරක සටහන 6

සරච්චන්ද්‍ර උපහාර ගීතය 7

01 සරච්චන්ද්‍ර නම් දාර්ශනිකයා සහ භාෂා දෙපාර්තමේන්තු

දර්ශන අශෝක කුමාර 8 - 12

02 ශාස්ත්‍රෝන්නතිය උදෙසා නැණ පහන් දැල්වූ කිසි දිනෙක බැස නොගිය සරා සඳ

චන්ද්‍රිකා ජයකාන්ති මානගේ 13 - 18

03 සරච්චන්ද්‍රට ගුවන් විදුලිය, ගුවන් විදුලියට සරච්චන්ද්‍ර

සරත් විජේසූරිය 19 - 21

04 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ දෘශ්‍ය කලා පෝෂණය වීමට ශ්‍රව්‍ය මාධ්‍යක් ලෙස ජාතික ගුවන් විදුලිය වෙතින් ලද දායකත්වය

එදිරිවීර ගුණසේකර 22 - 24

05 සංස්කෘතික ඉතිහාසය හා විචාරයෙහිලා ගුවන් විදුලියේ දායකත්වය (මනමේ නාට්‍යය ඇසුරෙන්)

ලියනගේ අමරකීර්ති 25 - 28

06 පශ්චාත් යටත්විජිතවල ජාතික සංස්කෘතිය හා ලාංකේය දේශීය නාට්‍ය කලාවක් නිර්මාණය කිරීමේ ප්‍රතිවිරෝධතාඃ ඃ මනමේ නිෂ්පාදනය පිළිබඳ ෆැනොන්වාදී කියවීමක්.

සමන් එම් කාරියකරවන 29 -49

07 ශ්‍රාවක රසවින්දනය උදෙසා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ශාස්ත්‍රීය සංග්‍රහය ඇතුළු නිර්මාණ ලබාදුන් දායකත්වය පිළිබඳ විමර්ශනයක්

ඉන්දික ජයරත්න 50 - 55

08 සරච්චන්ද්‍ර සන්නිවේදන භූමිකාව

සඳගෝමී කෝපරහේවා 56 - 60

09 මහඇදුරු සරච්චන්ද්‍රයන්ගේ ශ්‍රී ලාංකේය ගුවන් විදුලි සම්ප්‍රදාන භූමිකාව

සුරෝෂන ඉරංග 61 - 63

10 පෙමතො ජායති සොකො නාට්‍යයෙන් සංනිරූපිත සරච්චන්ද්‍රයන්ගේ පාරලෞකික චින්තනය

නාලක ජයසේන 63 - 69

**සභාපතිතුමාගේ පණිවුඩය**

ශ්‍රී ලංකාවේ මාධ්‍ය සංස්කෘතිය පෝෂණය කිරීමට පුරෝගාමී වූ සන්නිවේදන ආයතනය වන්නේ ජාතික ගුවන් විදුලියයි. සියවසකට ආසන්න දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ලංකා ගුවන් විදුලිය, මෙරට ජනතාවගේ සන්නිවේදන අවශ්‍යතා සපුරා දුන් ප්‍රමුඛ ආයතනයයි. ගුවන් විදුලි ශ්‍රාවක ප්‍රජාවගේ ආනන්දයත්, ප්‍රඥාවත් උදෙසා ගුවන් විදුලිය ශත වර්ෂයක කාලයක් සිය සන්නිවේදන මෙහෙවර ඉටු කර ඇත. ග්‍රාහක ප්‍රජාවගේ ආනන්දය උදෙසා උසස් රසවින්දනාත්මක වැඩසටහන් සමුදායක් අද ද ජාතික ගුවන් විදුලිය ඉදිරිපත් කරනු ලබයි. මෙම වැඩසටහන්හි ආරම්භය පිළිබඳව කථා කරන විට අමතක කළ නොහැකි නමක් වන්නේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාමයයි.

1950 දශකය ආරම්භයේ එතුමා ගුවන් විදුලි ශ්‍රාවකයාගේ රසවින්දනය උදෙසා නවක රඟමඩල, යෞවන සමාජය, ද්විතීය සංග්‍රහය, ශාස්ත්‍රීය සංග්‍රහය, ගුවන් විදුලි රඟ මඬල සහ විශ්ව සාහිත්‍ය වැනි වැඩසටහන් ආකෘති ජාතික ගුවන් විදුලිය සඳහා හඳුන්වා දුන්නේය.

අද ද ගුවන් විදුලියේ නොනැසී පවතින විශිෂ්ට වැඩසටහන් ආකෘති දෙකක් පවතී. ඒ, 1928 දී පැලැනේ ශ්‍රී වජිරඥාන නා හිමියන් ආරම්භ කළ ගුවන් විදුලි ධර්ම දේශනා ආකෘතිය සහ 1951 දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් හඳුන්වා දුන් ශාස්ත්‍රීය සංග්‍රහය, රඟමඩල සහ විශ්ව සාහිත්‍ය වැඩසටහන් ආකෘතියයි. ගුවන් විදුලි ශ්‍රාවකයාගේ රසභාවයන් සංතෘප්ත කරන මෙම වැඩසටහන් ගුවන් විදුලියේ යාවජීව බවට කදිම නිදසුන්ය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර වැනි අග්‍රගණ්‍ය සාහිත්‍යධරයෙකු ජාතියට හඳුන්වා දීමෙහිලා ගුවන් විදුලිය පුරෝගාමී වීම පිළිබඳව මා තුළ ඇත්තේ අනතිමානී සතුටකි.

මෙරට සාහිත්‍යය විචාරයට යථාර්ථවාදී සාහිත්‍ය රීතිය හඳුන්වා දීමෙහි පුරෝගාමියා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර වැනි සාහිත්‍යධරයෙකුට සිය නිර්මාණ සහෘද ශ්‍රාවක ප්‍රජාවට තිළිණ කිරීමට ජාතික ගුවන් විදුලිය තිඹිරි ගෙය වී තිබේ. ගුවන් විදුලිය පෝෂණය කිරීමට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගෙන් ලද නිසල් දායකත්වය කිසි ලෙසක ලඝු කළ නොහැකිය. එවන් මහා සාහත්‍යධරයෙකු වෙනුවෙන් ජාතික ගුවන් විදුලියේ මැදිරි අංක 02 එතුමා නමින් නම් කිරීම මහාචාර්ය සරච්චන්ද්‍රයන්ට කරන විශාල ගෞරවයකි. සාහිත්‍යකරණයෙහිලා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ට ගුවන් විදුලියෙන් ලබා දුන් දායකත්වය විමර්ශනය කරමින් එළි දක්වන "රෙදෙව්සරෙහි සරාසඳ" ශාස්ත්‍රීය විද්‍යුත් ග්‍රන්ථයට කෙටි සටහනක් එකතු කිරීමට ලැබීම සොම්නස සපිරි භාග්‍යයක් කොට සලකමි.

**හඩ්සන් සමරසිංහ**
**සභාපති**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**

**අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය**

**ජාතික සන්නිවේදන අවකාශයේ සංස්කෘතික ධාරාව පෝෂණය කළ රෙදෙව්සරෙහි සරාසඳ**

ගුවන් විදුලිය යනු සුවිශේෂ වූ සංස්කෘතික ප්‍රභවයකි. විසිවන සියවසේ දෙවන දශකයේ ආරම්භ වන ලංකා ගුවන් විදුලිය මෙරට ශ්‍රාවක ප්‍රජාවගේ සන්නිවේදන අවශ්‍යතාව සපුරන ලද ආයතනයක් පමණක් නොවේ. පාඨක සංස්කෘතියට හානි නොකරමින්ම මහාර්ඝ ශ්‍රව්‍ය සංස්කෘතියක පදනම දැමූ ගුවන් විදුලිය මෙරට ශ්‍රාවක ප්‍රජාව සුපෝෂණය කළ උපස්ථම්භකයක් ලෙස හැඳින්විය හැකිය.

ආනන්දයත්, ප්‍රඥාවත් ශ්‍රාවක ප්‍රජාවට දානය කළා වූ ලංකා ගුවන් විදුලිය ලෝකයේ ප්‍රථම ගුවන් විදුලිය වූ බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයට දෙවැනි වන ආසියාවේ ප්‍රථම ගුවන් විදුලි සන්නිවේදන ආයතනයයි. මනෝ චිත්‍රණයනට උත්ප්‍රේරකයක් වෙමින් මෙරට ශ්‍රාවක ප්‍රජාවගේ රසභාවයන් ප්‍රමුදිත කළ ගුවන් විදුලිය, සිය ශත සංවත්සර පූර්ණය අභිමුව සීමා මායිම් රහිත සයිබර අවකාශය හෙවත් අන්තර්ජාලය වෙත ද සන්නිවේදන මානයන් ප්‍රතිනිර්මාණය කරමින් සිටී.

1924 දී කුඩා ට්‍රාන්සර්මීටරයක් ආධාරයෙන් සිය සන්නිවේදන මෙහෙවර ආරම්භ කළ ලංකා ගුවන් විදුලිය අද ග්‍රාහක ප්‍රජාවගේ ඇඟිලි තුඩග වෙත සන්නිවේදන අවකාශය සමීප කර තිබේ. ගුවන් විදුලිය මෙරට සමාජ, සංස්කෘතික, ආගමික හා දේශපාලනය යන ප්‍රභවන් පෝෂණය උදෙසා සිය ගුවන් කාලය ආයෝජන කළා වූ ජාතික සන්නිවේදන ආයතනයයි. එය මහජන ආයතනයක් වන්නා සේම මහජනතාවගේ සංනිවේදන අවශ්‍යතා සපුරාලූ නිසාම ගුවන් විදුලිය යනු මහජන සේවා සන්නිවේදනයේ ප්‍රමුඛයා ලෙස හැඳින්වීම වඩාත් නිවැරදිය.

මෙරට සාහිත්‍ය සුපෝෂණය උදෙසා වෙසෙසි කාර්යභාරය ඉටු කළා වූ මහඇදුරු එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ උසස් සාහිත්‍ය කියැවීම මෙරට ශ්‍රාවක ප්‍රජාවට සන්නිවේදනය කිරීමට ද එදා මූලික වූයේ ලංකා ගුවන් විදුලියයි. රාජ තාන්ත්‍රිකයෙක්, ගුරු උතුමෙක්, ලේඛකයෙක්, නාට්‍යකරුවෙක්, සාහිත්‍යධරයෙක්, කවියෙක්, විචාරකයෙක් ආදී වශයෙන් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් කවර හැඳින්වීමකට පාත්‍ර වුව ද එතුමා කලාකරුවකු ලෙස ශ්‍රී ලාංකික රසකාමීන් අතරට ප්‍රථමයෙන් රැගෙන යන්නේ ලංකා ගුවන් විදුලියෙහි විකාශය වූ ගුවන් විදුලි නාට්‍යය බැවු සිහි කටයුතුය. මුදලාලිගේ පෙරළිය, කපුවා කපෝති, මනමේ, සිංහබාහු සිට ප්‍රේමතී ජායතී සෝකෝ දක්වා, පසු කලෙක ජනප්‍රිය මෙන්ම අනන්‍ය ශ්‍රී ලාංකික නාට්‍ය කලාවක් සුපෝෂණය කිරීමට දායක වූ මුල්ම ගුවන්විදුලි නාට්‍යය ලෙස නිර්මාණය වීම එයට උදාහරණ සපයයි.

කෙසේ වෙතත් සරච්චන්ද්‍රයන්ගේ මහා සාහිත්‍ය මෙහෙවර කවර පැතිකඩ ඔස්සේ විමර්ශනයන්ට, විග්‍රහයන්ට ලක් වුවත් එතුමාගේ ගුවන් විදුලි සන්නිවේදන මෙහෙවර ශාස්ත්‍රීය විමර්ශනයකට නිසි පරිදි ලක් වී නොමැත. එම හිඩැස පියවීමට ''රෙදෙව්සරෙහි සරාසඳ'' ඊ ජ්'නලය වැදගත් ප්‍රවේශයකි. ඊට මේ සටහන එකතු කරන්නේ ඉමහත් සතුටිනි.

**නලින් කුමාර නිශ්ශංක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**

**සංස්කාරක සටහන**

ආසියාවේ පුරෝගාමී ගුවන් විදුලියත් ලොව දෙවැනි ගුවන් විදුලියත් අන් කිසිවක් නොව එදා රේඩියෝ සිලෝනය වූ මෙදා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවයි. එහි ප්‍රගමනයට හා ප්‍රමිතියට දායක වූවෝ මෙතෙකැයි ප්‍රමාණ කළ නොහේ. ඒ අතර ජාතික ගුවන් විදුලිය ශාස්ත්‍රීය වශයෙන් උසස් ගුණාත්මක ආස්ථානයකට ඔසවා තැබූ එක් මහා විබුධයෙක් අමතක කළ නොහැකිය. හෙතෙම නමින් එදිරිවීර සරච්චන්ද්‍රයන්ය. ආචාර්ය මහාචාර්ය සම්මානිත මහාචාර්ය ඈ නෙක් පට මුලට ගෙන ඔහුව හැඳින්විය හැකි මුත් ගුවන් විදුලිය හා ඩොක්ටර් සරච්චන්ද්‍ර අතර තිබූ බැඳියාව විශද කරන්නට එවන් අමුතු නම් අවැසි නොවෙයි. එහෙත් ඒ සරාසඳ වෙනුවෙන් ජාතික ගුවන් විදුලියේ මැදිරියක් මෙතෙක් නොතිබිණ. ඒ අඩුව සම්පූර්ණ වන මොහොත ජාතික ගුවන් විදුලියට ඓතිහාසික අවස්ථාවකි. එම මොහොත තවත් එක් අවස්ථාවක් පමණක් නොවිය යුතු යැයි අපි කල්පනා කළෙමු. ඒ අනුව ජාතික ගුවන් විදුලියේ සරච්චන්ද්‍ර මැදිරිය නාමීකරණය කරන උලෙළට සමගාමීව සරච්චන්ද්‍රයන්ට ශාස්ත්‍රීය කර්තව්‍යයකින්ම හරසර පුදන්නට අපි තීරණය කෙළෙමු. මේ එහි ප්‍රතිඵලයයි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුවන් විදුලි විද්‍යුත් වෙළුම ලෙස **රෙදෙව්සරෙහි සරාසඳ** මෙසේ බිහි වන්නේ සරච්චන්ද්‍රයන්ගේ ගුවන් විදුලි මුද්‍රිකාව අනුස්මරණය කරමිනි. ඒ අනුව එදිරිවීර සරච්චන්ද්‍ර සුධීමතුන්ගේ අපරිමාණ නිර්මාණීකරණ ගුණකාය හා සබැඳි ශාස්ත්‍රීය ලිපි දහයකින් පමණ මෙම වෙළුම සමන්විත වෙයි. නමුත් මේ ආරම්භක පියවරක් පමණි. මෙම අනගි ලිපි සමුච්ඡය සමග සරච්චන්ද්‍ර ශාස්ත්‍රීය මෙහෙවර විමසන තවත් ලිපි කිහිපයක් සහිතව **රෙදෙව්සරෙහි සරාසඳ** මුද්‍රිත කලාපය අප මහැදුරුතුමන්ගේ ජන්ම දිනය යෙදෙන ජූනි මස එළිදැක්වීමටද අපි අපේක්ෂා කරමු.

අපගේ කෙටි දැනුම් දීමෙන් මෙම ඊ වෙළුමට ලිපි සම්පාදනය කළ සියලු ශාස්ත්‍රවන්තයන්ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්තුතිය මෙයින් පිරි නැමෙයි. ලිපිවල පද බෙදීමේ රීතිය හා ෆොනුරුව තෝරා ගැනීම ලේඛකයාගේ අභිමතය පරිදිය. මෙම කඩිනම් සංස්කරණයෙහි යම් දොසෙක් වේ නම් හා සංවර්ධනය විය යුතු තවත් යමක් වේ නම් සහ මේ ගැන ඔබේ යෝජනා චෝදනා අපට බොහෝ වැදගත්ය. එය මෙහි මුද්‍රිත කලාපය සාර්ථක හා ශක්තිමත් වන්නට හේතුවක්ම වන්නේය. එබැවින් ඔබේ නිරීක්ෂණ අප වෙත දන්වන මෙන්ද ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**සංස්කාරකවරු**

**මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර උපහාර ගීතය**

හන්තානට පායන සඳ සරා සඳයි

කොළොම්තොට පිං ඇති සඳ සරසවියයි

සොමි ගුණ සිහිලද පුන්සඳ එළියයි

රස විත නම් ලද සරා සඳ රමණීයයි

මනමේ කුමරුට සැම කල් ජීවය දුන්නා

කුමරිය මනමේ නිවැරැදි වූවා

ගල්ලෙන් බිඳ නව මං තැනුවා

සාහිත සේසත පෙරඹර සුදිලූවා

රෙදෙව්සරෙහි සරාසඳ රස විමනයි

ජන මන බබළන සකිසඳ සොමි ගුණයයි

සාහිත රස කල පුර සඳ සිත් පිනවයි

සරාසඳට පුද දෙන තුති මල් පෙරඹර සුදිලෙයි

**පද රචනය - ඉන්දික ජයරත්න**

**සංගීතය හා ගායනය - නාලක අංජන කුමාර**

එදිරිවීර සරච්චන්ද්‍රයන් අරබයා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිෂ්පාදිත ප්‍රථම උපහාර ගීතය මෙයයි

01

## සරච්චන්ද්‍ර නම් දාර්ශනිකයා සහ භාෂා දෙපාර්තමේන්තු

දර්ශන අශෝක කුමාර [1]

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර එසේත් නොමැති නම් හුදෙක් සරච්චන්ද්‍ර යැයි කී පමණින් සිංහල සමාජයේ නොහඳුනනා කෙනෙක් නොමැති තරම් යැයි කිව හැකිය. මෙවැනි භාග්‍යයක් ලැබූ අය තව වෙතොත් පරණවිතාන, අමරදේව වැනි කිහිප දෙනෙකු පමණකි. මහාචාර්ය සරච්චන්ද්‍ර බොහෝ දෙනෙකු දන්නේ නාට්‍යවේදියෙකු ලෙසයි. එසේත් නොමැති නම් සිංහල බස පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙසයි. තවත් ආකාරයකින් නවකතාකරුවෙකු, කවියෙකු, සමාජ විචාරකයෙකු වශයෙන්ද අයෙකු සරච්චන්ද්‍ර හඳුනා ගැනීමට ඉඩ ඇත.

එහෙත් දාර්ශනිකයෙකු වශයෙන් සරච්චන්ද්‍ර හඳුනා ගත් අය ඇත්නම් ඒ අතලොස්සකි. සරච්චන්ද්‍ර නමැති දාර්ශනිකයා සම්බන්ධයෙන් කතිකාවක් ඇති වී ඇත්නම් ඒ ඉතා අල්ප වශයෙනි. මෙම ලිපියෙහි අධ්‍යාශය වන්නේ සරච්චන්ද්‍ර නමැති දාර්ශනිකයා පිළිබඳ ඇගයීමටත් දෙවනුව මෙරට භාෂා දෙපාර්තමේන්තු සඳහා දාර්ශනිකයන් අවශ්‍ය වන්නේ ඇයිද යන්න පැහැදිලි කිරීමත්ය. මා සිතන තරමට සිංහල අධ්‍යයනය අංශයක සේවා කළ පළමු සහ අවසාන දාර්ශනිකයා මහාචාර්ය සරච්චන්ද්‍ර බවයි. මෙය අපගේ මානව ශාස්ත්‍ර අධ්‍යයනයන් සම්බන්ධයෙන් සමස්තයක් ලෙස සැලකූ විටත් සිංහල භාෂා අධ්‍යයනය සැලකූ විටත් මහා අභාග්‍යයකි. ලෝක තත්ත්වයන් පිළිබඳ සාවධාන වෙමින් සහ ලෝකයේ භාෂා දෙපාර්තමේන්තු හැසිරී ඇති ආකාරය සහ හැසිරෙමින් සිටින ආකාරය සම්න්ධයෙන් සාවධාන වීමෙන් භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුවකට දාර්ශනිකයන් සහ දර්ශනය විෂය වැදගත් වන්නේ කෙසේදැයි සොයා ගැනීමට හැකිය.

පොදුවේ ගත් කල ලොව භාෂා දෙපාර්තමේන්තු සුසැදෙන්නේ හුදෙක් ව්‍යාකරණඥයන්ගෙන් හෝ වාග්විද්‍යාඥයන්ගෙන් පමණක් නොවේ. දාර්ශනිකයන්, ඉතිහාසඥයන්, කලා විචාරකයන් ආදීහු භාෂා දෙපාර්තමේන්තුවලට ඇතුළත් වෙති. මෙරට ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුවල මෙම ප්‍රවණතාව සහ විවෘත වීම දැක ගැනීමට ලැබුණද සරච්චන්ද්‍රගෙන් පසු සිංහල භාෂා දෙපාර්තමේන්තුවක් එවැනි විවෘත වීමක් සිදු කළේ දැයි සැක සහිතය. ලෝකයේ භාෂා දෙපාර්තමේන්තු ගතහොත් ඒවායේ දාර්ශනිකයන් කෙරෙහි හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මහා දාර්ශනිකයෙකු වූ රෝලන්ඩ් බාර්ත් *Collège de France* හි ඉගැන්වූයේ සාහිත්‍යයයි. තවත් සුවිශාල ප්‍රසිද්ධියක් උසුලන අදටත් ජීවතුන් අතර සිටින දාර්ශනිකයෙකු වන හෝමි කේ. බාබා ඉගැන්වීම් සිදු කරන්නේ හාවඩ් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේයි. තවත් අතිවිශිෂ්ට දාර්ශනික කාන්තාවක් වන ජුඩිත් බට්ලර් ඉගැන්වීම් සිදු කරන්නේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ තුලනාත්මක සාහිත්‍ය දෙපාර්තමේන්තුවේයි. පශ්චාත් ව්‍යුහවාදයේ ප්‍රාරම්භක දාර්ශනිකයා වන ෂාක ඩෙරීඩා ඉගැන්වූයේද කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ තුලනාත්මක සාහිත්‍ය දෙපාර්තමේන්තුවේයි. මාක්ස්වාදී දාර්ශනිකයෙකු වන ටෙරී ඊගල්ටන් උගන්වන්නේ ලැන්කෙස්ටර් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේයි. නිර්ප්‍රභූත්වය, පශ්චාත් යටත් විජිතවාදය මෙන් ම ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් දාර්ශනික කාන්තාවක් වන ගයාත්‍රි ස්පිවැක් උගන්වන්නේද කොළොම්බියා විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේයි.

---

[1] බාහිර කථිකාචාර්ය,
බී.එස්.සී. (ජයවර්ධනපුර), එම්.ඒ. (කැලණිය), පී.එච්.ඩී. (පේරාදෙණිය) පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ජයවර්ධනපුර)

ලොව මහා දාර්ශනිකයන් සහ භාෂා හා සාහිත්‍ය දෙපාර්තමේන්තු අතර ඇති සුවිශාල සහ ඉසියුම් සම්බන්ධයෙන් සනාථ කළ හැකි තව බොහෝ උදාහරණ වේ. ලෝකයේ තත්ත්වය මෙසේ වුවත් ශ්‍රී ලංකාවේදී අපට දර්ශනය හැදෑරූ අයෙකු සිංහල භාෂා දෙපාර්තමේන්තුවක සේවය කළ බවට හෝඩුවාවක් ලබා ගන්නවා නම් ඒ එකම පුද්ගලයා මහාචාර්ය සරච්චන්ද්‍ර පමණකි.

ඒ හැරෙන්නට මහාචාර්ය සුචරිත ගම්ලත්, පියසීලි විජේගුණසිංහ වැනි අය තුළද මාක්ස්වාදී ප්‍රවණතා ඔස්සේ යම් දාර්ශනික අවදි වීම් පැවතියද ඒවා විධිමත් ගැඹුරු හැදෑරීමක් හා ශික්ෂණයක් ඇති ව සිදු වූ ඒවා බව පෙනී නොයයි. මහාචාර්ය සරච්චන්ද්‍ර ගැඹුරු ශික්ෂණයක් සහිත ව දර්ශනය විෂය හැදෑරූ අතර ජුඩිත් බට්ලර් හෝ ටෙරී ඊගල්ටන් මෙන් භාෂා දෙපාර්තමේන්තුවකට සිටි දාර්ශනිකයෙකු වශයෙන් පැහැදිලි ලෙසින් නාමීකරණය කිරීමට හැකි වේ.

මහාචාර්ය සරච්චන්ද්‍ර දර්ශනශූරී හෙවත් ආචාර්ය උපාධිය නැගෙනහිර දර්ශනය සම්බන්ධයෙන් ලබා ගන්නා අතරතුරදී ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළේ බටහිර දර්ශනය සම්බන්ධයෙනි. ආසියාතික දර්ශනයන් සම්බන්ධයෙන් ඒ වන විටත් ප්‍රාමාණික දැනුම් සහිත යතිවරුන් ඇතුළු විවිධ පන්නයේ බුද්ධිමතුන් සිටියද බටහිර දර්ශනය සම්බන්ධයෙන් මෙවැනි ප්‍රාමාණික අවබෝධයක් ලැබූ පුරෝගාමී චරිතයක් සිටියේ නම් සරච්චන්ද්‍රයන් පමණකි. මහාචාර්ය සරච්චන්ද්‍රගේ පෙර'පර දෙදිග දර්ශනයන් සම්බන්ධයෙන් පැවති පුළුල් අවබෝධය සපථ වන මූලික ලේඛන හතරක් හමු වෙයි. ඒවා නම්;

- භවාංග සහ සංජානනය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාව (*Bhavanga and Buddhist Psychology of Perception*)
- මනස පිළිබඳ යෝගාචාර න්‍යාය සහ සංජානනය පිළිබඳ අභිධර්ම මනෝවිද්‍යාව (*The Abidhamma Psychology of Perception and Yogacara Theory of Mind*)
- සංජානනය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාව (*Buddhist Psychology of Perception*)
- වසුබන්ධුගේ සිට ශාන්තරක්ෂිත දක්වා: බාහිර ලෝකය පිළිබඳ ඇතැම් බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විචාරාත්මක විභාගයක් (*From Vasubandhu to Santaraksita (A critical examination of some Buddhist teachings of the external world*)

මේ අතරින් වඩාත් වැදගත් ම කෘතිය වශයෙන් සැලකිය හැක්කේ මහාචාර්ය සරච්චන්ද්‍රගේ ආචාර්ය උපාධි නිබන්ධනය වන සංජානනය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාව මැයෙන් රචනා කරන ලද කෘතියයි. එහිලා මහාචාර්ය සරච්චන්ද්‍රයන් විසින් පෙර'පර දෙදිග දර්ශනයන් පිළිබඳ ඔහු තුළ ඇති පටුත්වය මනා කොට විශද කරයි. විවිධ නිකාය සංග්‍රහයන් තුළ සංජානනය නම් සංකල්පය ගොඩනැගෙන ආකාරය පිළිබඳ විග්‍රහයක නිරත වන සරච්චන්ද්‍ර එය විශ්ලේෂණය කිරීම සඳහා බටහිර දාර්ශනික සම්ප්‍රදායේ සංකල්ප වහල් කර ගනී. ඔහු එම කෘතියේ ආරම්භක සටහනේ දී ම පැහැදිලි කරන්නේ බටහිර දර්ශනය ඔස්සේ පුහුණුවක් ලද පාඨකයා අපේක්ෂා කරමින් මෙම විග්‍රහය සිදු කෙරෙන බවයි. මුල් බුදු දහමේ මෙන්ම පසු කාලීන ව මනස පිළිබඳ දර්ශනය ගොඩනැගෙන ආකාරයත් විශේෂයෙන් අභිධර්මය ඔස්සේ වඩාත් ක්‍රමානුකූල චින්තන පද්ධතියක් වශයෙන් මනස පිළිබඳ දර්ශනය බෞද්ධ සම්ප්‍රදායය ඔස්සේ වැඩෙන ආකාරයත් මෙම කෘතියේ දී සියුම් ලෙස විග්‍රහයට බඳුන් වෙයි.

සරච්චන්ද්‍රයන්ට ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දී ලැබෙන දාර්ශනික පුහුණුවත් සමගින් ඔහු මනස පිළිබඳ බෞද්ධ දර්ශනය විග්‍රහ කිරීමට උත්සාහ ගන්නේ ආනුභූතික ප්‍රවේශයක් ඔස්සේයි. මේ ඔස්සේ බෞද්ධ මනස පිළිබඳ දර්ශනය නූතන මනෝවිද්‍යාව සමඟින් සමපාත කිරීමේ උත්සාහයක් ඔහු තුළ පැවතිණ. එහෙත් සරච්චන්ද්‍ර දාර්ශනිකයෙකු වශයෙන් විශේෂිත වන්නේ ඔහුගේ විචාරාත්මක ගුණය නොනැසී පවත්වා ගැනීමට ඔහු දරන උත්සාහය නිසාය. අද වන විටද ආගමික සහ ජාතික ස්වරාගයන්ගෙන් යුක්තව සුද්දා කියන්නට කලින් අප ළඟ මේවා තිබුණා යැයි කරන ආදානග්‍රාහී මතවලට සරච්චන්ද්‍ර එළැඹියේ නැත. ඔහුගේ සංශයවාදය ඒ ආකාරයෙන් ම ඔහුගේ දර්ශනය තුළ පැවතිණ. මනස පිළිබඳ බෞද්ධ දර්ශනය

ඔහු සැලකුවේ ආගමික සන්දර්භයක් තුළ තබාය. එදා ඔහු කළ මේ ඉදිරිගාමී ව්‍යාපෘතිය 21 වන සියවසේදී පවා ඇතැම් චින්තකයන් තුළින් ගිලිහී ගොස් පටු ආදානග්‍රාහීත්වයන්ට සීමා වී ඇති ආකාරය දැක ගැනීමට ලැබේ. සරච්චන්ද්‍ර කිසිදු ආකාරයකින් ආගමික ග්‍රන්ථ ඔස්සේ පරිපූර්ණ දාර්ශනික චින්තනයක් අපේක්ෂා නොකළේය. ඔහු සියල්ල සංදර්භීකරණය කළේය.

පාලි සාහිත්‍ය සම්බන්ධයෙන් ඔහු කරන ගවේෂණයේදී මනස පිළිබඳ දර්ශනය අදාළ වස්තු විෂයන් ඉතා සියුම් ලෙසින් තෝරා බේරා ගන්නා ආකාරයද සුවිශේෂිතය. එසේම ඔහු තෝරා ගත් වස්තු විෂයයන් සමස්තයෙන් වෙන් කර අර්ථ නිරූපණය නොකළේය. කෙසේ වෙතත්, අප අද දකින අර්ථ නිරූපණවේදය (Hermeneutics), විසංයෝජනය වැනි දාර්ශනික ප්‍රවණතාවන් කෙරෙහි ඔහුට විවෘත වීමට ඉඩක් නොලැබිණ. 20 වැනි සියවසේ පසු භාගයේ දියුණු වූ දාර්ශනික ප්‍රවණතා ඔස්සේ සලකා බැලුවහොත් සරච්චන්ද්‍ර බෞද්ධ දර්ශනය කියැවීම සම්බන්ධයෙන් එළැඹුණු ආනුභූතිකවාදී ප්‍රවේශයය ගැටලු සහගතය. ඔහු ආනුභූතික ප්‍රවේශය ඔස්සේ යම් මුල් දෙයක් සෙවීමේ ව්‍යාපෘතියක නිරත විය. මෙම මුල් දෙය සෙවීම හැන්ස් ගඩමර් වැනි අර්ථ නිරූපණවේදීන් අතින් විශාල වශයෙන් ප්‍රශ්න කිරීමට ලක් වූවකි. ඉංග්‍රීසි ආනුභූතිකවාදය දෙස හැරෙන සරච්චන්ද්‍ර වැඩි වශයෙන් සරණ පතන්නේ ඩේවිඩ් හියුම් වැනි දාර්ශනිකයන්ගේය. හියුම් සහ පාලි බෞද්ධ සාහිත්‍ය අතර තුලනයක් දකින සරච්චන්ද්‍ර ඉංග්‍රීසි ආනුභූතිකවාදය ඔස්සේ බෞද්ධ මනස පිළිබඳ දර්ශනය තේරුම් ගැනීමට හැකි වෙතැයි සිතයි. මෙය 19 වැනි සියවසේ අගභාගයේත් 20 වැනි සියවසේ මුල් භාගයේත් විසූ දාර්ශනිකයන් තුළ තිබූ සුලබ ලක්ෂණයක් වන අතර සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් (Sarvepalli Radhakrishnan), ටී.වී.ආර්. මූර්ති මතු නොව වල්පොළ රාහුල ස්ථවිරයන් වැනි බුද්ධිමතුන්ගේද එවැනි ප්‍රවේශයක ලක්ෂණ දක්නට ලැබේ.

එහෙත්, අද වන විට බෞද්ධ අධ්‍යයනයේ සුසමාදර්ශ මාරුවක් සිදු වී ඇති අතර ආනුභූතිකවාදය ඔස්සේ බෞද්ධ සංකල්ප විග්‍රහ කිරීමේ බරපතල ගැටලු සමකාලීන විද්වතුන් හෙළිදරව් කර ඇත. කෙසේ වෙතත්, බෞද්ධ සංකල්ප ගොඩනැගීමේ දී පැවති කාලානුක්‍රමික තත්ත්වයන් සම්බන්ධයෙන් සැලකිලිමත් වන සරච්චන්ද්‍ර තමන්ගේ අර්ථ නිරූපණයන් මුළුමනින්ම නිවැරදි වේද යන්න සම්බන්ධයෙන්ද සංශයක් පළ කරයි. එම පිළිගැනීම තුළම ආනුභූතික ප්‍රවේශය ඔස්සේ මුල් අදහසක් කරා යොමු වීමේ ප්‍රශ්නය එක්තරා ආකාරයකින් ඔහු විසින්ම නගා ඇති බවක් හෝ ඒ ප්‍රශ්නය ඔහුට වද දුන් බවක් පෙනී යයි. එයින්ම සරච්චන්ද්‍රයන්ගේ දාර්ශනික විචාරශීලීත්වය මනා කොට විශද වේ.

20 වැනි සියවසේ මුල් භාගයේදී බටහිර ලෝකය බලවත් ලෙසින් නැගී ආ ආනුභූතික ප්‍රවේශය කරා බෞද්ධ දර්ශනය ඔසවා තැබිය හැකි බව සරච්චන්ද්‍ර සිතන්නේ වේදාන්ත දර්ශනයන් වෙතින් එය විශාල වශයෙන් වෙනස් වීම පාදක කර ගනිමිනි. *FROM VASUBANDHU TO SANTARAKSITA: A critical examination of some Buddhist theories of the external world.* නම් ලිපියේදී සරච්චන්ද්‍රයන් විසින් පෙන්වා දෙනු ලබන්නේ ශාන්තරක්ෂිත, කමලශීල ආදීන් වසුබන්ධුගේ *විඥප්තිමාත්‍රසිද්ධි* න්‍යායන් ඛණ්ඩනය කරමින් නූතන ප්‍රපංචවාදී දර්ශනයට සමාන දර්ශනයක් ගොඩනගන බවයි. ප්‍රපංචවාදය ඒ වන විට බටහිර දාර්ශනික ලෝකයේ හිස ඔසවමින් සිටි අතර වේදාන්ත දර්ශනයට වඩා එය බෞද්ධ දර්ශනයට ළඟ බව පෙන්වා දීම සරච්චන්ද්‍රගේ උත්සාහය විය. වසුබන්ධුගේ බෞද්ධ දර්ශනය පිළිබඳ විග්‍රහයක යෙදෙන සරච්චන්ද්‍ර පවසන්නේ බාහිර ලෝකය සම්බන්ධයෙන් යථාර්ථවාදී න්‍යායක් පිළිබඳ සද්භාවවේදී පදනම් සොයා බැලීම වසුබන්ධු සිදු කරන බවයි. එනම් බාහිර ලෝකය ක්ෂණභංගුර පරමාණුවලින් සෑදී ඇත යන පදනමකට වසුබන්ධු පැමිණෙන බව පෙන්වා දෙන සරච්චන්ද්‍ර මෙම පරමාණුක න්‍යාය සද්භාවවේදී මෙන් ම ජෝන් ලොක් පවසන ආකාරයේ ඥානමීමාංසාත්මකද විය හැකි බව කියා සිටී. එහෙත් අවසන් වශයෙන් වසුබන්ධුට අනුව බාහිර වස්තුව වශයෙන් පැවතිය හැක්කේ විඥානයයි. මෙය බර්ක්ලියානු අදහසකට සමාන වන බවට සරච්චන්ද්‍ර තර්ක කළේය.

ඉන්දීය බෞද්ධ දර්ශනය තුළ දී වසුබන්ධු ප්‍රතික්ෂේප කරමින් පසුකාලීන ව ධර්මකීර්ති, ශාන්තරක්ෂිත, කමලශීල ආදීන් ඉස්මතු වීම සරච්චන්ද්‍ර දකින්නේ හියුම් විසින් ලොක් ප්‍රතික්ෂේප කිරීමට සමාන ලෙසිනි. ශාන්තරක්ෂිත සහ කමලශීල විසින් බාහිර වස්තුව පමණක් නොව සංජානනය කරන ආත්මයද ප්‍රතික්ෂේප

කරනු ලැබිණ. ශාන්තරක්ෂිත සහ කමලශීලගේ ඉගැන්වීම තුළ ඇත්තේ විඥානයේ ගලායෑමක් (streams of consciousness) පමණක් යන්න හියුම් වෙත ශාන්තරක්ෂිත සහ කමලශීල ගෙන යෑමට සරච්චන්ද්‍ර දැරූ උත්සාහයක් බව පෙනී යයි. එහෙත් ශාන්තරක්ෂිත හියුම් මෙන් හේතුඵල සම්බන්ධය සම්පූර්ණයෙන් අත් නොහරී. ග්‍රාහකයද ග්‍රාහකයාද යන දෙක ම අත් හරින ශාන්තරක්ෂිත අවබෝධය පමණක් පවතින බව තීරණය කරයි. මෙය අපගේ තර්කයට අනුව නම් වඩාත් ළං වන්නේ කාටීසියානු තර්කනයටයි. අනුමානය භාවිත කරමින් භෞතික වස්තුවේ ස්වපැවැත්ම (independent existence of material object) සනාථ කරන ශාන්ත රක්ෂිත එය සංජානනය ඔස්සේ කළ හැක්කක් නොවන බව පෙන්වා දෙයි. ඩේකාට් දෙවියන් වහන්සේ විශ්වාස කිරීමත් සංජානනය සැක කිරීමත් සමඟින් මෙය වෙනස් නොවන බව අපගේ තර්කයයි.

ඩේකාට් වෙත පැමිණි ගැටලුවක් වූ සිහිනය සහ සැබෑ ලෝකය අතර වෙනස ගැන මතු වන ගැටලුව වසුබන්ධු සහ ශාන්තරක්ෂිත වෙතද පැමිණි අතර ශාන්තරක්ෂිත විසින් මෙහිදී දෙනු ලබන පිළිතුර වසුබන්ධුගේ පිළිතුරට වඩා ඩේකාට් වෙත ළඟා වන බව පෙනේ. සිහිනය සහ සැබෑව එකම තලයක තබා සාකච්ඡා කිරීමට වසුබන්ධු යොමු වන අතර ශාන්ත රක්ෂිත ඒවා වෙන් කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් යෝජනා කිරීම ඩේකාට් දෙවියන් තමන්ට වංචා නොකරන්නේය යන විශ්වාසයට පැමිණීමට සමාන වේ. හියුම්වාදී ආනුභූතික ප්‍රවේශයක් ගන්නා බැවින් ශාන්තරක්ෂිතගේ ප්‍රධාන ප්‍රකාශයක් වූ යමක් සංජානනය කර ගැනීමට අයෙකු නොමැතිවද වස්තුවක් පවතී (objects exist even when there is no one to perceive them) යන්න සරච්චන්ද්‍රට තේරුම් ගැනීමට නොහැකි වූ බව පෙනී යයි. මෙය තේරුම් ගැනීමට හැක්කේ කාටීසියානු ප්‍රවේශයක් ඔස්සේ ශාන්තරක්ෂිත කියවා ගැනීමෙන් බව අපගේ අදහසයි.

කෙසේ වෙතත්, දාර්ශනික ලෝකය ප්‍රභාවත් කළ මහා බුද්ධිමතෙකු වූ සරච්චන්ද්‍ර සිංහල භාෂා දෙපාර්තමේන්තුවට වී කළේ කුමක්ද යන්න නැවත සිතිය යුතුය. එය සිතිය යුත්තේ සිංහල භාෂා අධ්‍යයනයේ පාර්ශ්වයෙනි. සිංහල භාෂා අධ්‍යයනය හුදෙක් ව්‍යාකරණ සහ සාහිත්‍ය විචාර ඉගැනීම පමණක් නොව ලෝකය විග්‍රහ කිරීමේ දාර්ශනික ඥානය ලබා ගැනීමටද උපකාර වන්නක් බවට සරච්චන්ද්‍ර පූර්වාදර්ශයක් ලබාදී තිබේ. මෙය ලොව පුරා පිහිටි ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තු සනාථ කර ඇති අතර ඒවායේ විසූ සහ වසන දාර්ශනිකයන් අනුව පෙනී යන්නේ ලෝකය තේරුම් ගැනීම ඉංග්‍රීසි භාෂා අධ්‍යයනයේ විශාල කොටසක් බවයි.

ආශ්‍රිත මූලාශ්‍රය

King, R. (1994). Early Yogācāra and Its Relationship with the Madhyamaka School. *Philosophy East and West*, 44(4), 659–683.

Lindtner, C. (1997). “CITTAMĀTRA” IN INDIAN MAHĀYĀNA UNTIL KAMALAŚĪLA. Wiener Zeitschrift Für Die Kunde Südasiens / *Vienna Journal of South Asian Studies*, 41, 159–206.

Pathak, K. B. (1930). DHARMAKĪRTI’S TRILAKṢAṆAHETU: Attacked by Pātrakesari and defended by Śāntaraksita. Annals of the Bhandarkar Oriental Research Institute, 12(1), 71–80.

Radhakrishnan, S. (2019). *Indian philosophy*. Oxford: Oxford University Press

Sarachchandra, E. R. (1958). *Buddhist psychology of perception*. Colombo : Ceylon University Press

SARACHCHANDRA, E. R. (1976). FROM VASUBANDHU TO ŚĀNTARAKṢITA: A critical examination of some Buddhist theories of the external world. *Journal of Indian Philosophy, 4*(1/2), 69–107.

Wayman, A. (1996). A Defense of Yogācāra Buddhism. *Philosophy East and West*, 46(4), 447–476.

02

## ශාස්ත්‍රෝන්නතිය උදෙසා නැණ පහන් දැල්වූ කිසි දිනෙක බැස නොගිය සරාසඳ

**චන්ද්‍රිකා ජයකාන්ති මානගේ [2]**

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර වූ කලී අෂ්ටවංශ මාණික්‍යයක් බඳු අති විශිෂ්ට යුග පුරුෂයෙකි. ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි සකලවිධ ක්ෂේත්‍රයන්හි විසිර පවත්නා දැවැන්ත සෙවනැල්ලකි. නූතන ජාතික, සාමයික, සාහිත්‍යයික, සංස්කෘතික චින්තනයේ හැඩතල නිර්මාණයේ ලා සරච්චන්ද්‍රයන්ගෙන් ඉටු වූ මෙහෙය මිල කළ හැකි නොවේ. සරච්චන්ද්‍රයන් වනාහි සමකාලීන ශ්‍රී ලංකා ද්වීපය සාහිත්‍ය කලා ආලෝකයෙන් ප්‍රභාවත් කළ අසමසම නැණ පහනයි. දේශීය සාහිත්‍ය කලා ක්ෂේත්‍රයටත්, ඉන් ඔබ්බට ගිය සම්භාව්‍ය දේශීය නාට්‍ය කලාවක් බිහි කරලීමටත් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විද්වතාණන් විසින් හෙළි පෙහෙළි කරන ලද ගමන් මඟ ඊට ආදර්ශ බිහිකර දුන් අදාළ නිර්මාණ සමූහයේ ප්‍රතාපවත් බව, ජාතික නිදහස, දේශීය චින්තනය, අපගේ සංස්කෘතික උරුමයන්ගේ සිඳී බිඳී ගිය ඇතැම් දායාද වෙනුවෙන් එතුමා ගෙන ගිය සටන්කාමී ගමන් මඟෙහි අග්‍ර ඵලය ලෙස දේශීය නාට්‍ය කලාවේ හා සාහිත්‍ය කලාවේ ඇති කළ ප්‍රභාෂ්වරය වඩා ප්‍රබලව ඉස්මතු වීම එයට හේතු වන්නට ඇත. එසේ ගත් කළ මේ මහා පඬිවරයා නිල් අහස දෙසට අතු පතර විහිදාලූ මිහිමත පහළ වූ විසල් වනස්පතියන් වැන්නැයි කීම අතිශයෝක්තියක් නොවේ. එසේ වනුයේ බොහෝ දෙනෙකු නොදන්නා වුවද, සරච්චන්ද්‍ර සූරීන්ගේ කලා චින්තනයේ දැවැන්ත සෙවනැල්ල නාට්‍ය-විචාරය අභිබවා ඉන් බොහෝ ඈතට විහිදී ගොස් ඇති බැවිනි.

### මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ සාහිත්‍ය කලා සේවය

භාෂා ශාස්ත්‍ර ආදියෙහි හසල දැනුමින් පිරිපුන් එතුමා තම ශිෂ්‍ය සමූහයාට ශාස්ත්‍රාලෝකයත්, සාහිත්‍යාලෝකයත් පැතිර වූ යුග පුරුෂයෙකි. ව්‍යාකරණමය නිරවද්‍යතාව, පොත්පත්වල නිමාව, අලංකාර විභාග ආදියට සාහිත්‍ය විචාරය සීමා වී තිබුණු කලෙක, එතුමා වර්තමාන සාහිත්‍ය කලා විචාරය විධිමත් කිරීමට පදනම දැමූහ. සාහිත්‍යයෙහි ප්‍රථම කාර්යය නම් පාඨකයාගේ මනසට වින්දනයක් ලබාදීමත්, ඒ වින්දනය ලබාදීමට උචිත පද මාලාවක් සැකසීමත් මේ ක්ෂේත්‍රයෙහි එතුමා ලද අද්විතීය අර්ථ සිද්ධියයි. එමෙන්ම, සමකාලීන ප්‍රේක්ෂකයන් නාට්‍ය රසවින්දනයට පත් කරනු පිණිස නාට්‍යමය තාක්ෂණය සිංහල ගැමි නාට්‍යයෙන්ද ‘‘කබුකි’’ හෝ ‘‘නෝ’’නාට්‍යයන්ගෙන්ද උපුටාගෙන ඒ සියල්ල මතුකොට දක්වමින් නව සම්ප්‍රදායක් ගොඩ නැංවීමයි.

එතුමාගේ මනමේ, සිංහබාහු, පේමතෝ ජායතී සෝකෝ නාට්‍යවලින් රසික ජනතාව වෙත දායාද කළ මහඟු පරිඥානයද, ප්‍රේක්ෂකයාගේ ආධ්‍යාත්මික ලෝකය තුළ ඇති කළ ශික්ෂිතභාවය හේතුවෙන් පාඨකයාගේ ගුණනුවණ වැඩෙයි. සරච්චන්ද්‍රයන්ගේ ‘‘මනමේ’’ නාටකයට මේ වසරට 68 වසරකි. ‘‘සිංහබාහු’’ නාටකයට 63 වසරකි. මේ තරම් දිගු මඟක සිට මෙම නාට්‍ය රසවිඳින ප්‍රේක්ෂක ජනතාවගේ ප්‍රතිචාර අදටත් එකසේම නොනැසී පැවතීම මෙහි පෙනෙන පැහැදිලි ලක්ෂණයකි.

---

[2] හිටපු වාචික වැඩසටහන් පාලක
සිංහල ස්වදේශීය සේවය
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
බී.ඒ. (රුහුණ), එම්.ඒ. (කොළඹ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ජයවර්ධනපුර)

එක් දහස් නවසිය හතළිස් ගණන්වල පටන් සාහිත්‍ය අධ්‍යයනයට හා විචාරයට ඉදිරිපත් වූ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අවධානය යොමු වී ඇත්තේ භාරතීය, සංස්කෘත විචාර ග්‍රන්ථ කෙරෙහිය. එයින් පළමු කොටම "භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය" නම් ග්‍රන්ථය වෙත එතුමාගේ සිත ගෙනැවිත් තිබූ බව මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා පවසා ඇත. සරච්චන්ද්‍රයන් මුලින්ම සම්පාදනය කර ඇත්තේ "සිංහල නව කතාව" නම් විචාර ග්‍රන්ථයයි. ඒ 1951 වසරේදීය. 1949 වර්ෂයේදී ප්‍රථම වරට සම්පාදනය කළ "සාහිත්‍ය විද්‍යාව" නම් කෘතියේ නව සංස්කරණයක් 1965දී ඉදිරිපත් කර ඇත. 1958දී එතුමාගේ සුප්‍රකට සාහිත්‍ය විචාර අධ්‍යයන ග්‍රන්ථය ලෙස සැලකිය හැකි "කල්පනා ලෝකය" ප්‍රකාශයට පත්කර ඇත. එහිදී එතුමාගේ ප්‍රයත්නය වී ඇත්තේ මෙරටට ගැළපෙන ස්වාධීන, දේශීය නාට්‍ය සම්ප්‍රදායක් නිර්මාණය කිරීමය. මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සාහිත්‍ය කලා ජීවිතයේ අග්‍ර ඵලය ලෙස සදාකල් සනිටුහන් කෙරෙන්නේත්, පවතින්නේත් නාට්‍ය කලාවට ලබාදුන් දායකත්වයයි. එම ප්‍රයත්නයේ අග්‍ර ඵලය නම් "මනමේ" නාටකයයි.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ කවීත්වය සිංහල රසිකයෝ මැනවින් හඳුනති. ගුණදාස අමරසේකර මහතා පවසන පරිදි තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගෙන් පසු සිංහලයේ පහළ වූ විශිෂ්ටතම කවියා සරච්චන්ද්‍රයන්ය. ඔහුගේ නාට්‍ය නිර්මාණවල තැනින් තැන විසිරී ඇති එම කවීත්වය සහ කාව්‍යෝක්තීන් පිටුපස ඇති ගැඹුරු ජීවන දර්ශනය නිසා වඩාත් ඔප් නැංවෙමින් අප අතර නොනැසී පවතී. එසේම, එතුමා ලියූ "මළගිය ඇත්තෝ" හා "මළවුන්ගේ අවුරුදු දා" නව කතාවල සරල ශෛලියක් දැකීමට පුලුවන. ස්ව-කාව්‍යමය භාෂා රටාවකින් ලියා ඇත. සාහිත්‍ය සංග්‍රහයෙන් සාහිත්‍ය හා විචාර පිළිබඳව දේශන මාලාවක් පැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස එතුමාට ශ්‍රී ලංකා ගුවන් විදුලියෙන් විශේෂ සහායක් ලැබුණු බව මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා පවසා තිබේ. ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකුත්, නව කතා රැසකුත් කෙටි කතා, නාට්‍ය සහ ගුවන් විදුලි නාට්‍ය පරිවර්තන කෘති සහ තවත් බොහෝ නිර්මාණ රැසක් ඔහු විසින් ඉදිරිපත් කර ඇත.

**මහාචාර්ය සරච්චන්ද්‍ර සහ ගුවන් විදුලි වැඩසටහන්**

මහාචාර්ය සරච්චන්ද්‍ර අවශේෂ කලා ක්ෂේත්‍රයන් අරභයා සේම ලංකා ගුවන් විදුලි සේවයේ ප්‍රගමනයට ඉටුකළ මහාර්ඝ වූද, උදාර වූද මෙහෙවර අපට කිසිසේත්ම අමතක කළ නොහැකිය. මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගුවන් විදුලිය හා පැවති සබඳතාව පිළිබඳව වරෙක මහාචාර්ය තිස්ස කාරියවසම් මෙසේ සඳහන් කර තිබේ. "ලංකාවේ ගැමි ශාන්ති කර්ම, තොවිල්, කංකාරි, ජන ගී වැනි දේ එක්රැස් කිරීමේ ව්‍යාපෘතියක් ලංකා ජනශ්‍රැති සංගමය නමින් පිහිටුවා එම සංගමයේ කටයුතු කිරීම". ඇත්ත වශයෙන්ම කවුරුවත් කතා නොකළ, හැම දෙනාම පාහේ අනුමත කළ වැදගත් කරුණක් තිබෙනවා. එනම්, ශ්‍රී ලංකා ගුවන් විදුලිය පමණයි ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ගැමි සංගීතය, ජන සංගීතය පිළිබඳ පර්යේෂණයක් කළේ. ඒ ලංකා ගුවන් විදුලිය මඟින් කරන ලද අති විශිෂ්ට සේවාවක් ලෙස සැලකිය හැකියි.

එකල ගුවන්විදුලි මාධ්‍ය තුළ නාට්‍ය කියා දෙයක් තිබී ඇතැයි මහාචාර්ය කාරියවසම් මහතා පවසා ඇත. "ගුවන් විදුලි නාට්‍ය" යනුවෙන් යමක් ඇති කළ යුතුය යන සංකල්පය බිහිවන්නේ සරච්චන්ද්‍රයන් වෙතිනි. එතුමා වේදිකාවට නාට්‍ය හඳුන්වාදීමට ප්‍රථම ගුවන් විදුලියේ නාට්‍ය රචනා කර ඇත. "නොරත රත" එවැනි ගුවන් විදුලි නාට්‍යයකි. ගුවන්විදුලි මාධ්‍ය තුළින් ශ්‍රව්‍ය කාව්‍ය හෙවත් ගුවන් විදුලි නාට්‍ය වැනි දෙයක් කළ හැකි බව ඔප්පු කිරීමට සරච්චන්ද්‍රයන්ට හැකි විය.

එමෙන්ම, "යෞවන සමාජය" වැඩසටහනින් එතුමා නව පරපුරක් හඳුන්වා දුනි. පී. වැලිකල, ලොයිඩ් වාකිස්ට, චන්ද්‍රා වාකිස්ට, ජේ.එච්. ජයවර්ධන, වොලී නානායක්කාර වැනි ශිල්පීන් සරච්චන්ද්‍රගේ ගුවන් විදුලි නාට්‍යවල චරිත නිරූපණය කළේ දැඩි කැමැත්තකින් බවත්, සුගතපාල ද සිල්වා වැනි අයත් ගුවන් විදුලි නාට්‍යයේ පෝෂණයට ඉමහත් දායකත්වයක් සපයා ඇති බවත් සඳහන් වේ.

**ශාස්ත්‍රීය වැඩසටහන් ආරම්භය**

1951 ජුනි මස 25 වනදා ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන ගුවන් විදුලියේ ආරම්භ කෙරිණ. පළමුව, ඉරු දිනවල රාත්‍රියේ ඇරමුණු ශාස්ත්‍රීය සංග්‍රහය, විශ්ව සාහිත්‍ය, කලා, විද්‍යා, ශාස්ත්‍රීය සංගීතය වෙනුවෙන් කැපවුණි. 1952 ජනවාරි 31 වැනිදා ද්විතීය සංග්‍රහයත් ආරම්භ කෙරිණ. යෞවන සමාජය ඇරඹුණේ 1950 අගෝස්තු මසදීය. ශාස්ත්‍රීය ගායන, වාදන, නාට්‍ය, කතා හා සාකච්ඡා මෙහි ප්‍රධාන විශේෂාංග විය. කලා හා රසවින්දනාත්මක තොරතුරු, විවේචන, විමර්ශන, හා විග්‍රහයන්ද මෙහි ප්‍රධාන විය.

මහාචාර්ය සරච්චන්ද්‍ර ලංකා ගුවන්විදුලියේ ශාස්ත්‍රීය සංග්‍රහය නම් විශේෂාංගය නිර්මාණය කර ඇත්තේ පියසේන නිශ්ශංක මහතා සිළුමිණ පුවත්පතට හඳුන්වා දුන් සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකය පූර්වාදර්ශයට ගෙන බව ඔහු මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සමග කළ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇති බව 2000 අප්‍රේල් 17 සිළුමිණ පුවත්පතට සැත්තෑවිය පිරීම නිමිත්තෙන් පළ කළ විශේෂ අතිරේකයේ සඳහන් වී තිබේ.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන් පිළිබඳව මහාචාර්ය තිස්ස කාරියවසම් ලිපියක් ලියමින් මෙසේ අදහස් දක්වා ඇත.

"ඔහු ශාස්ත්‍රීය සංග්‍රහය යටතේ පැවති සාකච්ඡාවලට යද්දී ඊට සහභාගී විය යුතු අය සහ සාකච්ඡා කළ යුතු කාරණා ගැන කලින් සම්පත්දායකයන්ට දන්වනවා. අදාළ කරුණු සටහන් කරගෙන ආ යුතු බවයි ඉන් අදහස් කළේ. ඉන් පිටස්තර වල්පල් කිසිවක් සාකච්ඡාවේදී සිදු නොවීමට එතුමා වග බලා ගත්තා. ඒ යුගයේ ගුවන් විදුලියේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහනට උගතුන්ගේ හා බුද්ධිමතුන්ගේත්, ශාස්ත්‍රාභිලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේත් ආකර්ෂණයක් ගොඩගැනී තිබුණේ මේ නිසයි. එතුමාගේ ශාස්ත්‍රීය සාකච්ඡා තුළ අනවශ්‍ය විහිළු තහළු අඩංගු වුණේ නැහැ. ඒවා ඉතා ගැඹුරු ශාස්ත්‍රීය සාකච්ඡා බවට පත්වුණේ ඒ නිසයි".

ග්‍රන්ථ විමර්ශන, නාට්‍ය හා සිනමාව පිළිබඳ විචාර වැඩසටහන් ඇතැම් සාහිත්‍ය සහ ශාස්ත්‍රීය කතා විනාඩි 30 ක ගුවන් කාලයක් එකම දේශකයෙකු, දේශනා විලාසයෙන් ඉදිරිපත් කර ඇත. එවන් සාහිත්‍ය කතා එකතුවක් පසු කලෙක මහාචාර්ය සරච්චන්ද්‍ර "සාහිත්‍ය විද්‍යාව" නමින් මුද්‍රණය කර තිබේ. එසේම, කෙටි කතා, නාට්‍යානුසාරයෙන් ශාස්ත්‍රීය සංග්‍රහයෙන් ඉදිරිපත් කර ඇත. විශ්ව සාහිත්‍යයට, නව සොයාගැනීම් ආදියද ඇතුළත් විය. විශ්ව සම්භාව්‍ය නිර්මාණ හඳුනාගැනීම හා ඊට සාපේක්ෂව රසිකත්වය වැඩි දියුණු වූ බව පෙනෙන්නේ දේශීය ගුවන්විදුලි නාට්‍ය නිර්මාණකරුවන් රැසක් ඒ කාලය තුළ බිහිවීමෙනි. ඒ.පී. ගුණරත්න, පී. වැලිකල, ජේ.එච්. ජයවර්ධන, පී. දේවසිරි පෙරේරා, සෝමපාල ගුණධීර, ධර්ම ශ්‍රී මුණසිංහ, ආනන්ද සිරිසේන ආදීන් ඒ අතර කිහිපදෙනෙකි. සරච්චන්ද්‍රයන් ප්‍රමුඛ විද්වතුන් රැසකගේ සහභාගීත්වය නිසා ශාස්ත්‍රීය සංග්‍රහයේ වැඩසටහන් ඉහළ මට්ටමක පැවතුණි.

**ශාස්ත්‍රීය සංග්‍රහය ප්‍රචාරය, ආරම්භක අවදියේ එම වැඩසටහන ඇසුරු කළ විද්වතුන්ගේ අදහස්**

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකි. එතුමා කැලණිය විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශය ගොඩනැඟීමේ ලා පුරෝගාමී වූ කෙනෙකි. එසේම, ගුවන් විදුලියේ කලක් සේවය කර බී.බී.සී. ලෝක සේවයේ සුප්‍රසිද්ධ ගුවන්විදුලි වැඩසටහනක් වූ "සංදේශය" වැඩසටහනේ නිෂ්පාදන කාර්යභාරය ඉටුකළ විද්වතෙකි. ඒ දැනුම ලාංකීය ජනමාධ්‍ය හදාරන විද්‍යාර්ථීන්ට අඩු නැතිව බෙදා දුන් ආචාර්යවරයෙකි. එතුමා තවමත් ශාස්ත්‍රීය සංග්‍රහය වැනි වැඩසටහන්වලට තම දායකත්වය ලබාදෙයි.

මහාචාර්ය සරච්චන්ද්‍ර ශාස්ත්‍රීය සංග්‍රහය භාරව ක්‍රියා කළ අවදියේ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රට එතුමා සමග වැඩ කටයුතු කිරීමට වාසනාව හිමි විණි. හදිසි අවස්ථාවක ශාස්ත්‍රීය සංග්‍රහය නිෂ්පාදකට වෙනත්

කටයුත්තක නිරතවීමට සිදු වූ නිසා මහාචාර්ය සරච්චන්ද්‍ර ඉදිරිපත් කළ "කල්පනා" වැඩසටහනේ නිෂ්පාදන කාර්යභාරය එතුමාට පැවරී ඇත. එම තොරතුරු මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් ගුවන් විදුලි "හඬ" සඟරාවට මෙසේ එක්කර තිබිණි.

"හිතවත් නිෂ්පාදකවරයෙකු වූ බැවින් මම වැලිකලගේ නිෂ්පාදනයක් වූ "කල්පනා" වැඩසටහන භාර ගත්තෙමි. කල්පනා වැඩසටහන දෙසතියකට වතාවක් ශාස්ත්‍රීය සංග්‍රහය යටතේ ප්‍රචාරය වූ සංගෘහිත වැඩසටහනක් වූ බැවින්, ඒ සඳහා පූර්ණ සූදානමක් ඇතිව කටයුතු කිරීම නිෂ්පාදකවරයාගේ වගකීම විය. වැඩසටහනට ඇතුළත් වන උපාංග සහ සහභාගී වන ශිල්පීන් පිළිබඳ තොරතුරු සපයා ගැනීම නිෂ්පාදකවරයා සහ වැඩසටහන් සැලසුම්කරුවා අතර ඇතිවන හැඳිනීම මත සිදුවන්නකි. මහාචාර්ය සරච්චන්ද්‍ර තම වැඩසටහනට බොහෝ විට සහාය කරගන්නේ කලා ශිල්පීන්ය. මෙදින සහභාගී වූයේ දැනට ජීවතුන් අතර නැති සංගීතඥයන් දෙදෙනෙකි. ඔවුන් නම්. එච්.එච්. බණ්ඩාර සහ මහාචාර්ය හේමපාල විජයවර්ධන යන දෙදෙනාය. බණ්ඩාර විසින් සිංහබාහු නාටකයේ සංගීතය නිර්මාණය කරන ලද බවත්, විජයවර්ධන ඊට වාදනයෙන් සහභාගී වී ඇති බවත් දැනගන්නට ලැබිණ. වෙලාවටත් කලින් මහාචාර්ය සරච්චන්ද්‍ර ගුවන්විදුලි කාර්යාලයට පැමිණ සිටියේය. මද වේලාවකට පසු, අනිත් ශිල්පීන් දෙදෙනාද පැමිණියහ. ඔවුන්ගේ පූර්ව සූදානම පැයක පමණ කාලයක් මුළුල්ලේ පැවතිණ. ඉන්පසු සිදුවන්නේ අවශ්‍ය තැටි පටි ආදිය අන්තර්ගත කොට මුළු වැඩසටහනම ප්‍රචාරය සමඟ එම "කල්පනා" වැඩසටහන නිෂ්පාදනය කිරීමේ කාර්යය මටම පැවරිණ. මා ඒ කාර්යය ඇල්මකින් යුතුව ඉටු කළේ සරච්චන්ද්‍ර ඇසුර සමීපව ලැබීමෙන් මා හට කිසියම් ඥාන පෝෂණයක් ලැබෙතැයි යන ඇදහීමෙනි. අපි ගුවන් විදුලිය සම්බන්ධව හා වෙනත් කලාකාරයන් සම්බන්ධව බොහෝ දේ කථා බහ කළෙමු. "කල්පනා" වැඩසටහන් මාලාව සැලසුම් කිරීමට මත්තෙන් එක්තරා අවස්ථාවකදී මට ගුවන් විදුලි පරිශ්‍රයේදී මහාචාර්ය සරච්චන්ද්‍ර මුණගැසීමට හැකිවිය. දැනට රංග භූමියට සැකසී ඇති "පේමතෝ ජායතී සෝකෝ" නමැති නාට්‍යය ගුවන්විදුලි නාට්‍යයක් වශයෙන් ප්‍රථම වතාවට සැකසුණේ 1960 මුල් කාලයේදීමය. ඉන් පසු එම පෙළ සංස්කෘතික සඟරාවේ පළ විය. "පේමතෝ" ගුවන්විදුලි නාටකය පුහුණු කරන අයුරු මම බලා සිටියෙමි. එය අතිශයින් ජනප්‍රිය වූ නාටකයක් දැයි මම නොදනිමි. එහෙත්, එය පැයක පමණ කාලයක් මුලුල්ලේ ප්‍රචාරය කිරීමට සුදුසු වන පරිදි සකසන ලද ගුවන් විදුලි නාටකයක් විය.

එකල ශාස්ත්‍රීය සංග්‍රහය සැලසුම් කිරීමේ සමස්ත කාර්යභාරය පැවරී තිබුණේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිෂ්පාදකවරයෙක් වූ එච්.එම්. ගුණසේකර මහතාටය. මේ සඳහා මූලික සාකච්ඡාව පවත්වනු ලැබුවේ මහාචාර්ය සරච්චන්ද්‍ර සමඟය. විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් හා මහාචාර්යවරුන් සහාය කරගනු ලැබූ ශාස්ත්‍රීය සංග්‍රහයට අන්තර්ගත වූයේ වඩාත් ශාස්ත්‍රීය, සංස්කෘතික, විද්‍යාත්මක හා අධ්‍යාපනික වටිනාකමකින් යුක්ත වූ වැඩසටහන්ය. උගතෙකු විසින් පවත්වන ලද පර්යේෂණයන් වෙතොත්, ඒ පර්යේෂණයට ඇතුළත් වූ දෙයින් පලක් ගැනීමට ශාස්ත්‍රීය සංග්‍රහය ඉලක්ක කරගත්තේය. මේ වැඩසටහන් වෙනත් අය ලවා ඉටුකර ගැනීම මෙන්ම, තමන්ද පැමිණ ඉටු කිරීමට වගබලා ගැනීම මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ කාර්යය විය. ඒ අනුව, මහාචාර්ය සරච්චන්ද්‍ර සතිපතා විනාඩි 15 ක පමණ කාලයකට ගැළපෙන පරිදි "රඟ සොබා" නමින් කථා පෙළක් පැවැත්වීය. ප්‍රථම වතාවට තමන් විසින් පවත්වන ලද ස්වදේශික රංග කලා පර්යේෂණ තොරතුරු ඉතා වැදගත් ලෙස අනාවරණය වූයේ රඟ සොබා කතා පෙළ ඔස්සේය. ඒ කථාවලින් කිහිපයක් එකළ පළ වූ "තරංගණී" සඟරාවේ පිටු අතරට ගිය බව මට මතකය. රත්තරන්, සත්ත්ව කරුණාව යන නාට්‍ය ද්වයම ප්‍රථම වරට ගුවන් විදුලිය සඳහා නිෂ්පාදනය වූ ඒවාය. එම නාට්‍ය ද්වයම පසු කාලයේ කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ගලප්පත්ති විසින් කරළියට සකසන ලදී. ගුවන් විදුලියට නිර්මාණය කරන ලද බොහෝ නාට්‍ය කෘති ඒකාංගික නාට්‍ය වශයෙන් පසු කල රංග භූමියට ගැනීමද එක් සන්නිවේදන සම්ප්‍රදායක් බවට පත් විය.

ගුවන් විදුලි මාධ්‍ය මඟින් අපූරු රංග කාව්‍යයක් කළ හැකි බව විධිමත් ලෙස දෙන ලද්දේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසිනි. ඒ සඳහා සම්භාව්‍ය ගණයේ එතෙර මෙතෙර නාට්‍ය කෘතීන් ගවේෂණය

කිරීමේ සම්ප්‍රදායක්ද බිහිවිය. ඉබ්සන්, ගොගොල්, චෙකොෆ්, මොලියර්, බර්නාඩ් ෂෝ වැනි නාට්‍යකරුවන්ගේ කෘතීන් මෙන්ම, ප්‍රාචීනවාදී සංස්කෘත නාට්‍ය ශ්‍රාවකයාට හඳුන්වාදීමේ සම්ප්‍රදායට අඩිතාලම වැටිණි. මෙහි පරිසමාප්ත අවස්ථාව ලෙස සැලකිය හැක්කේ "විශ්ව සාහිත්‍යයෙන්" යනුවෙන් භාවිතයට පැමිණි ගුවන් විදුලි නාට්‍ය කලාව හඳුන්වා දීමයි. එහි පුරෝගාමියා වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් බව අමතක නොකළ යුතුය."

කෙමෙන් "රේඩියෝ සිලෝන්" ගුවන් විදුලි සේවය අයාලේ යමින් පැවති සමයකදී, එහි විදේශීය මුහුණුවර වෙනස් කරමින් ස්වදේශීය මුද්‍රාව තැබීමට පුරෝගාමී වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයි. ඒ සඳහා ඔහු මුලින්ම කළේ ස්වදේශික වශයෙන් විසිර පැතිර පවත්නා සංස්කෘතිකාංග ශ්‍රව්‍ය මාධ්‍යයක් වන ගුවන් විදුලිය මඟින් ජනගත කිරීමට සැලසුම් කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 50 දශකයේ මුල් භාගයේ සිටම ජන ගායනා ප්‍රභේද රැසක් දැකගත හැකි විය. වන්නම්, විරිඳු, ජන කවි, ජන ගීත බිහි විය. අතුරුඵල ලෙස සැලකෙන්නේ ගීත නාටක උපතයි. ස්වදේශික මුද්‍රාවක් ගුවන් විදුලියට අවශ්‍ය බව තවදුරටත් සනාථ කරනු සඳහා වැඩසටහන් ගුවන් කාලවලද වෙනසක් ඇති විය. සංගීත ඒකකය, ළමා හා කාන්තා ඒකකය, ග්‍රාමීය හා කෘෂි ඒකකය ඉන් ප්‍රධානය. සංගීත අංශයේ පී. ඩන්ස්ටන් ද සිල්වා සහ මඩවල එස්. රත්නායක එක් පැත්තකින් මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ දැක්ම ක්‍රියාත්මක කළහ. තවත් පැත්තකින්, පී. වැලිකල යට කී පරිදි ඒ දැක්ම ගුවන් විදුලි නාට්‍ය හා විචිත්‍රාංග ඔස්සේ ක්‍රියාත්මක කළේ එච්.එම්. ගුණසේකර, තිලක සුධර්මන් ද සිල්වා වැනි නිෂ්පාදකවරුන්ය. මෙය සරච්චන්ද්‍ර දැක්ම ගුවන් විදුලි සේවයට විහිදූ පුරෝගාමී රැස් වළල්ලක් විය. මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ගුවන් විදුලි මෙහෙවර ඇරඹුණේ "යෞවන සන්ධ්‍යාව" නමින් හැඳින්වූ වැඩසටහන් මාලාවකිනි. එකී ඇතැම් වැඩසටහන්වලට කන්දීමේ අවස්ථාව පනස් ගණන්වල මුල් භාගයේදී පාසල් සිසුන් වූ අපටද ලැබිණි. කෙමෙන් "යෞවන සන්ධ්‍යාව"නම වෙනස් වී "යෞවන සමාජය" බවට පත්විය. එක් අවස්ථාවකදී මේ වැඩසටහන් ආරම්භක මහාචාර්ය සරච්චන්ද්‍ර පැමිණිලි කළේ හැකිතාක් දුරට කලා ශිල්ප හා කලාකරුවන් පිළිබඳ ප්‍රවණතාවන් හැඳින්වීමට දරන ලද වෑයමක් වශයෙනි. එහෙත්, කලින් කළ සරච්චන්ද්‍ර මුද්‍රාව යෞවන සමාජය තුළින් වෙනස් වන්නට පටන් ගත්තේය. අන්තිමට එහි ඉතිරි වුණේ "යෞවන සමාජය" යන නම පමණකි. ගුවන් විදුලි සංගීත අංශයට පණ්ඩිත් අමරදේවයන් හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේද සරච්චන්ද්‍රයන්ටය. එහි ක්‍රමික පරිසමාප්තිය සනිටුහන් වූයේ ගීත නාටක, ගී රස වින්දන, විජය ගීත, මධුවන්ති ගී, අම දහරා වැනි සංගීත වැඩසටහන් ඔස්සේය. ලිඛිත මාධ්‍යයේ දැවැන්ත අංශය වූ පුවත්පතට කළ නොහැකි වූ තරමේ බලපෑමක් ශ්‍රාවක ජනතාවට ප්‍රබල ශ්‍රව්‍ය මාධ්‍ය ලෙස ගුවන් විදුලියෙන් කළ හැකි බව පසක් කරගත් කෙනෙකු ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර කළ සේවය අගය කළ හැකිය.

තිලකරත්න කුරුවිට බණ්ඩාර මහතා සරච්චන්ද්‍ර ගැන දක්වන්නේ "මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මෙරට විදග්ධ සංස්කෘතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෙනී සිටි බුද්ධිමතෙකි. ප්‍රබුද්ධ ප්‍රවාහයේ සති අන්ත පුවත්පත ලෙස එදා "ශත දහයේ විශ්වවිද්‍යාලය" විරුදාවලිය "සිළුමිණ" ට පිරිනැමුණේ ඓතිහාසික හා ශාස්ත්‍රීය අතිරේකය නිසාය. ශ්‍රී ලංකාවට අලුතින් ලැබුණු ගුවන් විදුලි සේවයේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන බිහිකළේ ප්‍රබුද්ධ ශ්‍රාවක ප්‍රජාවගේ අභිවෘද්ධියට ගුවන්විදුලය වාහකයක් කරගනු පිණිසය." යනුවෙනි. තවදුරටත් ඔහු මෙසේ දක්වයි.

"දෙස් විදෙස් ඉතිහාසය, පුරා විද්‍යාව, අභිලේඛන, නව කතාව, කෙටි කතාව පෙරපර දෙදිග දෘශ්‍ය කාව්‍ය, සිනමාව, විචාරය, රසාස්වාදය වැනි විෂයයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම සහ ඔවුන් උසස් රසවින්දනයකට හුරු කිරීම ශාස්ත්‍රීය සංග්‍රහයේ අරමුණ විය. සිළුමිණ ශාස්ත්‍රීය සංග්‍රහයට දායක වී සිටි උගතුන් බුද්ධිමතුන් ගුවන් විදුලියේ ශාස්ත්‍රීය සංග්‍රහයට දායක කරගැනීමට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර කටයුතු කළේය. මෙමගින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ව්‍යායාමය වූයේ ලංකා ගුවන් විදුලිය හරහා සමාජයේ විදග්ධ සංස්කෘතික ප්‍රවාහය ශක්තිමත් කිරීමය."

සිංහල සාහිත්‍ය ප්‍රබෝධයේ පුරෝගාමියා එදිරිවීර සරච්චන්ද්‍ර බව ප්‍රවීණ සාහිත්‍යධර කරුණාරත්න අමරසිංහ මහතා පෙන්වා දෙයි. දේශීය සාහිත්‍යයේ සමාජ සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කළ ප්‍රමුඛ සාහිත්‍යධරයා වන්නේද එදිරිවීර සරච්චන්ද්‍රයන්ය. උසස් සාහිත්‍ය නිර්මාණයක් බිහිවීමට සමාජය නම්වූ සන්දර්භය වස්තු විෂය වේ. සාහිත්‍යකරුවා යනු සමාජ නියෝජනයකි. සමාජය සහ සාහිත්‍යය අතර වන්නේ වෙන් කළ නොහැකි සබඳතාවකි. නූතන සාහිත්‍ය කියවීමට සහ එහි රසඥතාව අවබෝධ කර ගැනීමට විද්‍යාත්මක මාර්ගය පෙන්වාදීමට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පුරෝගාමී වූවේය. ඒ සඳහා ඔහු 1949දී සාහිත්‍ය විද්‍යාව නමින් ශාස්ත්‍රීය පර්යේෂණ ග්‍රන්ථයක් ලියා පළකරන ලදී. නූතන සාහිත්‍ය කියවීමේ විද්‍යාත්මක මාර්ගය පෙන්වා දුන් ශාස්ත්‍රඥයා වනාහි මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයි. ඔහු සිංහල නවකතාව ඉතිහාසය නමින් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් 1951දී පළ කළේය. එය, සිංහල නවකතාව පිළිබඳ විචාර රීතිය සමාජගත කළ පළමු ශාස්ත්‍රීය ලේඛනයයි. එදිරිවීර සරච්චන්ද්‍ර පිළිබඳව කෙතරම් අධ්‍යයන, පර්යේෂණ, විශ්ලේෂණ හා විචාර සිදු වී ඇතත්, ඔහුගේ ගුවන් විදුලි මෙහෙවර පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයක් හෝ විමර්ශනයක් සිදුවී නොමැති බව කරුණාරත්න අමරසිංහ මහතා දරන අදහසයි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ලේඛනගත සාහිත්‍ය මෙහෙවර හා සමානවම ගුවන් විදුලි මාධ්‍ය තුළ ඔහු නූතන සිංහල සාහිත්‍යයේ පුනරුදය උදෙසා වෙසෙසි කාර්යභාරයක් ඉටුකර ඇත. නමුත්, සරච්චන්ද්‍රයන්ගේ ගුවන් විදුලි මෙහෙවර ප්‍රමාණවත් පරිදි අධ්‍යයනයට හා පර්යේෂණයට ලක් නොවීම කනගාටුවට කාරණයකි. ගුවන් විදුලියේ යෞවන සමාජය, ශාස්ත්‍රීය සංග්‍රහය, ද්විතීය සංග්‍රහය, ගීත නාටක, ගී රස වින්දන, විශ්ව සාහිත්‍ය වැනි වැඩසටහන් ආකෘති ගුවන් විදුලියට හඳුන්වා දීමේ පුරෝගාමියා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයි. එවක පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔහු ඉදිරිපත් කළ උසස් සාහිත්‍ය නිර්මාණ තමන්ට රසවිඳීමට හැකි වූ බව අමරසිංහ මහතා පවසයි. සාහිත්‍යකරණය සඳහා තමන්ට පෙළඹවීමක් ඇති කිරීමට සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ බෙහෙවින් ඉවහල් වූ බව කරුණාරත්න අමරසිංහ මහතා සඳහන් කරයි. සරච්චන්ද්‍රයන්ගේ ආභාසයෙන් මුල් යුගයේ ගුවන් විදුලි නිර්මාණකරණයට බොහෝ දෙනා ප්‍රවේශ වූවා සේම, එම වැඩසටහන් ශ්‍රවණය කිරීමෙන් ලත් උත්තේජනය මත සරත් විමලවීරයන්ගේ මඟ පෙන්වීමෙන් තමන්ටද ශාස්ත්‍රීය සංග්‍රහය, විශ්ව සාහිත්‍ය, ගුවන් විදුලි රඟ මඩල වැනි බොහෝ වැඩසටහන්වලට සහභාගී වීමේ අවස්ථාව උදාවූ බව ප්‍රවීණ සාහිත්‍යධර කරුණාරත්න අමරසිංහ මහතා සඳහන් කරයි.

ශාස්ත්‍රීය සංග්‍රහය යනු ගුවන් විදුලියටම අනන්‍ය වූ වැඩසටහන් ආකෘතියකි. එය, මෙරට ශ්‍රාවක ප්‍රජාවගේ උසස් රසවින්දනයට සහ නූතන සාහිත්‍ය නිර්මාණ පෝෂණයෙහි ලා වෙසෙසි කාර්යභාරයක් ඉටු කළ වැඩසටහනකි. ශාස්ත්‍රීය සංග්‍රහය නොකඩවා තමවත් ප්‍රචාරය වන්නේ ශ්‍රී ලංකා ගුවන් විදුලියේ පමණි. සරල වින්දනය පමණක් නොව, ඉන් ඔබ්බට ගිය සමාජ කියවීමකට සහ සහකම්පිත මානුෂීය හැඟීම් ප්‍රතිනිර්මාණය කිරීමට සමස්ත සමාජ සංස්ථාව තුළම ප්‍රකම්පනයක් ඇති කිරීම වැදගත්ය. ඊට විශාල දිරිගැන්වීමක් ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන ලබා දේ. ශාස්ත්‍රෝන්නතිය උදෙසා රෙදෙව්සරෙහි නැණ පහන් දැල්වූ සරාසඳ යනු කිසිදින අවරගිරෙන් බැස යන සඳ මඬලක් නොවන බව සිහිකළ මනාය.

03

## සරච්චන්ද්‍රට ගුවන් විදුලිය, ගුවන් විදුලියට සරච්චන්ද්‍ර

### සරත් විජේසූරිය[3]

"මාගේ නාට්‍ය කලා නිර්මාණ සම්බන්ධ අතීතය සිහිපත් කරන විට මෙන්ම, සාහිත්‍ය කලාව හා සංගීතය ඉවහල් කරගෙන ශ්‍රාවක සමාජයක රසඥතාව වර්ධනයට කළ කී දෑ සිහිපත් කරන විට ද ගුවන් විදුලිය සමඟ සම්බන්ධය ඔස්සේ සිහිපත් වනුයේ සොම්නස් සහගත හැඟීම් ය'' **එදිරිවීර සරච්චන්ද්‍ර** (අනදසර -1987)

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලංකාවේ ජන සමාජය අවදියෙන් තැබීමට හා පරම්පරා ගණනාවක වින්දන චින්තන ශක්තිය දියුණු කිරීමට කළ සේවය අසම සම වේ. මේ සටහන ලියන්නේ යථෝක්ත වැදගත් කාර්යභාරයෙහි ලා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ දායකත්වය ස්මරණය කිරීමේ අරමුණෙනි.

සිය ශාස්ත්‍රීය අධ්‍යාපනය නිම කොට ලංකාවට පැමිණි සරච්චන්ද්‍ර සාහිත්‍ය විචාරකයෙකු ලෙසින් වැඩ කිරීමට උත්සුක වේ. ඒ සමඟින්ම සිය දිවි පෙවත වෙනුවෙන් කිසියම් ආදායමක් ලබා ගැනීමේ අවශ්‍යතාව ද ඔහුට තිබිණි. ඔහු ගුවන් විදුලියට සම්බන්ධ වන්නේ ඒ කාලය තුළ දී ය. ඒ හා සම්බන්ධ පසුබිම සරච්චන්ද්‍ර සිහිපත් කරන්නේ මෙසේය.

"කොළඹ වාසය කළ අවධියෙහි මගේ අභිලාස අමුතු ම අතකට යොමු වූ බව කිව යුතු ය. එංගලන්තයෙහි දී ඇති කරගත් පුරුද්ද අනුව මම කොළඹ දී රේඩියෝවට කන් දෙන්ට පටන් ගතිමි. එංගලන්තයෙහි දී බී.බී.සී. ආයතනයෙන් විකාශනය කළ රේඩියෝ නාට්‍යවලට කන් දී ඉන් මහත් ආස්වාදයක් ලද්දෙමි. ඒවා හා සසඳන කල සිංහල රේඩියෝ නාට්‍ය නම් පරිහාසයටත් අවමානයටත් ලක්විය යුතු තත්වයක තිබුණ බව මට පෙනුණි. මෙය දරාගත නොහැකි ව මම සිංහල රේඩියෝ නාට්‍ය විවේචනයට භාජනය කරමින් 'සිලෝන් ඔබ්සවර්' නම් පුවත් පතට ලිපි පෙළක් යැවීමි. නොබෝ දිනකින් මට ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් ලියුමක් ලැබුණි. එහි 'යෞවන සමාජය' නම් අලුත් වැඩ සටහනක් ආරම්භ කරන මෙන් මට ආරාධනා කොට තිබුණේ ය. මෙසේ රේඩියෝ ශිල්පියෙකු වීමට මට ආරාධනා කරන ලද්දේ විවේචන මැඩ පැවැත්වීමට යයි සැකයක් මට ඇති විය. මා ශිල්පියෙකු වුවහොත් ඒ සමඟ ම විචාරකයෙකු හැටියට ක්‍රියා කළ නොහැකි ය. ඒ දෙකෙන් එකක් තෝරා ගැනීමට මට සිදු විය. ආදායම අතින් බලන විට ශිල්පියෙකු වීම වඩා වාසිදායක බැවින් මම එය තෝරා ගතිමි."– (පිං ඇති සරසවි වරමක් දෙන්නේ -154 - –55 පිටු, 1985)

සරච්චන්ද්‍ර ගුවන් විදුලියට සම්බන්ධ වීම ඔහුටත් ගුවන් විදුලියටත් අර්ථ සිද්ධියක් බව මින් කියැවේ. ඊට වඩා වැදගත් දෙයක් වන්නේ 'යෞවන සමාජය' ඔස්සේ සරච්චන්ද්‍ර කළ කාර්යභාරය යි. ඉන් එදා ගුවන් විදුලි මාධ්‍ය සතුව තිබූ 'බලය' සේ ම, රටේ සමාජ සංස්කෘතික ජීවිතය උදෙසා සිදු කරන්නට හැකි වූ නිර්මාණශීලී හා බුද්ධිමය දායකත්වය පිළිබඳ සම්ප්‍රදානය ද පිළිබිඹු වේ. මේ යළිත් සරච්චන්ද්‍රගේ වචන ය.

---

[3] මහාචාර්ය, සිංහල අධ්‍යනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
බී.ඒ. ගෞරව, එම්.ෆිල්.(කොළඹ)

"...... 'යෞවන සමාජය' නම් වැඩ සටහන මගින් මට තරුණ කලාකරුවන් හා කලාකාරියන් කීප දෙනෙකු සොයාගත හැකි විය. ඔවුන් අතර සමහරු පසු කලෙක රේඩියෝ ගායකයෝ ගායිකාවෝ, එසේ නැතහොත් රේඩියෝ නාට්‍ය රචකයෝ වූහ. සමහරු රේඩියෝ නළුවෝ නිළියෝ වූහ. රේඩියෝ නාට්‍ය රචකයෙකු හා නිෂ්පාදකයෙකු වසයෙන් ප්‍රසිද්ධියට පත් වූ ප්‍රේමසිංහ වැලිකල මහතා මොවුන්ගෙන් කෙනෙකි." – (උක්ත කෘතිය -155 පිටුව)

ගුවන් විදුලියට සම්බන්ධව, 'යොවන සමාජය' නම් වැඩ සටහන ඉදිරිපත් කිරීම ඔස්සේ සරච්චන්ද්‍ර අලුත් පරපුරක් වෙනුවෙන් තමන්ට කළ හැකි වූ කාර්යභාරය විස්තර කර තිබෙන්නේ මෙලෙසින් ය.

"......යෞවන සමාජයේ වැඩ සටහනින් විකාශනය කිරීම සඳහා මම කෙටි කතා, නාට්‍ය. කාව්‍ය රචනා ආදිය ඉල්ලුයෙමි. මට එවන ලද ප්‍රයත්න පරීක්ෂා කොට ඒවා රචනා කළ අය අතුරින් උපනිශ්‍රය ඇත්තෙකු සේ පෙනෙන කෙනෙක් සිටී නම් ඔහු ගෙන්වා වැඩ සටහනෙහි යොදවමි. වැලිකල විසින් එවන ලද කෙටි කතාවක රේඩියෝ මාධ්‍යයට සුදුසු ලකුණු දුටු බැවින් මම ඔහුට එන්ට කීවෙමි. එවකට ඔහු පාසැල් ගුරුවරයෙක් වූයේය. ඔහු මගේ ගෙයි දොරකඩට විත් බයිසිකලයෙන් බසිනු දැන් මෙන් මගේ සිහියෙහි රැඳී පවතී. රේඩියෝ ආයතනයෙහි නොබෝ දවසකින් ඇබැර්තු ඇති වූ බැවින් ඔහු ගුරු වෘත්තියෙන් අස් වී එහි රක්සාවට ගියේ ය. ඔහු ඇප කැප වී රේඩියෝ නාට්‍ය ශිල්පිය හදාරා එය දියුණු තත්වයකට පැමිණවීමට මහත් පරිශ්‍රමයක් දැරුවේය. විශ්ව සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨ නාට්‍ය ගණනාවක් ම ඔහු පරිවර්තනය කොට රේඩියෝ මාධ්‍යයට සුදුසු වන පරිදි සකස් කොට විකාශනයට පත් කළේය. ශ්‍රාවකයන්ගේ රුචිකත්වය උසස් මට්ටමකට නැංවීමට මෙය මහත් රුකුලක් වූ බව කිව මනා නොවේ. මට ගුණදාස අමරසේකර පළමු වරට හමු වූයේ ඒ දවස්වල ය. කිසියම් විදේශ සමාගමක් විසින්, නොයෙක් රටවල ආධුනික ලේඛකයන් විසින් රචනා කරන ලද කෙටි කතාවල සංග්‍රහයක් පළ කරන්ට අදහස් කර, අපේ රටින් ද කෙටි කතාවක් තෝරා එවන මෙන් ආරාධනා කරන ලදී. ඒ සඳහා පවත්වන ලද තරඟයට එවන ලද කෙටි කතා අතුරින් එකක් තේරීම මටත් එම්. ජේ පෙරේරාටත් බාර විය. ගුණදාස අමරසේකරගේ 'රතු රෝස මල' නම් කෙටි කතාව අප විසින් තෝරා ගන්නා ලදී. මේ කතාව ඉංග්‍රීසියට පෙරළා යවන්ට සිදු වූ බැවින් මම පරිවර්තන කාර්යය බාර ගතිමි. ඊට එහි කර්තෘ ගුණදාසගේ සහාය මම පැතීමි. විශාල ඇස් සඟලකින් යුත් ඔහුගේ බුද්ධිමත් මුහුණ මගේ දෘෂ්ටිපථයට පිවිසුණු පළමු මොහොත මගේ සිහියෙන් මැකී නොයයි. ගුණදාසගේ කථාව, යුරෝපීය හා ආසියාතික තරුණ ලේඛකයන්ගේ කෘති සමඟ, නොබෝ දවසකට පසු ජාත්‍යන්තර සංග්‍රහයක පළ වී තිබෙනු මම දුටිමි. මම ඔහුගේ 'රතු රෝස මල' යෞවන සමාජයේ වැඩ සටහනින් විකාශනයට පත් කෙළෙමි. ටික කලක් ගුණදාස මගේ වැඩ සටහනට මට සහාය වූයේ ය." – (උක්ත කෘතිය,155 – 156 පිටු)

පී. වැලිකල ගුවන් විදුලි නාට්‍ය කලාව ගැන සිහි කරන කොට නිසැකව සිහිපත් කෙරෙන නාමයකි. ගුණදාස අමරසේකර මෙරට පහළ වූ ජ්‍යොෂ්ඨතම සාහිත්‍යධරයෙකු වන්නේය. මේ දෙදෙනාගේ තිඹිරි ගෙය ගුවන් විදුලිය ; 'යෞවන සමාජය' වීම පළ කරන්නේ මෙරට සාහිත්‍ය කලාවේ අභිවෘද්ධියට ගුවන් විදුලියට සම්බන්ධව සරච්චන්ද්‍ර කළ කාර්යභාරයේ අනර්ඝ දායකත්වයක් නොවන්නේ ද? එපමණක් නොව සරච්චන්ද්‍රයන් ද ගුවන් විදුලිය ඔස්සේ සිය නිර්මාණ ජීවිතය පටන් ගත් අන්දම ගැන ද පවසයි. ඒ වග සඳහන් කර තිබෙන අන්දම ය මේ.

"මා ද පළමුවෙන් නාට්‍ය ලියුවේ රේඩියෝ විකාශනය සඳහා ය. පසු කලෙක මම ඒවා සමහරක් රංග භූමිය සඳහා සකස් කොට නිෂ්පාදනය කෙළෙමි. මගේ 'රත්තරං' යන නාට්‍යය මෙවැන්නකි. මුල් කාලයෙහි දී මා විසින් රේඩියෝව සඳහා ලියන ලද නාට්‍ය අතුරින් 'සත්ව කරුණාව', 'තරුණ ලේඛකයා' හා 'වල

ඉහගෙන කෑම' යන මේවා සඳහන් කළ හැකි ය. පසු දවසක 'මනමෙ නාඩගම' නිෂ්පාදනය කිරීමට මට සහාය වූ චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ මුණ ගැසුණේ ද මේ අවධියෙහි ය....." (උක්ත කෘතිය, 157 පිටුව)

සරච්චන්ද්‍ර දෘශ්‍ය කාව්‍ය අතර විශිෂ්ට නිර්මාණයක් සේ සැලකෙන "පෙමතො ජායතී සොකො" නාට්‍යය ද මුලින්ම රචනා කර තිබෙන්නේ ගුවන් විදුලියටය. එම නාට්‍යය ලංකා ගුවන් විදුලි සේවයේ සිංහලාංශය මගින් ප්‍රථම වරට 1957 අප්‍රේල් මස 11 වැනිදා අපර භාග 7.30 ට ප්‍රචාරය කළ බව වාර්තා වේ.

ගුවන් විදුලි ගීතය සම්බන්ධ ඉතිහාසය; එහි අභිවෘද්ධිය හා බැඳුණු අතීතයට ද සරච්චන්ද්‍ර සම්බන්ධ ය. එහි දී ඔහු විවාදාත්මක චරිතයක් වී තිබේ. මේ සම්බන්ධ පුවත තිස්ස අබේසේකර මහතා සිය "අයාලේ ගිය සිතක සටහන්" කෘතියේ කදිමට ලේඛන ගත කර තිබේ.

ගුවන් විදුලිය ඔස්සේ සරච්චන්ද්‍රයන් ඉදිරිපත් කළ 'ශාස්ත්‍රීය සංග්‍රහය' මෙරට නූතන සාහිත්‍ය කලාව විෂයෙහි නව මානයන් ශ්‍රාවක ජනයාට අවබෝධ කර දෙමින්,සාහිත්‍ය විචාරය, සාහිත්‍ය කියවීම හා රස විඳීම සම්බන්ධ අතිශයින් වැදගත් කවුළු විවර දුන් අසිරිමත් හා විශිෂ්ට සන්නිවේදන ප්‍රයත්නයක් බව නොවළහා පැවසිය යුතුය.

සරච්චන්ද්‍රයන් සිය ජීවිතයේ සැඳෑ සමයේ දී නිර්මාණය කළ "ලෝමහංස" නාට්‍යය ගැනත්, බන්දුල ජයවර්ධන මහතා නිර්මාණය කළ "මොනර පිල්" නාට්‍යය ගැනත් මම ගුවන් විදුලි වැඩ සටහන් දෙකක දී අදහස් දැක්වීමි. යම් විවේචනාත්මක අදහස් පළ කිරීමක් ද මේ නාට්‍ය දෙක සම්බන්ධයෙන් සිදු කළෙමි. දිනක් සරච්චන්ද්‍ර මහාචාර්යතුමා මට විවේක දිනයක ඇවිත් යන ලෙස දැන්වීය. මම වෙලාවක් වෙන් කරගෙන ගියෙමි. සැබවින්ම මා ගියේ චකිතයකිනි, දෙගිඩියාවකිනි. නිවසේ සිටියේ එතුමා පමණි. මට ප්‍රණීත තේ කෝප්පයක් සාදා සංග්‍රහ කළ එතුමා අනතුරුව සුහද පිළිසඳරකට මුල පිරුවේය. මා ගුවන් විදුලියෙන් ඉදිරිපත් කළ වැඩ සටහන් දෙක ඇසූ බව පැවසූ එතුමන්, ඒ වෙලාවේ විස්තර කර සිටියේ, ජන සමාජයක රසඥතාව වර්ධනය කිරීමට - ශ්‍රවකයාගේ පරිකල්පන ඥානය අවදි කිරීමට ගුවන් විදුලිය ප්‍රබලතම මාධ්‍යය බව ය. සිය අතීත අත්දැකීම් සිහි කරමින්, ගුවන් විදුලිය සම්බන්ධව කාලය ගත කිරීමෙන් තමා ලද අත්දැකීම් හා තමන් කළ කාර්යභාරයන් සිහිපත් කළ එතුමන් මට ගුවන් විදුලි මාධ්‍යයෙන් ශ්‍රවකයා ඇමතීමට කුසලතාවක් තිබෙන බව පවසා, එය අගය කරමින් දිගටම වැඩ කරගෙන යන්නැයි ආශිර්වාද කළේය.

ගුවන් විදුලිය සම්බන්ධ සරච්චන්ද්‍රගේ ගෞරවණීය මතකය මෙන්ම ගුවන් විදුලිය සතු ශක්‍යතා සරච්චන්ද්‍ර විස්තර කරමින්, සෝ බර හඬින් පැවසුවේ ගුවන් විදුලි මාධ්‍යය නරකම අන්දමට පාදඩකරණය වී තිබීම ගැන තමන්ට වේදනාවක් තිබෙන බවය.

සරච්චන්ද්‍ර යනු කවියෙකි, විචාරකයෙකි, ගුරුවරයෙකි, චින්තකයෙකි. ඊටත් වඩා ඔහු අලුත් යමක් දකින්නට හා අලුත් යමක් කරන්නට කැපවුණ අසමසම පුද්ගලයෙකි. එදා එතුමාගෙන් සමුගෙන එන විට මා කල්පනා කළේ 'දුහුනන් දැනුම් සඳහා එතුමන් සතු පරමාදර්ශී චරිතය' අසම සම බව පමණක් නොව, සදානුස්මරණීය බව ය.

## මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ දෘශ්‍ය කලා පෝෂණය වීමට ශ්‍රව්‍ය මාධ්‍යක් ලෙස ජාතික ගුවන් විදුලිය වෙතින් ලද දායකත්වය

එදිරිවීර ගුණසේකර[4]

“අප විසින් පළමුවෙන්ම කළ යුතුව තිබෙන්නේ නාට්‍ය කලාව පිළිබඳව ආසාවක් මහජනතාව තුළ දැනවීමය. නාට්‍ය වැනි කලාවල් ස්වල්ප දෙනෙකුට පමණක් සීමා වී තිබිය හැක්කක් නොවේ. මෙතෙක් කල් ඉදිරිපත් කළ බටහිර නාට්‍යයන්ගේ රසය වින්දේ මැද පන්තියට අයත් (බොහෝ විට ඉංග්‍රීසි උගත්) ස්වල්ප දෙනෙකු පමණි. සාහිත්‍ය රසය බොහෝ දෙනා හට විඳීමට අගනා මාර්ගයකි නාට්‍ය කලාව. හුදකලාව හිඳගෙන පොතක් කියවීමට මැලිවන බොහෝ දෙනා නෑදෑ මිත්‍රයන් සමඟ ගොස් නාටකයක් නරඹා විනෝද වීමට ප්‍රිය කරති. පෙරදිග නාට්‍යයට හුදු නාට්‍ය රසය හැරුණු විට කාව්‍ය රසයද, ගීත රසයද, නෘත්‍ය රසයද යන මේ රස ඇතුළත් වේ. මේ නොයෙකුත් කලාවන් එක් රැස්වන කේන්ද්‍රස්ථානයකි රඟ මඬල. කාව්‍ය රසය, ගීත රසය හා නෘත්‍ය රසය (ඇතැම් විට චිත්‍ර රසය) යන මේ රසයන් නිසි ලෙස යෙදීමෙන් නාට්‍ය රසය දියුණු තියුණු කළ හැකිය. මේ සියලුම රසයන් එක් තැන් කිරීමට අවස්ථාවක් ලැබෙන්නේ දේශීය නාට්‍ය කලාවක් ගොඩනැංවීමට තැත් කළහොත් පමණක් යයි හඟිමි. නාට්‍ය කලාව බහු ජනප්‍රිය කළ හැක්කේද මේ මාර්ගයෙන් යයි සිතේ” (ගලහිටියාව,2019).

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් 1958 වසරේදී සිදු කරන ලද උක්ත ප්‍රකාශය මඟින් එතුමාගේ කලාව හා බැඳි ආත්මය සම්බන්ධයෙන් මනාවට විවරණය වේ. වර්තමාන මිනිසා ජීවත්වන සමාජ සන්දහය වඩාත් ප්‍රචණ්ඩකාරි වී තිබේ. එසේම මිනිසාගේ මුළු මහත් මානව සන්තානයම වර්තමානයේ ගැටලුකාරි ප්‍රපංචයක් දක්වා වර්ධනය වී ඇති ස්වභාවිකව නොවේ. ඒ සඳහා සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික සාධකයන් බලපා තිබේ. විශේෂයෙන් වර්තමාන ළමා පරපුර සහ තරුණ පරපුර වඩාත් ප්‍රචණ්ඩ වී ඇති බව සමාජ සන්දර්භය නිරීක්ෂණය කිරීමේදී මනාවට ගම්‍යමාන  වේ. ඒ සඳහා බලපා ඇත්තේ මිනිසා කලාවෙන් ඉවත් වීමය. ඉහත ප්‍රකාශයෙන් විශද වන පරිදි මහාචාර්ය සරච්චන්ද්‍රන්ට අනුව අප විසින් පළමුවෙන්ම කළ යුත්තේ මහජනතාව තුළ නාට්‍ය කලාව පිළිබඳව ආසාවක් ඇති කිරීමය. එනම් වර්තමාන මිනිසා සම්බන්ධයෙන් එම ප්‍රකාශයේ ආස්ථානය වන්නේ ඔහුට හෝ ඇයට කලාව පිළිබඳව ආසාවක් ඇතිකිරීම ඉතා වටිනා කාලීන අවශ්‍යතාවක් බවය. නූතනය වන විට මානවයාගෙන් ඉවත්ව පවතින සාහිත්‍ය රසය ඔවුන් තුළ ජනිත කරවීම කිසිසේත්ම පහසු කටයුත්තක් නොවේ. ඒ අනුව අතිශය වැදගත් වන්නේ ඒ වෙනුවෙන් නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම බව කිව හැකිය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් යනු අනාගතය කල්තියා කියවන ලද ප්‍රාමාණික විද්වතෙකි. හෙතෙම එක්දහස් නවසිය පනස් අට වසරේදී සිදු කරන ලද ප්‍රකාශය අදටත් වලංගුවීම මඟින් ඒ බව මනාවට ගම්‍ය වේ.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්  1939 වසරේදී සිය බිරිඳ සමඟ ඉන්දියාවේ තාගෝර්තුමාගේ ශාන්ති නිකේතනයට යාම තුළින් එතුමාගේ ජීවිතයේ මනා පරිවර්තනයක් විය. එහිදී හෙතෙම භාරතීය දර්ශනය පිළිබඳ හා සංගීතය පිළිබඳව අධ්‍යයනය ලබන අතර, එය එතුමාගේ ජීවිතයේ සංධිස්ථානයක් බවට පත්විය. එමඟින් ලැබූ සංගීත ඥානය එතුමාගේ පසුකාලින නිර්මාණවලට බහුලව බලපා තිබේ (ගලහිටියාව,2019).

1956 වර්ෂයේ දී සිය ප්‍රථම නාට්‍යය ලෙස  මනමේ නිෂ්පාදනය කළ අතර, එය දීර්ඝ කාලින නිර්මාණ පර්යේෂණයක ප්‍රතිපලයකි. එය විශේෂයෙන්ම සාම්ප්‍රදායික නාඩගම් නාට්‍ය කලාවේ ආභාසය සහිතව නිර්මාණය වීම පිළිබඳව බොහෝ දෙනාගේ පැසසුමට ලක් තිබේ. ඔහු නාට්‍ය රචකයෙකු වශයෙන් දිගටම

[4] බහුශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,කොළඹ 07
බී.ඒ.ගෞරව, එම්.ෆිල්. (කැලණිය), පී.එච්.ඩී. (ජයවර්ධනපුර), ජනමාධ්‍ය ඩිප්ලෝමා

කටයුතු කළ අතර ඔහු විසින් නිෂ්පාදනය කෙරුණු සිංහබාහු (1961) නාට්‍ය ඔහුගේ හොඳම නිර්මාණය ලෙස පුළුල් පරාසයක සිට සලකා බැලීමටද ලක්විය. එමෙන්ම මළගිය ඇත්තෝ (1959), වල්මත් වී හසරක් නුදුටිමි (1962), මළවුන්ගේ අවුරුදු දා (1965) වැනි බොහෝ නව කතාද කාලයාගේ ඇවෑමෙන් (1969), මායං රූපය (1974), රූප සුන්දරී (1984) වැනි කෙටි කතාද මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලදී.

එමෙන්ම සුනිල් මිහිඳුකුලයන් පවසන පරිදි මහාචාර්ය සරච්චන්ද්‍රයන් 'බහින කලාව හෙවත් සංස්කෘති කොමසාරිස්' නම් වූ තම ප්‍රථම ස්වතන්ත්‍ර නාට්‍ය පෙළ ලියන්නේ එතෙක් පැවැති නාට්‍ය මතවාදය තවදුරටත් වලංගු නැති බව හැඟුණු නිසා විය හැකිය. තවද එකල මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නවතම අදහස වූයේ 'දේශීය නාට්‍ය කලාව දියුණු කිරීම සඳහා නිතරම විදේශීය කෘති නොසෑහෙන බැවින් අවට පරිසරයෙන් ගත් චරිත හා අවස්ථා ඇසුරු කරගෙන නාට්‍ය ලිවිය යුතු බවත්ය. හෙහෙම අනතුරුව 'පබාවතී', 'රත්තරන්', 'ඒකට මට හිනා හිනා', 'වඳින්න ගිය දේවාලේ' වැනි නාට්‍ය රචනා කළේ කළ බවත් මිහිඳුකුල මහතා පවසයි. සරච්චන්ද්‍රයන්ගේ බොහෝ නාට්‍ය, අත්හදා බැලීම් ලෙස ගත හැකිය. 'රත්තරන්' නාට්‍ය කෝලම් සම්ප්‍රදායෙන්ද, 'වෙල්ල වැහුම්'නාට්‍ය සොකරි සම්ප්‍රදායෙන්ද නිපදවා තිබේ 'පෙමතෝ ජායති සොකෝ' නාට්‍යය පෙරදිග ඔපෙරාවක් වන අතර, නිෂ්පාදනය නොවූ 'ගොම්මන් කෙකිණිය' මුද්‍රා නාට්‍යයක් ලෙස සැලකේ.

විශේෂයෙන් ශ්‍රී ලාංකේය නවකතාකරුවෙක්, කවියෙක්, නාට්‍ය රචකයෙක්, සාහිත්‍ය විචාරකයෙක්, නිබන්ධකයෙක් සහ සමාජ විවේචකයෙක් ලෙස ජාත්‍යන්තරය අතික්‍රමණය කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රන්ගේ සිය නිර්මාණ සඳහා ශ්‍රව්‍ය කලා මාධ්‍යක් ලෙස ජාතික ගුවන් විදුලිය පුරෝගාමී දායකත්වයක් සැපයූ බවට පවතින මතයද සර්ව සාධාරණවේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහයන් පවසන්නේ ඔහුගෙන් ජාතික ගුවන් විදුලියටත්, ජාතික ගුවන් විදුලියෙන් ඔහුටත් විශාල සේවයක් ඉටු වූ බවයි.

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳව නිශ්චිත තොරතුරු සවිස්තරව සහ විධිමත්ව ඉදිරිපත් කිරීම අසීරු වුවද, එහිදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් වඩාත් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකළ බව කිව යුතුමය. විශේෂයෙන් ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාට්‍ය කලාවට ආධුනික යෞවනයන් සම්බන්ධ කර ගැනීමේ ගෞරවය නිතැතින්ම මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට හිමි වේ. ඔහු විසින් 1950 දී ආරම්භ කරන ලද "යෞවන සමාජය" මෙහීදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකර තිබේ (කරුණානායක,1990). ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාට්‍ය කලාවට ඉන් සුවිශේෂී දායකත්වයක් හිමිව තිබූ බව මූලාශ්‍රය ගවේෂණය කිරීමෙන් මනාවට ගම්‍යමාන වේ. පී.වැලිකල, ඒ.පී ගුණරත්න, ජී වික්ටර් මිගෙල් වැනි ප්‍රකට නාට්‍ය ශිල්පීන් ජාතික ගුවන් විදුලියට හඳුන්වා දීමේ ගෞරවයද නිරායාසයෙන්ම මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට හිමි වේ. වික්ටර් මිගෙල් ඒ සම්බන්ධයෙන් දක්වා ඇත්තේ පහත පරිදි අදහසකි.

ගුවන් විදුලි නාට්‍යයේ ඉතිහාසය දෙස බලන විට එදිරිවීර සරච්චන්ද්‍රයන් අතින් ගුවන්විදුලි නාට්‍යයේ නව නැම්මක් ඇති වූ බව අප පිළිගත යුතුය. ස්වාභාවික දෙබස්, නාට්‍යයට හඳුන්වා දෙනු ලැබුවේ එදිරිවීර සරච්චන්ද්‍රයන් විසිනි. පී.වැලිකල මහතාද මේ පෙරළියට බොහො සෙයින් වග කියනවා. කලින් නාට්‍යවල තිබුණේ ටවර්හෝල් නාට්‍යවල මෙන් දෙබස්. මුල් නාට්‍යවල ගීතද ඇතුළත් වුණා. දැන් ගුවන් විදුලි නාට්‍ය මීට වඩා හාත්පසින්ම වෙනස් (නානායක්කාර,2012).

වික්ටර් මිගෙල් මහතාගේ මෙම ප්‍රකාශය සමීපව අධ්‍යයනය කරන විට පැහැදිලි වන්නේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ශ්‍රී ලාංකේය ගුවන් විදුලි නාට්‍ය කලාවේ හැරවුම් ලක්ෂයක් නිර්මාණය කිරීමට සමත් වූ ප්‍රාමාණික විද්වතෙකු බවයි. සැබැවින්ම ගුවන් විදුලි නාට්‍යයකට ස්වාභාවික දෙබස් එකතු කිරීම කිසි ලෙසකින් පහසු කටයුත්තක් නොවේ. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් මෙම වෙනස සිදු කරන යුගය වන විට ශ්‍රී ලාංකේය ගුවන් විදුලි නාට්‍ය කලාව තුළ යම් ආධුනික ස්වරූපයක් දක්නට ලැබුණි. ලංකා ගුවන් විදුලියේ ප්‍රථම මාලා නාට්‍ය වන 'වලහා' නාට්‍ය තුළ හො එවැන්නක් දක්නට නොවීය. එමෙන්ම

රූප මාධ්‍යයට මෙන් නොව ගුවන් විදුලි මාධ්‍යයට නාට්‍යක් රචනා කිරීම එතරම් පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා මනා පරිකල්පනයක් පැවතිය යුතුමය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් යනු එකී පරිකල්පනය සිය ආත්මය තුළින්ම ප්‍රගුණ කළ කලාකරුවෙකු බැවින් ඔහුට එම කාර්යයන් ඉතා පහසුවන්නට ඇත. එලෙසම මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට යෞවන සමාජය ඉදිරිපත් කිරීමට පී.වැලිකල මහතා අඛණ්ඩව සහය ලබා දී තිබේ. හෙතෙම අනතුරුව 1951 වසරේ සැප්තැම්බර් මස 19 වැනිදා ජාතික ගුවන් විදුලියේ නිබන්ධ සම්පාදකවරයෙකු ලෙස සේවයට ඇතුළත්ව ඇත (නානායක්කාර,2012).

තවද මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ගුවන්විදුලි නාට්‍ය භාවිතාව පිළිබඳව අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහයන් සඳහන් කරන්නේ ඇ නුවන් ලැබුවා සහ ස්වර්ණතිලකා යන කලා කෘතින් එතුමාගේ කලා ජීවිතයේ සන්ධිස්ථාන වූ බවයි. එමෙන්ම 1953 වසරේ මැයි මස 10 වැනිදා මාර්ටින් වික්‍රමසිංහයන්ගේ 'විජිතා' මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් ගුවන් විදුලි නාට්‍යක් ලෙස සකස් කොට ප්‍රචාරය ආරම්භ කරන ලද බවද අනාවරණය වේ. එමෙන්ම එකල ගුවන් විදුලි රඟමඬලින් 1953 වසරේ ජූලි මස 06 වැනිදා ප්‍රචාරය වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ "යාදෙක නොරත රත' නාට්‍යද ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාට්‍ය කලාවේ සංධිස්ථානයකි. මෙම කාල වකවානුව වන විට ආගමික හා ඓතිහාසික නාට්‍යයද, සමාජ නාට්‍යද ප්‍රචාරය විය. පොදුවේ පිළිගත හැකි යම් ස්ථාවරයක් ගොඩනැගෙන තුරු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නාට්‍ය පෝෂණය කිරීමෙහිලා ඒ.පී ගුණරත්න, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ඩබ්.ඒ සෝමදාස, පී.වැලිකල, ඩී.එම් කොළඹගේ, ඊ.ටී.ද.එස් ලීලානන්ද, සෝමපාල ගුණධීර, මුදලිනායක සෝමරත්න, එස් පියසේන, ජේ.එච්.ජයවර්ධන, ආනන්ද සිරිසේන, ධර්ම ශ්‍රී මුණසිංහ, සුගතපාලද සිල්වා යන විද්වත්හු සුවිශේෂී දායකත්වයක් සැපයූහ (නානායක්කාර,2012). එමෙන්ම 1972 වසරේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ උපදේශක මණ්ඩලයට පත් වන මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් බොහෝ කාලයක් එම සංස්ථාවේ ප්‍රගමනය සඳහා සක්‍රීය දායකත්වයක් සපයා තිබේ (ගලහිටියාව,2019). මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් නම් වූ සුවිශේෂී අග්‍රගණ්‍ය කලාකරුවා ජාතියට දායාද කර ඇති වේදිකා නාට්‍ය, නව කතා, කෙටි කතා මෙන්ම පර්යේෂණ කෘති සංඛ්‍යාව සුවිශාලය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට එකී කලා කෘතින් වඩාත් සාර්ථකව ග්‍රාහක ගත කිරීමෙහිලා ශ්‍රව්‍ය මාධ්‍යක් ලෙස ජාතික ගුවන් විදුලිය සැලකිය යුතු දායකත්වයක් සපයා ඇති බව මේ අනුව විශද වන අතර, නූතන අංකුර කලාකරුවන්ට සිය කුසලතා වර්ධනය කර ගැනීමේ කාර්යයේදී එතුමාගේ චරිතය තුළින් හා නිර්මාණ තුළින් ලබා ගත හැකි දායකත්වය අපරමිත බව සඳහන් කළ යුතුමය. එමෙන්ම නූතන ඥාන ගවේෂකයන් සහ කලාකරුවන් සිය දැනුම සමාජගත කිරීමේ කාර්යයේදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ චරිතයෙන් වඩාත් ඵලදායි ලෙස ආදර්ශ ලබා ගත යුතු බව කිව යුතු මනාය.

**විමර්ශිත ග්‍රන්ථ**


කරුණානායක,නන්දන.,(1990). හැටහය වසරක ගුවන්විදුලිය, මොරටුව :ජාතික ප්‍රතිපත්ති පර්යේෂණ කේන්ද්‍රය.

ගලහිටියාව,පී.බී.,(2019). මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සමග දශක හතරක්, කොළඹ 10: සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ පුද්ගලික සමාගම.

නානායක්කාර,සේන.,(2012).ගුවන්විදුලිය මාධ්‍ය විවරණ, කොළඹ 10: සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ(පුද්.) සමාගම.


**සම්මුඛ සාකච්ඡා**


වික්‍රමසිංහ,මහානාම, 01.03.2023.කොළඹ, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

05

## සංස්කෘතික ඉතිහාසය හා විචාරයෙහිලා ගුවන්විදුලියේ දායකත්වය (මනමේ නාට්‍යය ඇසුරෙන්)

**ලියනගේ අමරකීර්ති** [5]

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ මනමේ නාටකය පිළිබඳ ප්‍රත්‍යාවලෝකනයක යෙදෙන විට, එය ප්‍රවේශ කිහිපයකින් කළ හැකිය. සංස්කෘතික විචාරකයාගේ ප්‍රවේශයෙන් මෙම ප්‍රත්‍යාවලෝකනය ඉදිරිපත් කරනු ලැබේ. "මනමේ නාටකය" නැමැති සංස්කෘතික වස්තුව විසිඑක් වෙනි සියවස පිණිස අනාවරණීය නුවණින් විනිවිද අලුතින් වටහාගන්නේ කෙසේද? එහි එන තේමාත්මක හරයත්, ඒ කෘතිය නිර්මාණය වූ ඓතිහාසික පසුබිමත් ඇසුරින් වර්තමානයට ඉගෙනගැනීමට ඇති දේ අප අලුතින් සිතා බැලීම වැදගත්ය.

මනමේ නාට්‍ය ඇතුළු සරච්චන්ද්‍රගේ නාට්‍ය කලාවෙහි භාෂා විශිෂ්ටතාව බොහෝ දෙනා කතා කරති. සන්නිවේදන ආයතනයක් ලෙස ජාතික ගුවන් විදුලියේ භාෂා විශිෂ්ටතාවද එලෙස සාකච්ජාවට බඳුන්වන විෂයයික ප්‍රස්තුතයකි. මෑත ඉතිහාසයේ අපට සිටි වදනිසුරු බවින් අගතැන්පත් ලේඛකයකි, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර. ඔහුගේ කලාව ගැන විමසන කල්හි ඔහු සතු වූ සුවිශේෂී කවීත්වයද මඟහැරිය නොහැකිය. "සිංහල කාව්‍ය සම්ප්‍රදාය" නම් කෘතියේදී ගුණදාස අමරසේකර විසින් සරච්චන්ද්‍ර හඳුන්වන්නේ 20 වෙනි සියවසේ සිටි විශිෂ්ටම කවියෙකු ලෙසයි. කිසිදු කාව්‍ය සංග්‍රහයක් නොලියූ සරච්චන්ද්‍ර විශිෂ්ඨ කවියෙකු ලෙස අමරසේකර හැඳින්වීම වරදක් නොවේ.

මෙහිදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පිළිබඳ වෙනස් ප්‍රවේශයකින් දෘෂ්ටිවාදයක් ගොඩනැගීමට අපේක්ෂා කෙරේ.

### සංස්කෘතිය හා කලාව

ඕනෑම යුගයක විශිෂ්ට කලාව ඒ කෘතිය පහළ වන සංස්කෘතිය සම්බන්ධයෙන් ප්‍රවේශ දෙකක් ගනු ලබයි. එනම්, එක් ප්‍රවේශයක් වන්නේ සංස්කෘතික සංරක්ෂණයයි. අනෙක් ප්‍රවේශය, සංස්කෘතික සංස්කරණයයි. මනමේ නාටකය මේ කාරණය සම්බන්ධයෙන් විශිෂ්ට නිදර්ශනයකි. ලංකා ගුවන් විදුලියද මේ ප්‍රවේශ දෙක මත පිහිටා විග්‍රහ කරගත හැකිය. ගුවන් විදුලිය සිය ශානර මඟින් සංස්කෘතික සංරක්ෂණ සහ සංස්කෘතික සංස්කරණය කරනු ලබයි.

මනමේ නාටකය ඇසුරින් එම සංස්කෘතික සංරක්ෂණය කරන්නේ කෙසේද යන්න විමසා බලමු. එය ආකාර කිහිපයකින් සිදුවේ. මනමේ නාටකයට විෂය වන්නේ ජාතක කතාවකි. එය චුල්ල ධනුද්ධර ජාතකයයි. එමඟින් සරච්චන්ද්‍ර ජාතක කතාව නම් සංස්කෘතික උරුමය සංරක්ෂණය කර ඇත. ජාතක කතාව ඔහු 20 වෙනි සියවස කරා ගෙනවිත් ඊට නව අදාළත්වයක් ලබාදී තිබේ. ජාතක කතාව අලුත් යුගයක් වෙත ආමන්ත්‍රණය කරයි. ජාතක කතාව නම් ශානරය තුළ අඩංගුවන අර්ථමය හා ආඛ්‍යානමය විභවතා අලුත් පරම්පරාවක් වෙත විවෘත කරනු ලබයි. එමඟින් අපේ සංස්කෘතියේ වැදගත් උරුමයක් වන ජාතක කතා සාහිත්‍ය සංරක්ෂණය කරයි. එය කටුගෙයක තැන්පත් කොට රැකීමක් නොවේ. සංස්කෘතික ජීවිතය තුළ නව ජීවයක් ජාතක කතාවට ලබාදී එය රැක ගැනීමට කරන වෑයමක් ලෙස මෙය හැඳින්විය හැකිය. විශිෂ්ට කවියෙකු වන සරච්චන්ද්‍ර සිය නාට්‍යය සඳහා ජාතක කතා පදනම් කර නොගත්තේ යැයි

---

[5] විශ්‍රාමික මහාචාර්ය, සිංහල අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
බී.ඒ.ගෞරව(කොළඹ), එම්.ඒ., පී.එච්.ඩී. (විස්කොන්සින්)

සිතුවහොත් ජාතක කතාව නම් සාහිත්‍ය රචනා විශේෂයට අපේ නූතන සාහිත්‍ය ඉතිහාසයට හිමිවන වැදගත්කම කෙසේ වනු ඇත්ද? සරච්චන්ද්‍ර සිංහල ජාතක කතාවට නව වැදගත්කමක් ලබාදුන් විශිෂ්ට සාහිත්‍යධරයෙකි. පැරණි යුගයට අයත් සාහිත්‍ය ශානරයට නව යුගයේදී නව වැදගත්කමක් ලැබෙන්නට ඒ නව යුගයේ සිටින විශිෂ්ට කලාකරුවන් පැරණි ශානරය තමන් වෙත උරුම කරගත යුතුය.

ජාතක කතාවට අමතරව සරච්චන්ද්‍ර විසින් සිංහල සාහිත්‍ය ඉතිහාසයේ හමුවන එක් භාෂා ධාරාවකද විශිෂ්ටයෙකි. ඔහු 20 වෙනි සියවසේදී කාව්‍ය භාෂාධාරාවට නව අදාළත්වයක් ලබාදී තිබේ. සරච්චන්ද්‍රගේ නාට්‍යවල ශ්‍රී රාහුල හිමියන්ගේ කවිබස හා කවි යෙදුම් සුලභව දැකිය හැකිය. නිදර්ශනයක් ලෙස සැලළිහිණියේ එන ඇතැම් යෙදුම් උදාහරණ ලෙස "ලප නොමවන් සඳ" මනමේ නාට්‍යයෙහි එලෙසින්ම දැකිය හැකිය. ශ්‍රී රාහුල හිමියන්ගේ වචන පමණක් නොව රූපකාර්ථවත් යෙදුම්ද සරච්චන්ද්‍ර විසින් අලුත් අර්ථදී භාවිත කර ඇත. එමගින් ඔහු කෝට්ටේ යුගයේ කවිබසට 20 වන සියවසේදී නව අදාළත්වයක් ලබාදී ඇත. මේ වූකලී සංස්කෘතික සංරක්ෂණයයි. විශිෂ්ට කලාකරුවන් සංස්කෘතිය රකින්නේ නව සංස්කෘතියක් නිර්මාණයෙහිලා පැරණි සංස්කෘතික උරුමය භාවිත කිරීමෙනි. ලංකා ගුවන්විදුලියද සියවසකට ආසන්න කාලයක් මුළුල්ලේ නව සංස්කෘතියක් නිර්මාණයෙහිලා පැරණි සංස්කෘතිය නූතනත්වයට අදාළ කරගනිමින් ප්‍රතිනිර්මාණ කාර්යයක නිරත වී සිටී.

එසේම, නාඩගම නම් ගැමි නාටක විශේෂයද සරච්චන්ද්‍රයන් ඉතා නිර්මාණශීලී ලෙස 20 වෙනි සියවස කරා ගෙන එයි. එමගින් නාඩගම නම් නාට්‍යය විශේෂයද, නාඩගම් සංගීතයද නූතන යුගය වෙත ගෙන එයි. ශ්‍රී රාහුල හිමිගේ කවි බසත්, ගැමි නාටක විශේෂයක් වන නාඩගමත් 20 වෙනි සියවසේදී විශිෂ්ට කලාවක් නිර්මාණයට ඔහු දායක කරගෙන තිබේ. සරච්චන්ද්‍ර අතින් විදග්ධ සාහිත්‍යය සම්ප්‍රදාය සේම, ජනකලා සම්ප්‍රදායත් 20 වෙනි සියවසේදී සංරක්ෂණය කර ඇත්තේය. මේ වනාහි යම් කලාකරුවකු තම සංස්කෘතිය සම්බන්ධයෙන් ඊට දක්වන ලද හොඳම ප්‍රතිචාරයකි.

**සංස්කෘතික සංස්කරණය**

විශිෂ්ට කලාව, ඒ කලාව බිහිවූ සංස්කෘතිය සංස්කරණය කරනු ලබයි. මනමේ නාටකය ඇසුරින් එය සිදුවන්නේ කෙසේද යන්න විමසා බලමු. මනමේ නාටකයට ජාතක කතාවක් (චුල්ල ධනුද්ධර ජාතකය) විෂය කරගත් සරච්චන්ද්‍ර, ඒ ජාතක කතාවෙහි එන හරය ප්‍රශ්න කරයි. ජාතක කතාව "ස්ත්‍රිය ස්වභාවයෙන්ම පාපයට නැඹුරු කෙනෙකිය" යන දෘෂ්ටිවාදය නිරූපණය කරයි. සරච්චන්ද්‍ර මෙම දෘෂ්ටිවාදය ප්‍රතික්ෂේප කරයි. මනමේ නාටකයේ එන හැටියට මනමේ කුමරිය වැද්දා ඝාතනය කිරීමට කඩුව නොදෙන්නේ ඇයි? ඇය වැද්දා කෙරෙහි ලිංගික ආකර්ෂණයකින් යුක්ත වන නිසාද? එය එසේ නොවේ. ඇය (මනමේ කුමරිය) කරන්නේ ආචාරධාර්මික තර්කනයක් හෙවත් හොඳ නරක පිළිබඳ ස්වයං විනිශ්චයකි. තම ගෝලයන් (වැදි සහචර පිණිස) ලවා මනමේ කුමරු පහසුවෙන් මරා දැමීමට හැකියාව තිබියදී වැදි නායකයා තනිවම මනමේ සමඟ සටනට එළඹුණි. යුද වැදීම හා සටන් කලාව පිළිබඳව වැදි නායකයා ආචාරධර්ම පද්ධතියක පිහිටා සිටි බව මෙයින් මනාව නිරූපණය වේ. ඔහු සතුරා (මනමේ රජු) අත්අඩංගුවට ගෙන වදදී මරා දමන්නෙකු නොවන ශිෂ්ටසම්පන්න නායකයෙකු ලෙස මෙයින් පෙන්වාදී තිබේ. වනාන්තරයේ සිටියත් ඔහු ආචාරධර්ම රකින පුද්ගලයෙකු ලෙස අවබෝධ කරගන්නා මනමේ කුමරිය, වැදි නායකයාගේ මෙම ශිෂ්ටසම්පන්නභාවය පිළිබඳ ප්‍රසාදයට පත්වේ. මනමේ කුමරිය සිය සැමියා වන මනමේ රජුට පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ වැදි නායකයා සතු මේ ආචාරධාර්මික ගුණයයි. එහෙත් ස්ත්‍රිය යනු පිරිමි දෘෂ්ටිවාදමය පුනරුච්චාරණය කරන කෙනෙකු මිස, තමාගේම ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව ප්‍රකාශ කරන කෙනෙකු හැටියට මනමේ කුමරුට නොපෙනේ. ඔහු හැදී වැඩුණු දෘෂ්ටිවාදී ලෝකයත්, ඔහු විසින් අන්තරීකරණය කරගෙන ඇති දෘෂ්ටිවාදයත් නිසා මනමේ කුමරුට සිය බිරිඳ මනමේ කුමරියගේ ප්‍රකාශය ආචාරධාර්මික තර්කනයක් ලෙස වටහා ගත නොහැකි වන්නේය. ඔහුට ඇති එකම විවරණය "ස්ත්‍රිය චපලය" යන ගතානුගතික තර්කනය පමණි. සත්‍යය ලෙස අධිපති කතිකාව තුළ පිළිගත යුත්තේ කුමක්ද යන්න කලින්ම තීරණය වී තිබේ. මනමේ කුමරිය කුමක් කීවද, එහි අර්ථය චපලත්වය මිස අනිකක් නොවේ

යැයි කලින්ම නිශ්චය වී තිබේ. ගැහැනියගේ මුවින් එන වචන ආචාරධාර්මික තර්කනයේ වචන ලෙස අධිපති කතිකාව තුළ පිළිගනු නොලැබේ. මනමේ කුමරිය යනු අනාගත රජෙකුගේ බිරිඳකි. කෙසේ වුවත් ඇය ස්ත්‍රියකි. ස්ත්‍රියක වීම නිසාම පිරිමියාට සාපේක්ෂව ඇයට කතිකාමය බලය අඩුය. ඇගේ කතිකාමය බලය වැදි රජුටත් වඩා අඩුබව අප තේරුම්ගත යුතුය. පිරිමින් විසින් පාලනය කරනු ලබන කතිකාමය අවකාශයක ස්ත්‍රියකට ඇයගේ අවංක අදහස ප්‍රකාශ කළ හැක්කේ කෙසේද? සරච්චන්ද්‍රගේ මනමේ නාටකයෙන් මෙම කාරණය දැඩිව ප්‍රශ්න කරයි.

20 වෙනි සියවසේ මැද භාගයේ ලංකාවේ විසූ පිරිමින් වැඩි දෙනෙකුද ස්ත්‍රියගේ හැකියාව සහ අවශ්‍යතාව ගැන දරනු ලබන්නේ මනමේ කුමරාගේ දෘෂ්ටිවාදයම අඩුවැඩි වශයෙන් ආන්තරීකරණය කරගෙන යැයි අනුමාන කළ හැකිය. සරච්චන්ද්‍ර මනමේ කුමරිය පිරිමියාගේ ඕනෑම දෘෂ්ටිවාදයක සුවච කීකරු සේවිකාවක නොකර, තමාගේම වූ අදහස් දරන්නියක බවට පත්කිරීමට උත්සාහ කර තිබේ. සරච්චන්ද්‍රගේ මනමේ කුමරිය යනු කාරක ශක්තිය ඇති තැනැත්තියකි. ඇය තමා මත පිහිටා ක්‍රියාකරන්නියකි. බලගතු පිරිමින් අනුකරණය කරන චරිතයක් නොවේ. තමාගේම ස්වච්ඡන්දතාව ක්‍රියාවට නඟන්නියකි. ඇය වෙනකෙකු කියන්නක් කරන්නියකද නොවේ. ඇයගේ පිළිවෙල නිසා විවාහයද, අඹු සැමි දෙදෙනාගේ ජීවිතයද ආරක්ෂා වුවේය.

තම සංස්කෘතියෙන් ගත් ජාතක කතාවේ අන්තර්ගත ගතානුගතික දෘෂ්ටිවාදය මෙසේ ප්‍රශ්න කිරීම ඒ සංස්කෘතිය සංස්කරණය කිරීමකි. එලෙසම, එම සංස්කෘතිය ප්‍රසාරණය කිරීමකි. සංස්කරණය යනු සංස්කරණයෙන් වැඩෙන්නෙකි. යම් යුගයක විශිෂ්ට කලාකරුවෝ ඒ සංස්කෘතික සංස්කරණයට හෙවත් සංස්කෘතිය අලුතින් නිර්මාණය කිරීමටද දායක වෙති. ඒ අර්ථයෙන් ගත් කල්හි ලංකා ගුවන් විදුලියද ඉපැරණි සංස්කෘතිය ප්‍රශ්න කරමින්, ඒ සංස්කෘතිය සංස්කරණය කිරීමේ කාර්යයෙහි නිරතව සිටී. එය සංස්කෘතික ප්‍රසාරණය සඳහාද ලබාදෙන පෙළඹුමකි. විශිෂ්ඨ කලාව, සංස්කෘතික සංරක්ෂණය සහ සංස්කෘතික සංස්කරණය යන කාර්යයන් දෙකෙහිම එකවර නිරත වේ.

**මනමේ නිර්මාණය වූ සන්දර්භය හා එහි ඓතිහාසිකත්වය**

යම් සංස්කෘතියක විශිෂ්ට කලා කෘති අලුත් පරම්පරාවක් විසින් උරුම කරගනු ලබද්දී, ඒ කෘති බිහි වූ ඓතිහාසික සන්දර්භය හා ඒ ආශ්‍රිත කතිකා ගැන ඉතිහාසය හැදෑරීම වැදගත්ය. මනමේ විසින් ඇරඹි සරච්චන්ද්‍ර කලාව, මෙරට 56 දරුවන්ට විශාල සංස්කෘතික ප්‍රාග්ධනයක් සපයනු ලැබීය. නිදහසින් පසු ස්වභාෂා අධ්‍යාපනය ලබමින් හැදුණු සහ වැඩුණු මධ්‍යම පන්තියට විදග්ධ කලා උරුමයක් ගොඩනඟා දීම සරච්චන්ද්‍ර ඇතුලු මුල් යුගයේ කලාකරුවන් අතින් කෙරුණු විශිෂ්ට සේවයකි. මනමේ නාට්‍ය සැලකෙන්නේ නූතන සිංහල බෞද්ධ ජාතිකවාදී සංකේතයක් ලෙසයි. මධ්‍යම පාන්තික සිංහලයා මනමේ වැනි නාට්‍ය නිසා ලබන ජාතික ආඩම්බරය හා ස්වෝත්තම හැඟීම විවිධ අවස්ථාවලදී ප්‍රකාශ කරයි.

නමුත්, මනමේ වැනි විශිෂ්ට නිර්මාණයක් බිහිවන්නේ එවැනි පටු ජාතිකවාදී පසුබිමකින් නොවන බව අවබෝධ කරගැනීම වැදගත්ය. සරච්චන්ද්‍ර යනු ලෝකය වෙත ඇස් ඇරුණු මිනිසෙකි. සැබැවින්ම ද්විභාෂික උගතෙකු වූ ඔහු පෞද්ගලික ජීවිතයේදීත්, ශාස්ත්‍රීය ජීවිතයේදීත් සර්ව භෞමික ජීවිතයක් ගෙවූ අයෙකි. ඔහුගේ කාලයේ විශ්ව සාහිත්‍ය හා න්‍යායික ප්‍රවණතා ගැන ඔහු අවබෝධයෙන් සිටියේය.

එපමණක් නොව, මනමේ නාට්‍යය නිර්මාණය කරන කාලයේදී පවා විශ්ව කලාව සමඟ ගනුදෙනු කළ ලයනල් වෙන්ට්ඩ් වැනි අය සමඟ සරච්චන්ද්‍ර සමීප ඇසුරක් පැවැත්වූහ. ඔහු නාට්‍ය හැදෑරීම සඳහා ඇමරිකාව සහ ජපානය ඇතුළු රටවල සංචාරය කළේය. මේ පිළිබඳ විස්තර "පිං ඇති සරසවි වරමක් දෙන්නේ" කෘතියෙහි සටහන් කර ඇත. සරච්චන්ද්‍රගේ චින්තනය පෝෂණයට නන්විධ බුද්ධිමතුන්ගේ ඇසුරද ඉවහල් වී තිබේ. මනමේ මුල් නිෂ්පාදනයට හවුල් වූ සරසවි ශිෂ්‍ය පිරිස පවා පේරාදෙණියෙහි

උගත්තත් ලෝක පුරවැසියන් සේ සිතන්නට ශක්තිය හා පසුබිම ඇති පිරිසක් වූහ. ඒ, එකල පේරාදෙණියෙහි වැඩුණු විඥානයේ ස්වභාවයයි.

ඕනෑම සංස්කෘතියක විශිෂ්ට කලාව බිහිවන්නේ ලෝකයේ විවිධ ස්ථානවල ඇති මිනිස් සංස්කෘතියක විශිෂ්ටතාව ලෙස විවෘත මනසින්ද, සමබර මනසින්ද බලන්නට හැකියාව ඇති කලාකරුවන් අතිනි. ලෝකයේ ඇති හොඳම දේ හෝ පැරණිම දේ හෝ අප වෙත ඇතැයි සිතාගෙන තමාගේම සංස්කෘතිය තුල හිර වී දැත් වසාගත්තවුන්ට විශිෂ්ට කලාව නිර්මාණය කළ නොහැකි බව සරච්චන්ද්‍ර කියා දුන් විශිෂ්ටම පාඩමයි.

(මහාචාර්ය කේ.එන්.ඕ.ධර්මදාස හා පී.බී.ගලහිටියාව විසින් සංස්කරණය කරන ලද "මනමේ ප්‍රත්‍යාවලෝකන" කෘතිය දොරට වැඩීම නිමිත්තෙන් 2013 ජුනි මස 10 වන දින පැවති උත්සවයේදී මහාචාර්ය ලියනගේ අමරකීර්ති විසින් පවත්වන ලද දේශනය. මෙම දේශනය ඇතුලත් ලිපිය සිතිවිලි සිතිජය කෘතියේ මනමේ, සංස්කෘතික ඉතිහාසය හා සංස්කෘතික විවාරය පරිච්ඡේදයේ අන්තර්ගතව ඇත. එය ඇසුරෙන් සකස් කළේ, ඉන්දික ජයරත්න, අශෝකා බාලසූරිය විසින්ය.)

06

# පශ්චාත් යටත්විජිතවල ජාතික සංස්කෘතිය හා ලාංකේය දේශීය නාට්‍ය කලාවක් නිර්මාණය කිරීමේ ප්‍රතිවිරෝධතාඃ ඃ මනමේ නිෂ්පාදනය පිළිබඳ ෆැනොන්වාදී කියවීමක්.

සමන් එම්.කාරියකරවන[6]

*අප්‍රිකානු විප්ලවයට සහභාගී වීමට නම්, විප්ලවීය ගීතයක් ප්‍රබන්ධ කිරීම නො සෑහේ. ජනතාව සමග එකට විප්ලවය කළ යුතුයි. ජනතාවත් සමඟ එසේ කළොත් ගීත නිරායාසයෙන් ම මතුවී එයි.*

**සෙතු ටූර්**

ගිනී රටේ ජනාධිපති ව සිටි සෙතු ටූර් විසින් 1959 පැවති කළු ලේඛකයන්ගේ හා කලාකරුවන්ගේ දෙවැනි මහා සම්මේලනයේ දී ඉහත සඳහන් ප්‍රකාශය කරන ලදි. ඔහු පවසන ආකාරයට සංස්කෘතිය නිෂ්පාදනය කිරීම, නිදහස, යටත් විජිතභාවය ආදිය සමඟ ඍජු ව බැඳී ඇත. සංස්කෘතිය යටත්විජිතහරණයට ලක් කිරීම හුදෙක් විඥානික ක්‍රියාවලියක් නොවන අතර එය පුළුල් දේශපාලන භාවිතයක, සමාජ ක්‍රියාකාරීත්වයක ප්‍රතිඵලයක් ලෙස ජනිත විය යුතු බව මෙයින් ප්‍රකාශ වේ. එසේ නොමැතිව නිර්මාණය වන සංස්කෘතිය ස්වදේශිකයාගේ තත්‍ය ජීවිතයෙන් පරිබාහිර, හුදු සෞන්දර්යවාදී හෝ ආගමික මතවාදවල ගිලී යන බවත් එය දේශීය ධනපති පංතීන් විසින් ස්වකීය ආභරණයක් ලෙස පමණක් භාවිතයට ගන්නා ආකාරයත් ෆ්‍රාන්ස් ෆැනොන් නමැති ඇල්ජීරියානු පශ්චාත් යටත්විජිත විප්ලවවාදී ලේඛකයා විසින් පෙන්වා දෙනු ලැබ ඇත. විමුක්ති අරගලය සමඟ ඓන්ද්‍රීය ව සම්බන්ධ නොවන කලාකරුවන් හා උගතුන් පසු ව ජනතා ද්‍රෝහී ක්‍රියාමාර්ග සමඟ එක් වන ආකාරය පෙන්වන ඔහුගේ **ජාක් රබෙමනන්ජාරා** (Jacques Rabemananjara) හා **සෙන්ග්හෝර්** (Léopold Sédar Senghor ) පිළිබඳ අත්දැකීම් මීට කදිම නිදසුන් වේ (ෆැනොන්,1961).

## යටත්විජිතවල සංස්කෘතික ඉතිහාසය

ජාතික සංස්කෘතියක් බිහි කිරීම ස්වදේශීය බුද්ධිමතුන් මත පැටවී ඇති කාර්යභාරයක් ලෙසත් එම කාර්යයේ නිරත වන බුද්ධිමතා විසින් උපයා ගනු ලබන ශක්‍යතා හා එහි දී පෙන්වන අඩුපාඩු පිළිබඳවත් ෆැනොන් සිය The Wretched of The Earth කෘතියේ 'ජාතික සංස්කෘතිය ගැන' නමැති පරිච්ඡේදයේ දී විස්තර කර ඇත. ෆැනොන්ගේ විග්‍රහය භාවිත කොට සරච්චන්ද්‍ර විසින් දේශීය සංස්කෘතියක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව බිහි කරනු ලැබූ *මනමේ* ඇතුළු නාට්‍ය පිළිබඳවත් ඔහුගේ ශාස්ත්‍රීය මැදිහත්වීම පිළිබඳවත් විමර්ශනය කිරීම මේ අධ්‍යයනයේ අරමුණයි.

> *"යටත්විජිතවාදයේ අනර්ථකාරී බොරු ප්‍රචාරයන්ට විරුද්ධ ව ඉදිරිපත් කිරීමට යම් ඒකාබද්ධ සංකේතයන් සෙවීමට පමණක් ම යට ගියාව හාරා බැලීමෙන් අපි තෘප්තියට පත් නොවිය යුතු ය. අනාගතය ගොඩනැඟීම සඳහා ජනතාව සමඟ එක් වී ඒ අය වැඩ කරන, සටන් කරන රිද්මය ම අනුගමනය කරමින් දැනටමත් හොඳින් වැඩෙන බීජයන්ගෙන් පිරි භූමිය සකස් කිරීමට අප එළඹිය යුතු ය. ජාතික සංස්කෘතියක් ජනප්‍රවාද සමුදායක් නොවේ. ජනතාවගේ සැබෑ ස්වභාවය අනාවරණය කිරීමට ශක්තියක් ඇතැයි සලකන භාව සූචක මහජන ප්‍රිය වාදයක් ද නොවේ. එය වූ කලී ප්‍රතිෂ්ඨා රහිත ක්‍රියාවන් සමුදායකගේ නිෂ්ක්‍රීය මණ්ඩලවලින් වෙනත් වචනවලින් කියතොත් ජනතාවගේ සදාතනික යථාර්ථය හා බැඳීම ක්‍රමක්‍රමයෙන් අඩු වූ ක්‍රියාවන් ගෙන්, සමන්විත වූවක් නොවේ. ජාතික සංස්කෘතියක් වනාහී තම පැවැත්ම නිර්මාණය කිරීමටත් ඒ නිර්මාණය රැක ගෙන පවත්වාගෙන යාමටත් ජනතාවක් ගන්නා ක්‍රියාමාර්ග විස්තර කිරීමට, පැසසීමට ඒ ජනතාව*

---

[6] බාහිර කථිකාචාර්ය
බී.ඒ. ගෞරව (රුහුණ), එම්.ඒ. (කැලණිය), එම්.ෆිල් .(රුහුණ)

*චින්තන ක්ෂේත්‍රයෙහි ගන්නා සාමූහික ව්‍යායාම සමුදායකි. එ නිසා ඌන සංවර්ධිත රටක සංස්කෘතිය ජාතික විමුක්තිය සඳහා ඒ රට ගෙන යන අරගලයේ කේන්ද්‍රස්ථානයෙහි ම සිට ගත යුතුයි'' (ෆැනොන්.1961:165).*

සරච්චන්ද්‍රගේ නාට්‍ය හා සාහිත්‍ය කලා සම්ප්‍රදානයෙහි කූඨප්‍රාප්තිය සිදු වූ අවධිය ලෙස සැලකිය හැකි 1950 හා 60 දශකවල දී ඔහු යටත්විජිතහරණයට සහභාගී වීම ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා හෝ දේශපාලන ව්‍යාපාරයක් සමඟ ඓන්ද්‍රීය ව සම්බන්ධ ව කළ දෙයක් ද යන ප්‍රශ්නය මතු කළ හොත් දීමට ඇති පිළිතුර 'නැත' යන්නයි. ඔහු මේ අවධිය වන විට බොහෝ සෙයින් ලිබරල් මානවවාදී ලෝක දැක්මක හා හුදු සෞන්දර්යවාදයක නිමග්න ව සිටි බව පැහැදිලි වේ.

1958 දී සරච්චන්ද්‍ර විසින් පළ කරනු ලැබූ '*කල්පනා ලෝකයෙහි*' ඔහු කලාව පිළිබඳ දරන අදහස මෙබඳු ය.

*''කවියා තමා සඳහා ද තමා මෙන් දුක් විඳින හුදී ජනයා සඳහා ද මවන්නේ අපූරු ලෝකයකි. එහි මෙලොව මෙන් දුකක් නැත. නිති සැප දෙන ලොවකි ඒ (සරච්චන්ද්‍ර,1958.(1987):36).*

ඒ අනුව කලාවේ යෙදීම සමාජ ක්‍රියාවලියකට වඩා පෞද්ගලික කටයුත්තකි. එය රස විඳීම ද එවැන්නක් ම වේ.

කලාව මෙලෙස පුද්ගල පර්යායක සිර වනුයේ පෞද්ගලික දේපල ක්‍රමය බිහි වී කලාව ද පෞද්ගලිකත්වය පිළිබිඹු කිරීමට පටන් ගත් තැන සිට ය. නිර්මාණකරුවන් ද අන්‍ය සමාජයෙන් වෙන් ව තමා සතු යැපීම් මාර්ග මගින් සැප සේ යැපෙමින් කල්පනාවේ නිමග්න ව විවිධ සංඝටනාවන්හි යෙදෙති. එලෙස බිහි කරන කලාව ද විදග්ධ කලාවක් වන අතර එය රස විඳිය හැකි වන්නේ ද එවැනි ම සවිවේකී පිරිසකට ය. මේ නිර්මාණකරුවන් තමන් වෙත එළඹෙන කවර වුව පීඩාවක් හුදු මානසික ක්‍රියාවලියක දී මර්ධනය කොට එය ඉවසීමේ හා ඊට එරෙහි ව සටන් නො කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරති.

අනෙක් අතට සම්ප්‍රදාය විසින් දැඩි ව හික්මවන ලද තත්වයක් යටතේ වුව මෙවැනි කලාවන් බිහි නොවේ. පොදු සමාජ ක්‍රමයක් තුළ පුද්ගල පර්යායන් මැකී යන අතර පොදු අවශ්‍යතාව ප්‍රමුඛ වේ. යම් කවියෙකුට සාර්ථක කවියකු වීමට නම් සම්ප්‍රදායට අවනත වීම අවශ්‍ය විය. කාලිදාස හෝ කුමාරදාස වැනි සකු කවියෙකු අනෙකුත් පඬුවන්ගේ පැසසුමට ලක් වන්නේ සම්ප්‍රදාය තුළ ඔහු මනාව පිහිටීම තුළ ය. සම්ප්‍රදාය විසින් තීන්දු නොකරනු ලබන්නට, ඔහු දක්ෂ කවියෙක් නොවේ.

එහෙත් කාර්මික ධනවාදය හරහා අධිරාජ්‍යවාදී ව්‍යාපාර පුළුල් වීමත් සමඟ එතෙක් පැවති සියලු සම්ප්‍රදායන් බරපතල අර්බුදවලට පත් වන අතර ඇතැම් විට විනාශ වී යයි. ඇතැම් ඒවා වඩා අඳුරු ප්‍රදේශවල රිංගාගෙන නතර වන අතර ඇතැම් අංග යටත්විජිතකරුවාගේ සංස්කෘතික අංග සමඟ මිශ්‍ර වේ.

*''යටත්විජිත ආධිපත්‍යය යටතේ ජාතික සංස්කෘතියක් වූ කලී එහි පැවැත්ම පවා ප්‍රශ්නයකට භාජනය වූ ක්‍රමානුකූල ලෙසින් විනාශ කරනු ලැබීමේ තර්ජනයට ගොදුරු වූ සංස්කෘතියකි. ඉතා ඉක්මනින් එය රහසිගත පැවැත්මකට සීමා වූ සංස්කෘතියක් වෙයි. රහස්‍ය සංස්කෘතියක ආකල්පය ගැන යටත්විජිත ආධිපත්‍යයේ හැඟීම ඉතාමත් පැහැදිලි වන්නේ සම්ප්‍රදායට බැඳී සිටීම ජාතික ජීවයට විශ්වාසී ව සිටීමක් වශයෙන් ද විදේශ ආධිපත්‍යයට අවනත වීම එම ජාතික ජීවය ප්‍රතික්ෂේප කිරීමක් වශයෙන් ද සලකනු ලැබේ (ෆැනොන්,1961:168).*

යටත්විජිතකරණය හුදෙක් ආර්ථික ව්‍යුහය මත පමණක් බලපෑම් නො කරයි, ඇතැම් විටෙක යම් රටක සංස්කෘතීන් විනාශ කිරීමට හෝ ඒවා සමඟ සන්ධානගත වෙමින් ඒවා වෙනස් කිරීමට යටත්විජිතකරුවා ක්‍රියා කරයි (Amilcar Cabral.1973, 39-56). පූර්වසංස්කෘතික ස්වරූපයන් හා හර පද්ධති ක්‍රමානුකූල ව වෙනස් කිරීමට ලක් කරයි.

*''බ්‍රිතාන්‍යයන් විසින් සංවිධානය කරනු ලැබූ, පරිපාලනය කරනු ලැබූ අධ්‍යාපන ක්‍රමය ඉන්දියානුවන් අතර විද්‍යා හා කර්මාන්ත අභියෝගතාවයට අනුබල දීමට නොව අවහිර කිරීමට හැකි හැම දෙයක්ම කළ බවට ඉන්දීයාව පිළිබඳව අධ්‍යයනය කළ විද්‍යාර්ථීන් කිහිප දෙනෙකුම සාක්ෂි දරා ඇත, වේරා ඇන්ෂ්ටි (Vera Anstey) කියන පරිදි බ්‍රිතාන්‍යයන් ආරම්භ කළ අධ්‍යාපන ක්‍රමය විද්‍යානුකූල ගතිය හා විද්‍යා ඥානයේ පැතිරීම ඇති කිරීමට කොතෙක් දුරට ආධාර වී ඇත්දැයි විමසා බැලිය යුතු නොවේ ද? තමන් අවට ඇති ලෝකය ගැන අවබෝධයක් ඇති කොට ගැනීමට හා ස්වභාවික බලවේගයන් ඉතාම ප්‍රයෝජනවත් ලෙස උපයෝගී කරගනු ලබන්නේ හා පාලනය කරනු ලබන්නේ කෙසේ ද යන්නත් ජනයාට උගන්වනු වෙනුවට ඔවුනට උගන්වා ඇත්තේ දහසය හා දාහත් වන ශතවර්ෂයන්හි ඉංග්‍රීසින්ගේ කෘතීන් හා යල් පිනූ වාක්‍ය ඛණ්ඩ උදෙසා සටහන් ලිවීමත් විදේශ රටක අප්‍රකට පාලකයන්ගේ පෞද්ගලික ඉතිහාසය වනපොත් ලිවීමටත් නොවේ ද? (බරාන් පෝල් ඒ, 1975: 12)*

අධ්‍යාපනය මගින් කතෝලික ධර්මය ප්‍රචලිත කරනු ලැබීමත් එතෙක් පැවති සාහිත්‍ය හා කලා සම්ප්‍රදායන් වෙනුවට නව රුචිකත්වයන් හා රස කලාප පතුරුවා හැරීමත් කරන ලදි. පශ්චාත් යටත්විජිත රසඥතාව හා අවශ්‍යතා යටත්විජිතවාදයේ ම නිර්මාණයන් වේ. අධිරාජ්‍යවාදීන් සිය ආධිපත්‍යය මතවාදී තලය තුළ තහවුරු කර ගැනීමට අවශ්‍ය සාධක එමගින් සපුරා ගැනිණ (Said Edward,1978). දේශපාලන නිදහසින් පසු ව නව යටත්විජිතවාදය ලෙස සඳහන් කරනුයේ මේ ක්‍රියාවලිය ම වේ.

**ලංකාවේ සංස්කෘතික ඉතිහාසය**

ලංකාව සම්බන්ධයෙන් ගත්ත ද තත්වය එසේ ම ය. පූර්වයෙන් පැවති සම්ප්‍රදායන් යටත්විජිතකරණය නිසා බරපතල වෙනස්කම්වලට ලක් විය. ඔබේසේකර (1963 හා 1970), අමුණුගම (1985), කිත්සිරි මලල්ගොඩ (1976) හා නිහාල් පෙරේරා (1999) වැන්නන් පෙන්වා දෙන පරිදි බුද්ධාගම විවිධ අධිරාජ්‍යවාදීන් සමඟ අරගල කරමින් ඒ හා ගැටෙමින් ක්‍රියා කළ මුත් එහි මූලික ථෙරවාදී පිළිගැනීම් වෙනස් නොකොට ව්‍යවහාරික න්‍යාය බරපතල වෙනස්කම්වලට ලක් කර ගත් බව පැහැදිලි වේ. ඒ අනුව ක්‍රිස්තියානු ආභාසයෙන් පන්සල් දායක සභා, බෞද්ධ කොඩිය, භක්ති ගීත ගායනා, වෙසක් කාලයට වෙසක් කාඩ් යැවීම, ඉරිදා දහම් පාසල් බිහිවීම, සණ්ඨාර කුළුනු ආදිය නිර්මාණය වීම හා ඒවා භාවිතයට නැඹුරු වීම සිදු විය' ^Perera Nihal, 1999:126&.මෙහි දී පැරණි බුද්ධාගම ප්‍රොතෙස්තන්ත බුද්ධාගම බවට රූපාන්තරණය වූ බව ඔබේසේකරගේ මතයයි (Obeyesekera, Gananath,1970) ඒ අනුව ලංකාවේ දී සම්ප්‍රදායේ මූල බීජය ලෙස සැලකිය හැකි බුද්ධාගම හා විහාරය වෙනස් වූ ආකාරය පැහැදිලි වේ.

බුද්ධාගම යනු අන් කවර කලා සම්ප්‍රදායක් වුව වෙනස් කරමින් ලංකාව තුළ මහා සම්ප්‍රදාය බවට පත්ව තිබූ ප්‍රධාන බලවේගයයි. '*පෙදෙන් බුදු සිරිතැ බසින් වත් සිරිත් ඇ*' ලෙස නව පාඨයක් ඇතුළත් කිරිමට '*සියබස්ලකරකරු*' පෙළඹෙනුයේ එහෙයිනි. එහි සංස්කෘත ග්‍රන්ථය වූ *කාව්‍යාදර්ශයේ* එවැනි සීමා කිරීමක් නැත ද,'*රුවන් දීවිහි දනහට ඇවැසි සේ* කෘතිය පරිවර්ථනය කිරීමේ දී **සියබස්ලකර**කරු එම එකතු කිරීම ද කර ඇත (ඥානසීහ හිමි, හේන්පිට ගෙදර,1964).

*පැරණි සිංහල සාහිත්‍යයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ බුදුන්වහන්සේගේ ගුණ වර්ණනා කිරීමෙන් සැදැහැති සමාජයක් තුළ බුද්ධාලම්බන ප්‍රීතිය ඇති කිරීමයි. පැරැන්නන් කිවුවා සේ වැනුවා නම් බුදු ගුණ වැනුවාමයි, ඇත්ත වශයෙන් පැරණි සමාජවල මේ ආගමික අංශයේ බලපෑම සාහිත්‍ය කලාවන්ට පමණක් නොව ආර්ථික කටයුතු හා සාමාජීය කටයුතු කෙරෙහිත් පැවතිණ (අමුණුගම, සරත්,1977:256).*

මෙලෙස සම්ප්‍රදාය තීරණය කළ බුදු දහමේ මධ්‍යස්ථාන ද යටත් විජිත ක්‍රමය හරහා පරිවර්තනය විය. පසු කාලය වන විට එහි තිබූ තත්වය සොයා ගත නොහැකි තරමට ම වෙනස් වීමෙන් එය තහවුරු වේ.

මෙලෙස සම්ප්‍රදායන් නැති වී ක්ෂය වී යාමට කදීම නිදසුන් ලෙස මහනුවර යුගයේ චිත්‍ර සඳහන් කළ හැකි ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි මුල්ගිරිගල විහාරයේ ඇති චිත්‍ර අතර නව වෙළෙඳ සැලක් ද (විහාර සිතුවම්) ඇත. දඹුළු ලෙනේ මාර පරාජය නම් සිතුවමේ මාර සෙනඟ දැරූ ආයුධ අතර තුවක්කුව ද වේ.[1] අධ්‍යාපන ක්‍රමය ද යටත් විජිතකරුවන් විසින් ඔවුනට අභිමත ලෙස බිහි කරන ලදී.

> *''එංගලන්තයේ ඉහළ පංතිවල අයගේ ළමයින් සඳහා වූ ඊටන්, හැරෝ වැනි පාසල් ආදර්ශ කොට ගෙන මෙහි පාසල් පිහිටුවා ඒවාට ලංකාවේ පොහොසතුන්ගේ ළමයින් ඇතුළු කර ඉංග්‍රීසි ජාතික ගුරුවරුන් එංගලන්තයෙන් මෙහි ගෙන්වා ඒ ළමයින්ට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දුනි. මේ අධ්‍යාපනය හුදෙක් ඉංග්‍රීසි බස ඉගැන්වීමට සීමා වූවක් නොවී ය. ඔවුන් හැම වෙලේම ඉංග්‍රීසි කථා කළ යුතු ය. එය ද ඉංග්‍රීසින්ගේ උච්චාරණය අනුකරණය කරමින් ය. සිංහල කථා කරනු ඇසුනොත් ඔවුන්ට දඬුවම් කරනු ලබයි. ඔවුන් ඉගෙන ගත්තේ ඉංග්‍රීසින්ගේ සාහිත්‍ය හා එංගලන්තයේ ඉතිහාසය පමණි. සෑම දෙනම උදේ පල්ලියට ගොස් ඉංග්‍රීසියෙන් පවත්වන දේව මෙහෙයට සහභාගී විය යුතු ය. එක් අනිවාර්ය විෂයක් වශයෙන් ක්‍රිස්තියානි ආගම පන්තියෙහි උගන්වන ලදී (සරච්චන්ද්‍ර,1982:34-35).*

අරක්කු රේන්ද නඩත්තුව හා සුරා නිෂ්පාදනයත් ගම් දනව් සිසාරා තැබෑරුම් පිහිටුවීමත් මගින් පූර්වයෙන් පැවති ජන ජීවිතය වෙනස් කළ ආකාරය ද මෙහි දී සඳහන් කළ යුතු ය. නාගරික කම්කරුවනුත් ග්‍රාමීය ගොවි ජනතාවත් වතු හා ආකර කම්කරුවනුත් නිර්වින්දනය කළේත් ඔහුට දිවි පෙවෙත රැක ගැනීමට තිබූ මුදල සොරකම් කරලනු ලැබුවේත් අරක්කු වෙළෙඳාම හරහා ය. ලාංකේය දේශීය ධනපති පන්තියේ ප්‍රධාන ආර්ථික මූලාශ්‍රයක් වූයේ අරක්කු වෙළෙඳාම බව කුමාරි ජයවර්ධනගේ අධ්‍යයනවලින් හෙළි වී ඇත. (ජයවර්ධන,කුමාරි.2006: 6-7 පරිච්ඡේද).

මේ ආකාරයට පූර්වයෙන් පැවති සම්ප්‍රදායන්ගෙන් බැඳුණු මිනිස් සබඳතා වෙනස් කරන ලදි.

> *''පැරණි සමාජයේ පැවති උනුන් මත රඳා පැවතීමේ හා බන්ධනයේ සම්බන්ධතා පුපුරුවා හරිනු ලැබීම නිසා පුද්ගලයාගේ නිදහස් වීමට තතු මතු වීම මේ පෞද්ගලිකත්වය ප්‍රකාශ කිරීම් වස් පැරණි සාහිත්‍ය විධි පරිහරණය කිරීමේ ප්‍රයත්න ජනිත කළේ ය.*
>
> *විචාරකයන්ගේ අවධානයට ඇති තරම් යොමු වී නැති මාතර සාහිත්‍යයේ දී පුද්ගල නිදහස ඉල්ලා සිටීම ප්‍රකාශයට පත් කිරීම ද සමාජ සබඳතා ඒ පදනම මත හැඩ ගැස්වීමට දරන තැත ද පළමු වරට දැක ගත හැකි වෙයි. ස්ත්‍රිය හා පුරුෂයා අතර පැවති පැරණි සබඳතාවන් පෙරළියට ලක් වීමත් අලුත් සබඳතාවන් පැතීමත් ගජමන් නෝනාගේ කවි යනුවෙන් ප්‍රචලිත නිබන්ධවල ද වෙනත් රචනාවල ද ප්‍රමුඛ ව දිස් වෙයි (ගම්ලත්, සුචරිත,1995:140).*

මේ ක්‍රියාවලිය කූඨප්‍රාප්ත ව 1948 දී දේශපාලන නිදහස ලැබෙන විට ලංකාව තුළ දක්නට ලැබෙනුයේ අධිරාජ්‍යවාදයේ ග්‍රහණයෙන් සපුරා වෙනස් ස්වරූපයක් ගත් සංස්කෘතියකි. සරච්චන්ද්‍රගේ සාහිත්‍ය කලා සම්ප්‍රදානය ක්‍රියාත්මක වනුයේ ඉහත කී පූර්ව සම්ප්‍රදායන් විනාශ වී ගිය පෞද්ගලිකත්වය ප්‍රමුඛ වූ පාලක පන්ති ව්‍යුහයක් (ධනවාදී) සහිත කාල අවකාශයක ය. එහෙයින් සරච්චන්ද්‍ර විසින් කල්පනා ලෝකවල සැරිසැරීම හා ඒවා මැවීම කලාකරුවාගේ කාර්යභාරය ලෙස පවසනු ලැබීමට පසුබිමක් පවතී. ඔහුට ද එම දැනුම ලැබෙනුයේ යුරෝපීය විදග්ධ සාහිත්‍ය මගින් මෙරටට හඳුන්වා දෙනු ලැබූ අධ්‍යාපනය හරහා ය. පැරණි භාරතීය සමාජයේ විසූ සුඛෝපභෝගී විදග්ධ පන්තිය විසින් නිර්මාණය කරනු ලැබූ රසවාදී සිද්ධාන්ත ද ඔහු මෙහි දී සිය සහයට කැඳවා ගනියි. සම්ප්‍රදාය විසින් පුද්ගල පර්යාය පාලනය කළ ද මේ භාරතීය කලාවේ මුඛ්‍ය අරමුණ වූයේ රසය, චමත්කාරය දැනවීමයි. කලාවේ ප්‍රධාන අරමුණ ලෙස මේ සෞන්දර්යවාදී අරමුණු ඔවුන් විසින් අධි නිශ්චය කරනු ලැබ තිබිණි.

දෙවනු ව සරච්චන්ද්‍රගේ සාහිත්‍ය කලා න්‍යායේ පෙනෙන පරස්පර විරෝධී ලක්ෂණය නම් දේශීය සම්ප්‍රදායන් සෙවීමේ නිමග්න වෙමින් ම සාර්වත්‍රික සාර්ව භෞමික අගයන් මතු කරන ආකාරයේ කලාවක් හා විචාරයක් හඳුන්වා දීමට යාමයි. එය ඉතා ම පරස්පරතාවන් මතු කරන බව පෙනෙයි. ඔහුගේ '*සිංහල නව කථා ඉතිහාසය*' කෘතියේ කලාව නිර්ණය කිරීම සඳහා ජාතික වූ හෝ දේශීය නිර්ණායක හා ඇගයීම් ක්‍රම නැති අතර ලෝකයට ම ඇත්තේ එක ඇගයීම් ක්‍රමයක් බව පවසයි.

> *''මේ සිද්ධාන්ත මුල දී කවර සභ්‍යත්වයක කවර සාහිත්‍යයකින් හට ගත් ඒවා වුව ද දැන් නම් ඒවා සාර්වත්‍රික තත්වයට පැමිණෙන බව නිසැක ය. මුළු ලොව සියලු ම උගතුන්ගේ රුචිය හැඩ ගැසෙන්නේ මේ සිද්ධාන්තවලට අනුකූලව ය. විශ්ව සාහිත්‍යයේ මිම්මය මෙකල සාර්වත්‍රික වශයෙන් පිළිගනු ලබන්නේ... එහෙයින් කවර බසකින් වුව ද මෙකල නිර්මාණය කරන ලද සාහිත්‍ය මිනිය යුත්තේ දේශීය මට්ටමකින් නොව විශ්ව සම්මත සාර්වත්‍රික මිම්මකිනි. දැන් සාහිත්‍ය කෙරෙහි බලපාන්නේ බටහිර වසයෙන් වත් දේශීය හෝ විදේශීය වසයෙන් වත් බෙදිය නොහැකි විදියේ විශ්ව සාධාරණ රුචිකත්වයකි (සරච්චන්ද්‍ර,1951 (1997):5).*

රුචිකත්වය සමාන වීම යනු මිනිසුන් සියලු දෙනා සමාන තත්වයකට පත් වීමකි. එහි ලිංගමය පංතිමය, ජාතිමය බෙදීම් තිබිය නොහැකිය. මේ සාර්වත්‍රික සාර්වභෞමික සර්වකාලීන විශ්ව සත්‍යයක් ඇති බවත් ඒවා සාහිත්‍ය මගින් ප්‍රකාශයට පත් කළ යුතු බවත් පිළිගත් සාහිත්‍ය හා සාහිත්‍ය විචාර ව්‍යාපාරය පොදුවේ නිදහස් මානවවාදය ලෙස හඳුන්වයි. 1840 කාලයේ බ්‍රිතාන්‍යයේ ඇරඹි, අප ජීවත්වන අවධියේ අදහස් හා පුරුදුවලින් අප මුදවා සර්වකාලීන සාර්වත්‍රික වූ චිරාස්ථායි භාවයක රැඳවීමට සාහිත්‍යයට හැකිය. යන අදහස ඇතිව නිදහස් මානවවාදය ක්‍රියාත්මක විය. **අයි. ඒ.රිචඩ්ස්**ගේ භාවිත විචාරය නොහොත් පඨිතය එය තුළ ම කියවීමේ ක්‍රමවේදයත්, සාහිත්‍ය කෘතිය හරහා සමාජ ප්‍රශ්න හා ජීවිත ගැටලු සාකච්චා කිරීම කළ යුතුය යන අදහස සහිත ව විචාරයේ යෙදුනු **පිලිප්ස් සිඩනි, වර්ඩ්ස් වර්ත්**හා **හෙන්රි ජේම්ස්** ආදීන්ගේ අදහස්වල එකතුවෙන් මානවවාදී අදහස් බිහි විය (Barry Peter:1995). මානවවාදයට අනුව මනුෂ්‍යත්වය පිළිබඳ නිශ්චිත ලක්ෂණ සම්භාරයක් ලොවට ම පොදු යයි විශ්වාස කරන අතර එය සියලු දෙනාට ඒත්තු ගැන්වීමේ යෙදෙයි.[2] මේ විශ්ව සාධාරණ මිනිස් ගුණදහම් බොහොමයක් එලිසබතියානු බ්‍රිතාන්‍ය මධ්‍යම පන්තියේ ඇගයීම් මත පදනම් ව ඇත. ග්‍රාම්ස්චි 'ව්‍යවහාර ඥානය' පිළිබඳ විග්‍රහ කරද්දී මධ්‍යම පන්තිය සිය අදහස් සාමාන්‍ය දැනුම බවට පත් කොට එමගින් සිය අණසක පතුරුවාගන්නා ආකාරය පැහැදිලි කරයි. සියලු මිනිසුන් සමානය, යන මිත්‍යාව සාමාන්‍ය දෙයක්, ස්වාභාවික දෙයක් බවට පත් කොට එම දෘෂ්ටිවාදයේ මුවාවෙන් වරප්‍රසාදිත පිරිස රක්ෂා වීම සිදු වේ. මෙවැනි මතවාද අධිපතිධාරී පාලක පීඩක පන්ති විසින් නිෂ්පාදනය කොට සමාජ ගත කරනු ලබයි. ඒවායේ විෂය වස්තු බවට පත් වන ජනයා මේ දෘෂ්ටිවාදවල එල්බ සිටිති (Gramsci Antonio:1971). මෙලෙස අධිරාජ්‍යවාදය විසින් සිය අධ්‍යාපනය හරහා ලබා දෙනු ලැබූ ඇගයීම් සරච්චන්ද්‍ර විසින් පිළිගනු ලබන අතර ම ඒවා සමාජ භාවිතයට යෙදවීමේ ද නිමග්න වෙයි.

ඔහුගේ නාට්‍ය නිර්මාණවල ද මෙම සාර්වත්‍රික සර්වකාලීන මානව සත්‍ය පිළිබිඹු කිරීමට දැරූ උත්සාහය දක්නට වේ. සම්ප්‍රදායික ජන කතාවේ එන *මනමේ* කුමරියගේ පති ද්‍රෝහී බව ඉවත් කොට *මනමේ* නාටකය නිෂ්පාදනය කරනුයේ එම මිනිස් සත්‍ය පැවසීමටය. පති ද්‍රෝහීත්වය ඉන්දු උප මහද්වීපික කලාපයේ ඇති දූෂ්‍ය ධර්මතාවකි. එවැන්නකි සමාජ ධර්මතාවක් ව ඇත්තේ එවැනි මිනිස් භාවිතයන් බහුල වූ නිසා විය යුතු ය. එමෙන් ම නාට්‍යයේ අන්තර්ගත අර්ථය අවිනිශ්චිත කරනුයේ ද ඒ අර්ථයෙනි. බොහෝ පශ්චාත් යටත්විජිත රටවල නිර්මාණකරුවන් සිය පැරණි සම්ප්‍රදාය හා නව පිළිගැනීම් සමඟ ගනුදෙනු කිරීමේ දී බෙහෙවින් පරස්පරතා හා ප්‍රතිවිරෝධතා ඇති වූ අවස්ථාව කාන්තාව හා අන්‍ය සුළු ජාතීන් සම්බන්ධ කරුණු සිය කෘතිවලින් සාකච්ඡා කිරීමේදීය. සම්ප්‍රදාය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කාන්තාවන් සම්බන්ධයෙන් බිහිවන අර්ථය බොහෝ විට ඉතා ප්‍රතිගාමී වේ. එය සමාජ පැවැත්ම ද දෙදරවා දමමින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ගැටුම් සහිත තත්වයකට පත් කිරීමට හේතු වේ. එහෙයින් සම්ප්‍රදාය පිළිබඳ නොතකා සමකාලීන

තත්වය සමඟ ගනුදෙනු කිරීමට එහි දී කලාකරුවාට සිදු වේ (Ashcroft, B., Griffiths, G., & Tiffin, H,2013).

යටත්විජිතවල පූර්වයටත්විජිත සමයේ පැවති සම්ප්‍රදායන් පශ්චාත් යටත්විජිත අවධියේ දී දැඩි අර්බුදකාරී තත්වයන්ට මුහුණ දෙයි. පැරණි භාවිතයන් අශිෂ්ට නොදියුණු ගෝත්‍රික සිරිත් ලෙස අධිරාජ්‍යවාදීන් විසින් හංවඩු ගසනු ලබන අතර ඒවා දුරලා යටත් වැසියාගේ සංස්කෘතිය ශිෂ්ට කළෝ තමන් යැයි ඔවුහු පවසති.

> *''අධිරාජ්‍යවාදියා හෝ ජනපදිකයා ඉතිහාසයක් ගොඩ නගයි. ඔහුගේ ජීවිතය විශිෂ්ට අවධියකි. දේශාටකයකි. ඔහු තමයි ඒකාන්ත මූලාරම්භය. අපි තමයි මේ රටේ නිර්මාතෘවරු. එහි පැවැත්මට එකම හේතුව අපියි. අපි ගියොත් මේ සියල්ල විනාශ වේ. මේ රට යළිත් මධ්‍යතන යුගයේ අන්ධකාරය තුළ ගිලා බසිනු ඇත(ෆැනොන්,1961:15).*

මේ ආකාරයට ජනපදිකයා හෝ අධිරාජ්‍යවාදියා පවසන විට ඊට පිළිතුරු වශයෙන් සිය සංස්කෘතිය වෙනස් කර ගැනීමට ස්වදේශිකයා පෙළඹේ. සංස්කෘතියේ මහා සම්ප්‍රදායට උරුමකම් කියන ඉන්දියාවේ වුව පැරණි සිරිත් බටහිර දෘෂ්ටියකින් නවීකරණය කරන ලදී.

> *''බටහිර ජාතීන්ගේ හේතු සහගත අවඥාවට භාජනය වූ සමහර ලක්ෂණ හින්දු සංස්කෘතියෙහි තිබුණි. එකක් නම් ශුද්‍රයන් සමාජයෙන් පිටුවහල් කරන කුලවාදයය. තවත් එකක් නම් ස්වාමියා මිය ගිය විට භාර්යාව ගින්නට පැන දිවිනසා ගත යුතු යයි සම්මත වූ චාරිත්‍රයයි. (මීට ඉංග්‍රීසියෙන් 'සතී' යයි කියනු ලැබේ) බුද්ධිමත් හින්දුවරු මේ චාරිත්‍රය ගැන ලැජ්ජා වූහ, ඉංග්‍රීසීන් විසින් එල්ල කරන ලද විවේචනවලට පිළිතුරු සැපයීමට ඔවුන්ට නොහැකි විය. එබැවින් රාම් මෝහන් රෝයි ප්‍රමුඛ වූ හින්දු බුද්ධිමත්හු කීපදෙනෙක් එකතු වී හින්දු සංස්කෘතියෙහි සාරධර්ම කවරේදැයි විමසන්නට වූහ, මේ සඳහා ඔවුහු බ්‍රහ්මෝ සමාජ නම් සංවිධානය පිහිට වූහ'' (සරච්චන්ද්‍ර, 1982:39-40).*

ලංකාවේ ද අධිරාජ්‍යවාදීන්ගේ පාලන කාලය තුළ පවා මුල් යුගයේ සිටි රදළ පිරිස් සමඟ ඔහුගේ යටත් වැසියන් පැවැත් වූ සම්බන්ධය පීඩක පීඩිත සම්බන්ධයක් ලෙස පසුව අර්ථ කථනය කෙරුණ ද අදාළ සන්දර්භය තුළ එය එවැනි ලක්ෂණවලින් ම යුක්ත නොවූ බව පැහැදිලි විය. උදාහරණ ලෙස ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් ව පැවති අවධියේ ජීවත් වූ එක් දිසාවේ කෙනෙකු වෙත සිය යටත් ප්‍රදේශයේ තරුණියක වැඩිවිය පැමිණි පසු ගෙනත් භාරදීමේ චාරිත්‍රයක් විය. මෙය 'රැකුලෙ පැදීම' නමැති යෙදුමෙන් නම් කොට තිබුණි. මෙය වර්තමානයේ නම් ඉතාම සාපරාධී කටයුත්තකි. ඉතාම ළාබාල තරුණියක මහලු ගම් දෙටුවෙකුට දූෂණය කිරීමට දීමකි. මෑත කාලීන උගතුන් කවුරුන් වුව එය හෙළා දකියි. එහෙත් එම සිද්ධිවලට ලක් වූ සන්දර්භයේ විසූ වැඩිහිටියන් පවසනුයේ එය චාරිත්‍රයක් බවයි. අදාළ තරුණියගේ වැඩිහිටියන් ද එම තරුණිය ද එම චාරිත්‍රය ඉටු කරනුයේ කැමැත්තෙනි. දිසාවේ ද එම තරුණිය තමාට ලබා දෙන ලෙස අණ පැනවීම් තර්ජන නොකරයි. එය චාරිත්‍රයක් බවට පත් කොට ගෙන ඇත්තේ දිසාවේගේ අණසක පවත්වාගෙන යාම අරමුණු කොට ගෙන ය. කන්‍යාභාවය ආදී එලිසබතියානු සදාචාර ධර්ම මෙරටට පැමිණීමෙන් පසුව මේ චාරිත්‍රය තිරශ්චීන එකක් බවට අර්ථකථනය විය. මේ දිසාවේ පිළිබඳ මා කළ අධ්‍යානයෙන් පැහැදිලි වූයේ යුරෝපීය රදළයන්ගේ ලක්ෂණ සාහිත්‍ය කෘතිවලින් දැන හැඳින ගෙන ඒවා අනුව මේ දිසාවේගේ චර්යාව ද අර්ථකථනය කිරීමට දේශීය බුද්ධිමතුන් ක්‍රියා කොට ඇති බවයි.[3] අද අපට හමුවන දිසාවේ චරිත කථාව ප්‍රාචිනවාදී නිර්මිතයකි. බටහිරට අනුව රචනා කරන ලද්දකි. බටහිර චිත්‍රපට අධ්‍යක්ෂකවරුන් විසින් නිර්මිත බොහෝ ප්‍රමාණයක් චිත්‍රපටවලින් ද මෙලෙස පෙරදිග ලෝකය නොදියුණු තිරශ්චීන පැවතුම්වලින් යුතු ගෝත්‍රික සමාජ බවට පත් කිරීම සිදු කරයි[4] (පෙරේරා, රංජිත්,1995:33-40).

මෙම යුරෝපා සංස්කෘතියේ ආනුභාවයෙන් දේශීය සංස්කෘතියකට මැදිහත් වීමේ දී විශ්ව සංස්කෘතියක් යන අදහස නැතහොත් සියලු මිනිසුන් සමාන ය යන අදහස පිළිගන්නා අතර එම අදහස පතුරුවා හරියි.

සරච්චන්ද්‍ර *'මනමේ'* නමැති සාම්ප්‍රදායික ජාතක කථාව හා ජන කථාව සිය ආඛ්‍යානය ලෙස ගත්ත ද එහි ආකෘතිය පමණක් නොව අන්තර්ගතයේ ද ප්‍රාචීනවාදී වෙනස්කම් කිහිපයක් කරනුයේ එහෙයිනි.

දේශීය බුද්ධිමතුන් මානවවාදී එළඹුම්වලට පැමිණීම පිළිබඳ ව ෆැනොන් මෙසේ සඳහන් කරයි.

> *''...සමහර ස්වදේශීකයන් මෙසේ පවසනවා ඇසීමත් එවිට සාමාන්‍ය අත්දැකීම්විය හැකිය, මා සෙනගාල් ජාතිකයෙක් මෙන්ම ප්‍රංශ ජාතිකයෙක් වශයෙන් ද කථා කරමි, මම ඇල්ජීරියානු ජාතිකයෙක් මෙන් ම ප්‍රංශ ජාතිකයෙක් වශයෙන් ද කථා කරමි, අරාබි මෙන්ම ප්‍රංශ යැයි කියා ගන්නා එසේ නැතහොත් නයිජීරියානු මෙන් ම ඉංග්‍රීසි යයි කියා ගන්නා බුද්ධිමතාට ජාතිකත්ව දෙකක් ගැනීමේ ප්‍රශ්නයට යම් දිනක මුහුණ දීමට සිදු වෙයි, එවිට තමාටම අවංක ව සිටීමට නම් මේ නිර්ණයන් දෙකෙන් එකක් තෝරා ගැනීමට ඔවුන්ට ශක්තිය හෝ අධිෂ්ඨානය නැත. එවැනි බුද්ධිමත්හු ඔවුන්ගේ හැඩ ගැසීමට හේතු වූ හැම ඓතිහාසික සාධකයක් ම එක් රැස් කරමින් 'විශ්ව සාධාරණ දෘෂ්ටිකෝණයක් තම නිජ භූමිය කර ගනිති (ෆැනොන්.1961:152).*

අරාබි සහ අප්‍රිකානු මහාද්වීපවල මානවවාදී බුද්ධිමතුන් බිහි වූ ආකාරය ෆැනොන් පැහැදිලි කරයි. එකී සාධකය මෙන් ම යුරෝපීය ඥාන මීමාංසාව විසින් හික්මවන ලද අධ්‍යාපනය හරහා සරච්චන්ද්‍ර වැන්නන් මානවවාදය කරා එළඹීම ද මීට සමාන රූපාකාරයක් උසුළයි. එය එසේ වීමේ දොසක් නැත. එහෙත් ස්වදේශීකත්වය හා ඒ මානවවාදී පිළිගැනීම් අතර පරස්පරයක් විනා සමවායක් නැත. තාගෝර්ගේ කලා ව්‍යාපාරය පුරා වැතිර පැවතියේ සාර්ව භෞමිකත්වයයි. ඔහුගේ 'ගෝරා' හා 'ගරේ බයිරේ' කෘති මැනවින් කියවුවහොත් ඒ සාර්වභෞමික දෘෂ්ටිය හඳුනා ගත හැකි ය. එවැනි පැහැදිලි න්‍යායයික පදනමක පිහිටන්නට සරච්චන්ද්‍ර වැනි ලාංකික පශ්චාත් යටත්විජිත සංස්කෘතික නිර්මාණකරුවන්ට නොහැකි විය.

යුරෝපීය අධ්‍යාපන ක්‍රමය මඟින් නිර්මාණය කළ විශ්වවිද්‍යාල පද්ධතිය මගින් නඩත්තු කළ මානසික ශ්‍රමිකයකු නැතහොත් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු වූ සරච්චන්ද්‍ර යම් වරප්‍රසාදීත සවිවේකී ජීවිතයකට උරුමකම් කියන්නෙකු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු මානවවාදීයකු මෙන් ම දේශීය සංස්කෘතියක් නිෂ්පාදනය කරන්නකු ද වේ. මානවවාදය නිසා ඔහුගේ කලාවට මැදිහත් වීම නමැති කාර්ය හුදු සෞන්දර්යවාදයක සිර වෙයි. වින්දනය, රසය දැනවීම,විශ්ව සත්‍ය ප්‍රකාශ කිරිම කලාවේ අරමුණ ලෙස දකී[5] (සරච්චන්ද්‍ර,1962).යටත් විජිතහරණය සඳහා ඓන්ද්‍රීය අවශ්‍යතාවක් ඔහුට නොවූ බව පෙනේ. එහෙත් ඉන්දියානු නිදහස් සටන පිළිබඳ භාවාතිශය ලෙස ඔද වැඩී ගිය මනසක් ඔහුට තිබූ බව පෙනෙයි. ගාන්ධි තොප්පිය පැළඳීම නිසා සිවිල් සේවයට ඇතුළත් වීමට නොහැකි වීම, සංගීතය ඉගෙනීම සඳහා ශාන්ති නිකේතනයට යාම වැනි කරුණුවලින් එය පැහැදිලි වේ(සරච්චන්ද්‍ර,1985). එහෙත් *මනමේ* වැනි නාට්‍යයක් නිෂ්පාදනය වීමට ආසන්නතම හේතුව වූයේ විශ්වවිද්‍යාල නාට්‍ය සංගමයේ උද්යෝගයත් ජුබාල් නමැති විදේශීය නාට්‍යකරුවා විසින් රාජ්‍ය අනුග්‍රහය සහිත ව ලංකාව සඳහා සුභාවිත නාට්‍ය කලාවක් තැනීමට උත්සාහ කරනු ලැබීමත් ඊට සම්බන්ධ වී සරච්චන්ද්‍ර ඔහුගේ අවඥාවට ලක් වීම හා ඔහු සමඟ විරුද්ධභාවයක් ගොඩනඟා ගැනීමත්ය. *මනමේ* නිර්මාණය කළ යුතුය යන අදහසේද සරච්චන්ද්‍ර ඍජුව පිහිටා නොසිටිය බව පෙනෙයි, ''*මේ දෙදෙනා ලැබුණු නමුත් වැදි රජුගේ භූමිකාවට සුදුසු කෙනෙකු සොයා ගත නොහැකි විය. සුදුස්සෙකු නැත්නම් මා නිෂ්පාදනය අත්හරින බව නාට්‍ය මණ්ඩලයේ නිලධාරින්ට කීවෙමි ''(සරච්චන්ද්‍ර,1985(1997),158).* යන ප්‍රකාශනයෙන් එය  ගම්‍ය වේ.

එමෙන් ම දේශීය සංස්කෘතියක අවශ්‍යතාව පිළිබඳ ව සරච්චන්ද්‍ර තුළ විශාල න්‍යායයික අවදි වීමක් ද නොවූ බව පෙනේ. ඔහු 1962 දී ඉන්දියාවේ මධුරාසියේ පළ වූ සාම්ප්‍රදායික සංස්කෘති පිළිබඳ ආයතනයේ ප්‍රකාශනයට ලියූ ''*ලංකාවේ සංස්කෘතික පුනර්ජීවනය පිළිබඳ ඇතැම් ප්‍රශ්න*'' නමැති ලිපියේ කලා නිර්මාණවල අවශ්‍යතාව සමකාලීන සමාජයට දැනුණ ආකාරය විග්‍රහ කරයි.

> *''අලුතින් ලබා ගත් නිදහසත් නව ජාතිකත්වයත් නිසා අඩු ගණනේ සංවිධානාත්මක අරමුණු උදෙසා හෝ ජාතිය නිරූපණය කරන උත්සව විධි හා වෙනත් සංකේත බිහි කළ යුතු විය. රාජකීය උත්සවවලදීත් වෙනත් එවැනි අවස්ථාවලදීත් මෙවැනි උත්සව විධි හා සංකේත භාවිත*

*කළ යුතු වෙයි. මේ අනුව දේශපාලකයන්ට ද ප්‍රායෝගික කරුණු අරභයා සංස්කෘතියේ අවශ්‍යතාවය දැනිණ. (සරච්චන්ද්‍ර,1993:19).*

මෙලෙස ලංකාව තුළ යටත්විජිතකරුවා සමඟ සටන් කරමින් එම සටන සමඟ ජෛන්ද්‍රීය ලෙස සම්බන්ධ වූ ස්වදේශීය සංස්කෘතියක් නිර්මාණය කළ හැකි පරිසරයක් නොවිය. බොහෝ විට හුදු සංස්කෘතික ස්වරූප ගත් ව්‍යාපාර පමණක් අධිරාජ්‍යවාදය විසින් උරුම කර දෙනු ලැබූ ඇතැම් පුරුදු හා ජීවන ප්‍රතිපදාවන්ට එරෙහි ව හඬ නගන ලදී. **පියදාස සිරිසේන**ගේ නව කතා කියවූ විට ඒවායින් බටහිර සිරිත් ගත් ස්වදේශිකයන් විනා අධිරාජ්‍යවාදය සමඟ අරගලයකට එළඹ නැත. සිරිසේනගේ කෘතිවල ලංකාවේ මධ්‍යම පාන්තික ජනයා යුරෝපීය අනුකාරකයන් වීමට එරෙහි හඬක් පවතියි. *ජයතිස්ස හා රොසලින්* කෘතිය මීට කදිම නිදසුනක් සපයයි. ජයතිස්ස රොසලින්ගේ පවුලේ සංස්කෘතික ලක්ෂණවලට විකල්ප ව පැරණි සිංහල යයි සම්මත සංස්කෘතික අංග ඉදිරිපත් කරයි. **ආනන්ද රාජකරුණා** වැනි කවින් දේශානුරාගී කවි ලියන අතර එලිසබත් අධිරාජිණිය ගැනත් බ්‍රිතාන්‍ය කිරීටය ගැනත් වර්ණනාත්මක ව කාව්‍ය ප්‍රබන්ධ කරයි.(ආනන්ද සම්ප්‍රවේදීතය) ඔවුනට අධිරාජ්‍යවාදීන් සමඟ නොව නොපෑහීම් පැවතියේ ස්වදේශීය නව කොම්ප්‍රදෝරු පන්තිය[6] සමඟ ය. සංස්කෘතික තලයේ දී අධිරාජ්‍යවාදීන් සමඟ සෘජු අරගලයක් ඇතිවීමට හේතු වූ දේශපාලන හෝ සන්නද්ධ අරගලයක් ස්වදේශිකයන් විසින් අධිරාජ්‍යවාදීන්ට එරෙහිව දියත් නොකරන ලදි. 1818 හා 1848 කැරලි පාවාදී පරාජය වීමෙන් පසුව ලංකා සමාජය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි වීමට වඩා දක්නට හැක්කේ අවනත වීමකි (පුඤ්ඤරතන හිමි හාන්දුපැල්පොල:1941). **අමද්‍යප ව්‍යාපාරය** හා **මහාබෝධි සමාගම** හරහා බෞද්ධ පුනරුද ව්‍යාපාරයක් දියත් කරන **අනගාරික ධර්මපාල**ගේ ක්‍රියාකාරිත්වය ද හුදු සංස්කෘතික ක්‍රියාමාර්ගවලට පමණක් සීමා වේ (Amunugama, S.1985). **ඕල්කට්** විසින් සංවිධානය කරනු ලැබූ බෞද්ධ අධ්‍යාපන ව්‍යාපාර ආදිය ද වඩා මිශ්‍ර වූ සංස්කෘතියක් තැනීමට විනා අරගලයකට නොපොළඹවයි. බෞද්ධ ආගම මුල් කොට ක්‍රියාත්මක වූ ජාතික පුනරුද ව්‍යාපාරය කුලවාදී අගතීන්වලින් යුක්ත වුවක් විය. ගොවිගම කුලයේ ආධිපත්‍යයට යට ව තිබූ බෞද්ධ විහාර හා භික්ෂු සමාජය ඉන් මුදවා ගැනීම 1880 කාලයේ සිට ම සංඝ සමාජයට තිබූ අභියෝගය කි.^Malalgoda Ktitsiri,1976& සාම්ප්‍රදායික සමාජ සංස්ථා විසින් අධිරාජ්‍යවාදයට එරෙහිව ගෙන ගිය සටන් ඉතාම බෙදී ගිය හා වෙනත් සැඟවුණු අරමුණු සහිත ඒවා වීම නිසා සාර්ථක නොවීය.

**ජාතික ව්‍යාපාරයේ උභතෝකෝටිකය**

අධිරාජ්‍යවාදයට යම් තරමක හෝ ප්‍රතිවිරෝධයක් තදින් එල්ල කරනු ලැබුයේ ලංකා සමසමාජ පක්ෂය ප්‍රමුඛ වාමාංශික ව්‍යාපාරයයි. ලංකා සමසමාජ පක්ෂය ලෙස පසුව සංවිධානය වූ තරුණ සම්මේලනය මෙහෙය වූ **සූරිය මල් ව්‍යාපාරය** හා **මැලේරියා මර්දන ව්‍යාපාරය** ඉන් කිහිපයකි. සමසමාජ පක්ෂය ජාතික නිදහස සහ සමාජවාදය යන ප්‍රධාන අරමුණු දෙක උදෙසා සටන් කරන ලදි. ඔවුහු පොදුවේ පීඩිත ජන කොටස් නියෝජනය කළ අතර සම්භාව්‍ය මාක්ස්වාදයට අනුව අදස්ථ ව්‍යුහය නිදහස්කර ගැනීම හා ආර්ථිකය සමාජවාදී කිරීම හරහා සංස්කෘතිය ස්වයංක්‍රිය ව නිර්මාණය වේ යන අදහසින් ක්‍රියා කළහ. එහෙත් **සමසමාජ පක්ෂය** ද සම්ප්‍රදායික කුල බෙදීම ආදිය සමඟ යම් ගනු දෙනුවක් කරන ලදි.

යටත්විජිත සමයේ අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය, නිදහස උදුරා ගැනීම හා ඒ වටා රටේ ජනතාව සංවිධානය කිරීමට අපොහොසත් විය. එහෙත් ඉන්දියාව නිදහස් අරගලය සක්‍රීය ලෙස ක්‍රියාවේ යොදවන ලදි. ඉන්දියානු නිදහස් අරගලයේ උණුසුම පමණක් ලංකාවට දැනුණි. එහෙත් එම අරගලවල අතුරු ඵලයක් ලෙස ලංකාවට ද නිදහස ලැබුණි. ඒ පිළිබඳ සරච්චන්ද්‍ර මෙසේ සඳහන් කරයි.

*"ලක්දිවට නිදහස ලැබුණු ක්‍රමය ගැන කල්පනා කර බලන විට සංස්කෘතිය නිර්මාණය කිරීමට ගත් උත්සාහය අසාර්ථක වීමට හේතු තේරුම් ගැනීම උගහට නොවේ. එක් අතකින් බලන*

*විට ලාංකිකයන් ලත් නිදහස ඉන්දියානුන් ලත් නිදහසෙහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකි ය. ඉන්දියාවේ සිදු වූවාක් මෙන් බ්‍රිතාන්‍ය විරෝධී බලසම්පන්න ජාතිවාදී ව්‍යාපාරයකින් තොරව හුදෙක් සාකච්ඡා මාර්ගයෙන් ආණ්ඩු බලය බ්‍රිතාන්‍ය අතින් ලාංකික ඉහළ පන්තිය අතට මාරු විය. තක්කාලීන සාහිත්‍යයෙහි පැහැදිලි ලෙස සඳහන් වන පරිදි මේ ශත වර්ෂයේ මුල් අවුරුදුවල සිට ම මෙරට එක්තරා අන්දමක ජාතික ව්‍යාපාරයක් තිබුණත් මෙය බොහෝ දුරට සංස්කෘතික ප්‍රශ්නවලට සීමා වූවක් විය. එය බ්‍රිතාන්‍යයන්ගෙන් විමුක්තිය ලැබීමේ ජාතික ව්‍යාපාරයක් බවට වර්ධනය නොවිණි. මේ ව්‍යාපාරය සිංහල උගත් මැද පන්තියට (වැඩි වශයෙන් ම පහළ මැද පන්තියට) පමණක් සීමා වූයෙන් පසුව රටෙහි පාලකයන් බවට පත් වූ පන්තිය අතරට නො පැමිණියේ ය. මෙයට එක් හේතුවක් වූයේ ඉහළ පන්තිය ජාතියේ අනෙක් කොට්ඨාසයන් අතර පැවති අදහස් උදහස් නොදැන ඔවුන්ගෙන් වෙන් වූ විශේෂ සංස්කෘතික වර්ගයක් වශයෙන් ජීවත් වීම ය (සරච්චන්ද්‍ර,1993:19:20).*

සිංහල උගත් මැද පන්තිය ලෙස සරච්චන්ද්‍ර නම් කරන පන්තිය ලංකාවේ ගැමි ගොවි මධ්‍යම පන්තිය ලෙස සැලකිය හැකිය. මේ පන්තියේ ඇගයීම් හර පද්ධති ආදිය ගැමි ගොවි සම්භවයකින් යුක්ත වේ. ලංකාවේ නාගරික මධ්‍යම පන්තිය ද ගැමි ගොවි සම්භවයකින් යුතු වේ. සරච්චන්ද්‍ර ඉහළ පන්තිය ලෙස සලකන පිරිස කොම්ප්‍රදෝරු ධනපති පන්තිය ලෙස දැක්වීම උචිතය. මේ කොම්ප්‍රදෝරු පන්තිය සතු කළුහම ඔවුන්ගේ අධිරාජ්‍යවාදී වටිනාකම් හා චින්තනයට දෙන ලද වෙස් මුහුණක් ලෙස ෆැනොන් විසින් සලකන ලදි (ෆැනොන්,1961). සරච්චන්ද්‍ර දක්වන ලෙස මේ පන්තියේ ලක්ෂණ මෙසේ ය.

*''යුරෝපීය ඇඳුම් ඇන්දද තම තමන් අතර ඉංග්‍රීසියෙන් කථාබහ කළ ඔවුහු පෘතුගීසි හා ඉංග්‍රීසි නම් භාවිත කළහ. විශාල වශයෙන් ක්‍රිස්තියානිය වැළඳ ගත් ඔවුහු තම පෞද්ගලික ජීවිතයේ දී ද ඉංග්‍රිසි සිරිත් අනුකරණය කළහ (සරච්චන්ද්‍ර,1993,19-20).*

*''එහෙත් ලංකාවට දේශපාලන නිදහස ලැබෙන විට පූර්වයෙන් පැවති සංස්කෘතික තලයේ ක්‍රියාත්මක වූ ජාතික ව්‍යාපාර ද අඩපණ ව පැවතිණ. එහෙයින් දේශපාලනික වශයෙන් ලැබුණු නිදහස ස්වදේශික ජනයාගේ භාවමය ජීවිතයට නොදැනුණ තරම් ය. මේ නිසා බලයට පැමිණි කොම්පදෝරු පන්තියට ජනතාව විෂයෙහි සිය ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා ජාතික හැඟීම් උද්දීපනය වන අතීත උරුමය පෙන්වන දෑ ඉදිරිපත් කිරීමට සිදු විය. නව පාලක පන්තියට බහුතරයකගේ සංස්කෘතික ජීවිතයට ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය දැනුම හෝ පුද්ගලයන් නොවී ය. ඒ සඳහා ඔවුන් දැරූ ප්‍රයත්නය අන්‍ය ජනයාට පෙනී ගියේ හාස්‍ය ජනක ලෙසිනි'' (එම:19).*

*''1948 එළඹි පළමු සිංහල ආණ්ඩුවට සංස්කෘතිය පුනරුත්ථාපනය කිරීමේ කාර්යය කළ නො හැකි විය. මේ වන විට එම රජයට විරුද්ධව භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය ඇති ව ගැමි ගොවි මූලයන්ගෙන් යුතු සංස්කෘතික බල ඇණියක් විසින් සටන් දියත් කොට තිබුණි. ඒ සටනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නමැති නව දේශපාලන පක්ෂය හරහා කොම්ප්‍රදෝරු පන්තියේ ම නියෝජිතයෙක් වූ එස්. ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක විසින් නායකත්වය දෙන ලදි. එම පක්ෂයට පූජ්‍ය පක්ෂයේ අනුශාසක මණ්ඩලයක් ද කැලණි විහාරයේ දී පත් කරගන්නා ලදි. එය දේශපාලන පක්ෂයකට පැවිදි අනුශාසක මණ්ඩලයක් පත් කළ පළමු වතාව වේ. (බන්දු තිලක, මලල්ගොඩ. 1999:237).*

*''බණ්ඩාරනායකට පෙරාතුව පැවති කොතලාවලගේ ආණ්ඩුව පෙරළා දැමීමට හේතු වූ බොහෝ කරුණු සංස්කෘතිකමය ඒවා බව ඒ පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට පැහැදිලි වනු ඇත. අගමැති කොතලාවල වසු පැටවකුගේ ගාතයක් කපමින් අවුරුදු උත්සවයක් අරඹන ආකාරයත් ආණ්ඩු*

*පක්ෂ මන්ත්‍රීවරු විස්කි බොමින් රාජකීය ප්‍රිය සම්භාෂණවලට සම්බන්ධ වන ආකාරයත් පත්තර මුල් පිටුවල පළ කොට තිබුණි. (සරච්චන්ද්‍ර,1993:21).*

මේ ප්‍රචාරවලින් ප්‍රකාශ කර සිටිනු ලැබුයේ මේ **කොම්ප්‍රදෝරු පන්තියට** දේශීය වූ සංස්කෘතික ප්‍රබෝධය ඇති කළ නොහැකි බවයි.

1956 දී භික්ෂූන් ප්‍රමුඛ කොටගත් වෙද ගුරු ගොවි කම්කරු යන බලවේග විසින් දේශීය සංස්කෘතියක් සඳහා මූලික කරුණු තුනක් ප්‍රධාන වශයෙන් යෝජනා කරන ලදී.

01. බුද්ධාගම රාජ්‍ය භාෂාව ලෙස නගා සිටුවීම.

02. රාජ්‍ය භාෂාව සිංහල බවට පත් කිරීම.

03. ජාතික කලා උරුමයන් නගා සිටුවීම.

මේ ප්‍රධාන කාර්යයන් තුන ම පූර්ව අවධියේ පැවති **පියදාස සිරිසේන** ආදීන් විසින් ගොඩනගන ලද ජාතික ව්‍යාපාරයේ ඍජු ආභාසය ලබන බව පැහැදිලි වේ. එනම් 1956 දී දේශපාලනික බලවේගයක් බවට පත් වනුයේ ඊට පූර්ව අවධියේ සංස්කෘතික තලයේ රැඳී පැවති දේශපාලනීකරණය නොවූ සංස්කෘතික ව්‍යාපාරය යි. මේ නිසා දේශපාලන නිදහසින් පසුව යටත්විජිතහරණය සඳහා ක්‍රියාත්මක වූ දේශපාලනික වැඩපිළිවෙල තත් සමාජය සමඟ ඓන්ද්‍රීය ව බද්ධ නොවූ දෘෂ්ටිවාදයක් මත පදනම් වේ.

යුරෝපීය වටිනාකම් හා එම සංස්කෘතික රටාව අධිපතිධාරී වීම නිසා ඉංග්‍රීසි නොදත් භික්ෂූන් ආයුර්වේද වෛද්‍යවරුන් සිංහල ගුරුවරුන් ආදීන් අඩු ආදායම් ලබන, සමාජයේ පිළිගැනීමක් නැති පිරිසක් බවට පත් ව සිටියහ. එහෙයින් 1956 දී එම පිරිස කොම්ප්‍රදෝරු පන්තිය අත්කරගෙන සිටි දේශපාලන බලය ලබා ගනිමින් සිය සංස්කෘතික හරයන් අධිපතිභාවයට පත් කරන ලදි. මේ ක්‍රියාවලියේදී බුද්ධිමතුන්ගේ ක්‍රියාකලාපය හැම විටම පවත්නා වාසිදායක තත්වයට අනුව ප්‍රමාණාත්මක වේ. ඇතැම් විට අන්තවාදීද වේ. 1956 දී කරළියට පැමිණි සමාජ ස්තරය පිළිබඳ සරච්චන්ද්‍රගේ විවේචනය මෙසේ ය.

*"අනෙක් අය හා සමාන අවස්ථා ලැබීමත් ඉංග්‍රීසි නොදැනුම මින් පසු දියුණුවට බාධක නො වීමත් නිසා සිංහල උගත් මැද පන්තිය පීඩාවලින් මිදී ඇතැයි කිව හැකි වුව ද ඔවුනට අද රටට අවශ්‍ය ව ඇති බුද්ධිමය හා සංස්කෘතික කටයුතුවල දී නායකත්වය දිය හැකි ද යන්න ගැන මහජනයා සැක කරන්නට පටන්ගෙන සිටිති. මේ පන්තියට සිය අදහස් පළ කිරීමට අවස්ථාව ලැබී තිබේ. සමහර විට ඔවුන් සිංහල පුවත්පත් මගින් මෙය ඉතා වේගවත් ලෙස කරති. එහෙත් ජනතාව අතර සිටින වඩා බුද්ධිමත් කොටස් මේ අදහස්වලට ඇහුම්කන් දේ ද? පියදාස සිරිසේනගෙන් පටන්ගෙන අද දක්වා වූ කාලය තුළ සාහිත්‍ය හා කලාව පිළිබඳ ව හෝ වේවා ජීවිතය හා සම්බන්ධ කරුණුවල දී හෝ වේවා මේ පන්තිය හැම විට ම ගතානුගතිකත්වය අන්තගාමී ජාති වාත්සල්‍යය හා ව්‍යාජ සුචරිත භාවය යන ලක්ෂණයන් ගෙන් යුක්ත විය (සරච්චන්ද්‍ර,1993:23).*

*"1956 දී ගැමි මූලයන්ගෙන් පැමිණි සිංහල සමාජ ප්‍රස්ථරයන් එක් අතකින් ක්‍රියාත්මක වූ අතර ඔවුහු ගැමි හර පද්ධති ඔසවා තබන ලදි. එහෙත් නාගරික ව ද තවත් මධ්‍යම පන්තික පිරිසක් බිහි විය. ඔවුහු රාජ්‍ය සේවය ආශ්‍රිත ව යැපුණු ඉංග්‍රීසි උගත් පිරිසක් විය (ගම්ලත්, 1996:16-17).*

මේ මධ්‍යම පන්තියට පූර්වයෙන් සඳහන් කළ පරිදි ඉන්දියානු නිදහස් සටන හා ස්වදේශීයකරණ ව්‍යාපාරයේ ආභාසය ඇතිව ජාතික විඥානයක් හා අනන්‍යතාවක් ගොඩනැගීමේ අවශ්‍යතාව ඇති විය.

ඔවුහු තමනට හැකි මට්ටමෙන් එම කාර්යයෙහි නිරත විය. එහි ප්‍රතිඵලයක් ලෙසට කොළඹ කේන්ද්‍ර කොටගෙන ලංකාව නමැති අවකාශය මතවාදීමය ලෙස යළි ඉදිකරන ලදී. ඒ ඉදිකිරීම බොහෝ දුරට ප්‍රාචීනවාදී වේ. *මනමේ* නාට්‍යය හෝ **ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ** *'රේඛාව'* චිත්‍රපටය හෝ **මාර්ටින් වික්‍රමසිංහ**ගේ ප්‍රබන්ධ කථා පරීක්ෂා කළ විට ඒවායේ චිත්‍රිත සෞන්දර්ය හා නිරූපිත පරිසර රූප ආදිය සියල්ල සිංහල බෞද්ධල ගැමි, ගොවි ලක්ෂණ පෙන්වන යුරෝපීයයා දුටු ලාංකිකයා වේ. එහි නිරූපිත ස්වදේශිකයා යුරෝපීයයාගේ ඔළුවෙහි විසූ ලාංකිකයා වේ. ෆැනොන් විසින් සිය අප්‍රිකානු සන්දර්භය තුළ එය සඳහන් කරනුයේ ''කාපේරියෙක් නොව නියම කාපිරි බල්ලෙක් නොහොත් සුද්දා අපේක්ෂා කරන අන්දමේ කාපිරියෙක් වීම ලෙස යි (ෆැනොන්,1961:154).

නිදහස ලබා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ ජාතික ව්‍යාපාරයක් සක්‍රීය ව නොමැති තත්වයක එම ජාතියේ අනන්‍යතාව යළි නිර්මාණය කිරීම බෙහෙවින් ගැටලුදායක තත්වයක් උද්ගත කරයි. පොදු ජන සහභාගීත්වයකින් තොර ව උගතුන් විසින් සිය මනසේ නිර්මාණය කරනු ලබන එම අනන්‍යතාව හා සංස්කෘතික ලක්ෂණ පොදු ජනයා නියෝජනය නොකරන අතර එම සංස්කෘතික අංග පොදු ජනයා මත ආධිපත්‍යය පතුරමින් ව්‍යවහාරික ජීවිතයෙන් පරිබාහිර ව පවතී. මධ්‍යම පන්තිය විසින් නිර්මාණය කරනු ලබන එවැනි සංස්කෘතික නිෂ්පාදන පොදු ජනයාගේ ව්‍යවහාරික ජීවිතය කෙරෙහි බල නොපායි.

සරච්චන්ද්‍ර ද ඉන්දීයානු නිදහස් සටනෙන් යම් ආලෝලනයක් ලද මුත් එය ස්වදේශීය වූ යටත්විජිත විරෝධී ජනතා ක්‍රියාකාරිත්වයන්ට සම්බන්ධ වූවක් නොවේ. එක් අතකින් දැනුවත් බුද්ධිමතුන් පිරිසකට සෘජු ව සම්බන්ධ විය හැකි කවර හෝ ජාතික විමුක්ති ව්‍යාපාරයක් ලංකාවේ තිබුණි නම් ඒ ලංකා සමසමාජ පක්ෂයේ මැදිහත් වීම පමණක් බව පූර්වයේ ද සඳහන් කළෙමු. අනෙකුත් සියල්ලම යටත්විජිතහරණය සඳහා ගෙනගිය ක්‍රියාමාර්ග අතිශයින් පරස්පර විරෝධතා මතු කරන්නේ වේ. එහෙත් කවර හෝ නිදහස් ව්‍යාපාරයක් සමඟ සරච්චන්ද්‍ර සම්බන්ධ වී නොසිටි අතර ඔහුගේ යටත්විජිතකරණයට එරෙහි අරගලය හුදකලා ඒක පුද්ගල එකක් විය. එහෙයින් ම විවිධ විචාරකයන් විසින් නන් තන්හී ඔහුගේ සම්ප්‍රදානයන් පිළිබඳ කවර ඌනිත කියවීම් කර තිබුණ ද සත්‍ය ලෙස ම එය ඉතා ම පරස්පර හා සංකීර්ණ වූවකි. ගම්ලත්ම පවසන ලෙස ඔහු නාට්‍ය කලාවට කළ සම්ප්‍රදානය වුව ඉතා පරස්පර විරෝධී වේ.

> *''මෙලෙස සරච්චන්ද්‍රයන් ප්‍රයත්න දැරුවේ ලංකාව තුළ දේශීය රූපයෙන් ද සර්ව දේශීය අන්තර්ගතයෙන් ද යුතු විදග්ධ ප්‍රිය, නාට්‍ය කලාවක් ගොඩනගන්නට ය. (ගම්ලත් 1989:149).*

දේශීය ආකෘතියත් විශ්ව අන්තර්ගතයත් සරච්න්ද්‍රගේ නාට්‍ය තුළ එක වර පවතී යන්න ගම්ලත්ගේ අදහසයි. මනමේ නාට්‍ය උදාහරණ ලෙස ගතහොත් එහි අන්තර්ගතයේ ඇති සෞන්දර්ය රූප ගැන්වූ ලිබරල් මානවවාදී අර්ථ සහිත චුල්ල ධනුර්ධර ජාතකයත් ආකෘතියේ ඇති නෝ කබුකි රංග ලක්ෂණ හා භාරතීය නර්තන විලාසත් ග්‍රීක නාට්‍යයෙන් ගත් කෝරස් අනුව සැකසූ පොතේ ගුරුත්[7] (සරච්චන්ද්‍ර:1985) ගම්ලත්ගේ අදහස සාවද්‍ය භාවයට පත් කරයි.

නිදහස් සටනින් තොරව සංස්කෘතියට හුදකලාව මැදීහත් වීම නිසා එම ස්වදේශීය බුද්ධිමතුන් අතින් නිමවන සංස්කෘතික අංග හා සංස්කෘතිය එහි ජීවත් වන ජනයා සමඟ ඓන්ද්‍රීය ව සම්බන්ධ නොවන බව ෆැනොන්ගේ අදහසයි. ඔහුට අනුව හුදු සංස්කෘතිකමය නිරෝධය මෝස්තරයක් පමණක් සම්පාදනය කරයි. ඇල්ජීයානු අත්දැකිම් අනුව ෆැනොන් සඳහන් කරනුයේ මෙසේ ය.

> *''ජාතියේ පැවැත්ම ගැන සාක්ෂි ඉදිරිපත් කළ හැක්කේ එහි සංස්කෘතියෙන් නොවන බව ස්වදේශීය බුද්ධිමතා වටහා ගනී. විදේශීය ආධිපත්‍යයට විරුද්ධ ව ජනතාව ගෙන යන සටන මඟින්*

*පමණක් ම ජාතියේ පැවැත් ම සනාථ වන බව ද ඔහු අවබෝධ කර ගනී. තමා යටතේ ඇති රටවල කිසි ම සංස්කෘතික වැදගත්කමක් නැත්තේය යන තර්කය උඩ යටත්විජිත ක්‍රමයේ සාධාරණත්වය ඔප්පු කිරීමට කිසි යටත්විජිත රාජ්‍යයක් තැත් නොකරයි. අපේ එතරම් ප්‍රසිද්ධ නොවූ සංස්කෘතික සම්පත් ඔවුන්ගේ ඇස් හමුවේ ප්‍රදර්ශනය කිරීමෙන් ඔවුන් කවදාවත් ලැජ්ජා කිරීමට නො පුළුවන (ෆැනොන් 1961:156).*

සරච්චන්ද්‍ර මෙන් ම සමකාලින ව සංස්කෘතියට මැදිහත් වූවන් දේශිය දේ ලෙස ගැමි සංස්කෘතික අංග හා ගැමි කලා උත්කර්ෂයට නැංවීමට උත්සාහ දරයි. ලෙස්ටර්ගේ *රේඛාව* චිත්‍රපටයට ඔබා ඇති ගම්බද දර්ශන හා ශාන්තිකර්ම පිළිබඳ රූප රාමුත් සරච්චන්ද්‍රගේ *මනමේ* හි නාඩගම් රංග ශෛලියත් මාර්ටින් වික්‍රමසිංහ විසින් නිරූපණය කරන *අපේ ගමත්* [8] යන තුනම මේ එකම කාර්යයේ නිරත වෙයි. මේ ගම හා ගැමි සංකේත නගරයට ගෙනැවිත් නාගරිකයන්ට පරිභෝජනය කිරීම සඳහා අලෙවි කිරීම ඊළඟ අදියරේ දී සිදු කෙරෙයි. ලංකාවේ නාගරික මධ්‍යම පන්තියේ වැඩි දෙනෙක් ගැමි මූලයන් ගෙන් යුතු වීම මෙය මෙලෙස සිදුවීමට එක් හේතුවකි.

මේ සංස්කෘතික නිෂ්පාදකයන්ට අවශ්‍ය වුයේ යුරෝපීයයන් විසින් ලංකාවේ අනන්‍යතාව ලෙස ඔවුනට කියා දී තිබු දේ මතු කොට ආභරණයක් ලෙස සිය පන්තියේ පැවැත්ම සනාථ කිරිම සඳහා පවත්වාගෙන යාමයි. ඔවුන් සංස්කෘතික සම්පන්න නැත යන යුරෝපීය අවලාදයට පිළිතුරු බැඳීමයි.

මෙලෙස ජාතික නිදහස සඳහා වූ ශක්තිමත් ව්‍යාපාරයක් මෙරට තුළ ක්‍රියාත්මක නො වීමත් සුළු වශයෙන් හෝ පොදු ජනතාව සමඟ කටයුතු කළ ව්‍යාපාර සමඟ කවර හෝ සම්බන්ධයක් නොමැති ව සංස්කෘතියට මැදිහත්වීමත් නිසා සරච්චන්ද්‍රගේ නිර්මාණ බොහෝ සෙයින් හුදු සෞන්දර්යවාදී වීමේ අනතුරට ලක් වේ. සමකාලීන ජනයා නියෝජනය නො කරන පාරභෞතික නිර්මාණ සම්පාදකයෙකුගේ තත්වයට ඔහු පත්වනුයේ ද එහෙයිනි. නාඩගම් ආදී පොදු ජන සංස්කෘතික අංගවල ලක්ෂණ යොදා ගත්ත ද ඒ ජනතාව සමඟ සරච්චන්ද්‍රට ඓන්ද්‍රීය සම්බන්ධතාවක් නොතිබිණ.

**චාර්ලිස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ**ගෙන් ලබා ගත් එම ජනප්‍රිය කොටස් වුව සරච්චන්ද්‍රගේ අණසක යටතේ සංශෝධනය වී ඇත. මේ නිසා නාට්‍ය කලා භාවිතය තුළ තවදුරටත් *මනමේ* හෝ එය විසින් සම්පාදිත දේශීය සම්ප්‍රදාය නො පවතින අතර එයින් ඇති කළ ආලෝලනය ලාංකේය ඇකඩමිය තුළ පමණක් නිර්බාධිත ව අනභියෝගී ව තවමත් පවති. ඒ දැනුම යාවත්කාලීන කිරිමට තරම් ප්‍රබල වූ දේශපාලන ක්‍රියාවලියක් තවමත් සිදු වී නොමැති වීම ඊට හේතුවයි. එනම් 1956 න් පසුව ලංකාවේ ශාස්ත්‍රාලවලට දැනෙන සමාජ වෙනසක් සිදු ව නැත.

සරච්චන්ද්‍රගේ මනමේ නාට්‍යයට වසර 25 ක් පිරීම නිමිත්තෙන් 1981 දී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය *රූපණ* වැඩසටහන මගින් සාකච්ඡාවක් ප්‍රචාරය කරන ලදි. ඒ සඳහා **ධම්ම ජාගොඩ,ජයදේව උයන්ගොඩ** හා **සුචරිත ගම්ලත්** සහභාගි විය. **සුනන්ද මහේන්ද්‍ර** සාකච්ඡාව මෙහෙයවන ලදි. මෙහි දී ද වසර විසිපහකට පසු *මනමේ* නාට්‍යයේ භාවිතය පිළිබඳ ප්‍රශ්න මතු විය.*මනමේ* සමකාලීන විඥානය නියෝජනය නොකරයි යන්න **ජයදේව උයන්ගොඩ** විසින් පැහැදිලි ව ප්‍රකාශ කරන ලදි. සංවාදයේ දී උයන්ගොඩගේ තර්කයට එරෙහි ව ගම්ලත් විසින් කරුණු ගොනු කරන මුත් උයන්ගොඩ දක්වන අදහසට සාර්ථක ව මුහුණ දීමට ගම්ලත් අපොහොසත් වේ. උයන්ගොඩ සඳහන් කරන ප්‍රධාන කරුණු තුනක් ඇත.

01. මනමේ නාට්‍යයේ සමකාලීන විඤ්ඤාණය නිරූපණය නොවේ.

02. මනමේ නරඹන ප්‍රේක්ෂකයන් එය නරඹනුයේ හුදු විනෝදය සඳහා එහි ඇති ජනප්‍රිය අංග සමඟ සම්පර්කයට යෑමට ය.

03. සරච්චන්ද්‍ර බිහි කළ ඊනියා දේශිය නාට්‍ය ආකෘතිය ඉතා කෙටි කාලයකින් වේදිකාවෙන් ඉවතට විසි විය.[9] (ගම්ලත් 1996. 146-147)

උයන්ගොඩ පෙන්වා දුන් කරුණුවලට අමතරව X කණ්ඩායම විසින් මනමේ නාට්‍ය මෙතෙක් කල් සංවාදයට ලක්වීමට හා ප්‍රදර්ශනය වීමට බලපෑ තවත් හේතු කිහිපයක් පෙන්වා දෙයි. එනම් 1950-60 දහකයේ සිට එය පාසල් විෂයමාලාවට හා විශ්වවිද්‍යාල විෂය මාලා තුළට ඇතුළු කොට තිබීමත් සරච්චන්ද්‍රගේ ශිෂ්‍ය පිරිස විසින් එය උත්කර්ෂයට නංවමින් තවමත් පවත්වා ගෙන යනු ලැබීමත් ය (ගුණරත්න,දීප්ති කුමාර,ලීලාරත්න සුමිත් චාමින්ද සහ තවත් අය,2004:404-485).

අද ලංකාවේ වේදිකා නාට්‍ය කලාව පවතින ආකාරය හා එම නිර්මාණකරුවන් සමඟ සරච්චන්ද්‍රගේ සම්ප්‍රදානය කවර සම්බන්ධයක් පවත්වන්නේ ද යන්න ඉදිරියේ දී සාකච්ඡා කෙරෙන අතර එම අධ්‍යයනයෙන් තහවුරු වනුයේ ඔහුගේ දේශීය සම්ප්‍රදාය හෝ පෙරදිගවාදී ශෛලිගත ආකෘතිය වේදිකාවෙන් බැහැර වී ඇති බවයි. සමකාලීන ජීවිතය වේදිකාව තුළ ප්‍රශ්න කරන නිර්මාණකරුවන් සරච්චන්ද්‍රගේ භාවිතයෙන් සපුරා ම විකර්ෂණය වී ඇත.

ජාතික විමුක්ති අරගලය සමඟ ඓන්ද්‍රීය ව බද්ධ වූ කලාකරුවන් අතින් නිර්මාණය වන සාහිත්‍ය හෝ කලාව අගතීන්ගෙන් අඩු වන අතර සමකාලීන ජීවිතය ඥානනය කිරීමටත් එහි පවත්නා නිසඟ සෞන්දර්ය ආස්වාදනයටත් මඟ පාදයි. ඒවා ආවේශදායී නිර්මාණ වේ. එවැනි නිර්මාණ අප්‍රිකානු ලතින් ඇමරිකානු හා මැද පෙරදිග නිර්මාණ කරුවන් අතර දක්නට ඇත. නිදහස් සටන් අවධියේ ඔවුන් ලත් පන්නරය දැනුදු වියැකී ගොස් නැත.**න් ගුගිවා තියොන්ගෝ**ගේ *මතිගාරි* වැනි කෘති[10] ඊට කදිම උදාහරණ වේ.

ෆැනොන් දක්වන පරිදි ජාතික විමුක්ති අරගලය සමඟ ඓන්ද්‍රීය ව බද්ධ වූ කලාවක ඇති, ජනතාව විසින් පිළිගන්නා, ජනතාව නියෝජනය කරන ගුණය හුදු දෘෂ්ටිවාදී තලයේ නිෂ්පාදනයකින් ලද නො හැකි ය. ඔහු ඊට නිදර්ශන ද උපුටා දක්වයි.

> *''ගිනියාවේ දැනට ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වූ* ***කයිතා ෆොඩේබා*** *අප්‍රිකානු මුද්‍රා නාට්‍ය ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ කළ කාලයේ දී, ගිනියාවේ ජනතාව ඔහු හමුවේ තැබූ යථාර්ථය කිසි ම ප්‍රයෝගයකින් විකෘත නො කළේ ය. විප්ලවීය දෘෂ්ටි කෝණයක සිට තම රටේ රිත්මිය ජීවන රූපයට හෙතෙම නව අර්ථකථනයක් දුන්නේ ය. ඊටත් වඩා වැදගත් සේවයක් ද ඔහු ඉටු කළේ ය: අරගලයේ විවිධ ඓතිහාසික අවස්ථා නිවැරදි ලෙස අර්ථ නිරූපණය කිරීමටත් බහු ජන අධිෂ්ඨානයට පැහැදිලි ස්වරූපයක් ගැනීමට ඉවහල් වන කේන්ද්‍රීය සංකල්පයන් හා ක්‍රියාවන් වැඩෙන හා සිදුවන ක්ෂේත්‍ර නිශ්චිත ලෙස සලකුණු කිරීමටත් දැඩි රුචියක් ඔහුගේ එතරම් සුප්‍රකට නො වන කාව්‍ය රචනාවන්හි ද දක්නට ලැබේ. ඔහු විසින් රචිත කල්පනාවට, ව්‍යාකුලත්වයෙන් මිදීමට, සටනට කෙරෙන සැබෑ ආරාධනයක් වන් කාව්‍යයක් මෙහි පහත දැක්වේ''*

***අප්‍රිකානු අරුණෝදය***

*(ගිතාර් සංගීතය)*

*අරුණාලෝකය සෙමෙන් පැතිරේ. රාත්‍රියෙන් අඩක්, බෙර හඬට අනුව නටා, නින්දට ගිය කුඩා ගම්මානය සෙමින් අවදි වේ. වැරහැලි ඇඳගත් එඬේරෝ බටනළා පිඹිමින් තැනිතලාව දෙසට සිය බැටලු රංචු දක්කන්නට වූහ. දොළට යන වංගු අඩි පාර දිගේ ගම් දැරියෝ කහ කුරුල්ලන් අතින් ගෙන පේළියට යති. පූජකයෝ ගෙදර මිදුලේ ළදරු කණ්ඩායමක් කොරානයේ සමහර ගීත පහත් ස්වරයකින් ගායනා කරති.*

*(ගිතාර් සංගීතය)*

*අරුණාලෝකය පැතිරේ. අරුණෝදය - රයත් දවාලත් අතර සටන. එහෙත් විඩාවට පත් වූ රය තවත් සටන් කරන්නට නො හැකි ව සෙමින් මළේ ය. දවාලේ ජයග්‍රහණයේ පුරෝගාමීන් මෙන් හිරු රැස් කිහිපයක් ප්‍රභා හීන ව බියෙන් මෙන් තවමත් නිම් වළල්ලේ සැරි සරමින් සිටි. ඒ සමඟ ම අන්තිම තරු රතුපාට මැයි මල් මෙන් තද රතු පැහැති වළාකුලු අතරට සෙමින් සෙමින් රිංගා ගියහ.*

*(ගිතාර් සංගීතය)*

*අරුණාලෝකය සෙමින් පැතිරේ. දම්පාටට පෙනෙන කඳුවැටියෙන් කෙළවර වන මහා තැනිතලාවේ එක් අයිනක නැමීබිම කොටන මිනිසකුගේ සේයා රුවක් - නාමාන් නම් කම්කරුවාගේ සේයා පිළිරුව. ඔහු උදැල්ල එසවූ හැම පාරම කුරුල්ලෝ බිය පත් ව අහසට නැග ඒ මහා නයිජර් ගංගාවේ, පොලිබාවේ, ශාන්ත ඉවුරු බලා පියාසර කළහ. මිනිසාගේ අලු පැහැති කපු කලිසම පින්නෙන් තෙත් වී ඔහු දෙපස වූ තණ පඳුරුවල වැදේ. ඔහු නැමී දහඩිය දමමින් විවේකයක් නැතිව නිරතුරුව ම උදැල්ලෙන් කොටයි. එන වැස්සට පෙර බිජුවට වැපිරිය යුතුයි.*

*(කෝරා සංගීතය)*

*අරුණාලෝකය පැතිරේ. තවමත් පැතිරේ. දහවල පැමිණි බව පවසමින් ගේ කුරුල්ලෝ ගස් අතර ඔබ මොබ සැරි සරති. තැනිතලාවට යන පාර දිගේ පතරොම් පටියක් මෙන් පපුව හරහා ඊතල කොපුව එල්ලා ගත් ළමයෙක් නාමාන් දෙසට හති දමමින් දුවයි. ''සොහොයුරු නාමාන්, ගම්පතියා ඔබව මන්ත්‍රණ ගස අසලට කැඳවයි. යනු හේ ශබ්ද නගා කීය.*

*(කෝරා සංගීතය)*

*මෙතරම් උදෑසනින් එවැනි පණිවුඩයක් ලැබීමෙන් පුදුමයට පත් කම්කරුවා උදැල්ල බිම තබා (එවකට) නැඟෙන හිරු රැසින් ආලෝකමත් වී තිබුණු ගම්මානය දෙසට ගියේ ය. ගමේ වයෝවෘද්ධයෝ මහත් ගාම්භීර පෙනුමින් ගස යට වාඩිවී සිටිති. ඔවුන් අසල නිල ඇඳුමෙන් සැරසුණු මිනිසෙක්, දිස්ත්‍රික්ක ආරක්ෂකයෙක්, පයිප්පයක් උරමින් නිශ්ශබ්ද ව වාඩිවී සිටියේ ය.*

*(කෝරා ගීතය)*

*නාමාන් බැටලු සම මත සිය අසුන ගත්තේ ය. වයෝවෘද්ධයන් එළඹි තීරණය සභාවට දැන්වීමට ගම්පතියාගේ නියෝජිතයා නැගී සිටියේ ය. ''ඔවුන්ගේ රටේ යුද්ධයක සටන් කිරීම පිණිස ගමින් මිනිසකු කැඳවීමට සුදු මිනිස්සු දිස්ත්‍රික් ආරක්ෂකයා එවා ඇත. වයෝවෘද්ධ අය මේ ගැන සාකච්ඡා කර අපේ වර්ගයේ ඉතාම විශිෂ්ට නියෝජිතයා වන තරුණයා යැවීමට තීරණය කර ඇත. සැම දා අපේ වර්ගයාගේ ලක්ෂණයක් වූ ඒ නිර්භීත ධෛර්ය ඔහු විසින් සුදුමිනිසුන්ට පෙන්වනවා ඇතැයි අපි විශ්වාස කරමු''.*

*(ගිතාර් සංගීතය)*

*නිල වශයෙන් ම නාමාන් මෙසේ තෝරා ගන්නා ලදි. සැම සැන්දෑවක ම ඔහුගේ උස මහත ගැනත් ශක්තිමත් දේහ විලාසය ගැනත් දෙපද ගී ගයන්නට ගම් දැරියෝ පුරුදුව සිටිය හ.*

*මේ ආරංචියෙන් මහත් සේ කැළඹුණු ඔහුගේ බිරිඳ කෝමල කඩිජා, ධාන්‍ය ඇඹරීම විගස නවත්වා වංගෙඩිය අටුව යටින් තබා වචනයක්වත් කථා නොකර පැළට වී දොර වසා ගත්තාය. එහි දී ඇට පැමිණි මේ විපත්තිය ගැන සිතමින් ඉකි බිඳ බිඳ අඬන්නට වූවා ය. මාරයා ඇගේ පළමු සැමියා ගෙන ගියේ ය. දැන් සුද්දන් නාමාන් ද තමාගෙන් වෙන් කරගෙන යන්නට සැරසෙන බව ඇට ඇදහීමට පවා නො හැක. නාමාන් ඇගේ සෑම නව බලාපොරොත්තුවක ම කේන්ද්‍රය විය.*

*(ගිතාර් සංගීතය)*

*පසුදා, ඇගේ කඳුළු හා විලාප නොතකා යුද බෙරවල මහා හඬින් පිරිවරන ලද නාමාන් ගමේ කුඩා වරායට ගියේ ය. දිස්ත්‍රික්ක අගනුවරට යාම සඳහා එහි දී ඔහු ටෝලරයකට නැංගේ ය. එදා රෑ සිරිත් පරිදි ගමේ පොළේ නටනු වෙනුවට, ගම්දැරියෝ නාමාන්ගේ පැළේ එළිය කාමරයේ රැය ගත කිරීමට ආවෝ ය. දර ගින්නක් වටා සිට ඔවුහු උදය වන තෙක් කථාන්තර කීහ.*

*(ගීතාර් සංගීතය)*

*නාමාන් පිළිබඳ කිසිදු ආරංචියක් බොහෝ කලකට ගම්මානයට නොලැබුණේ ය. මහත් දුකට පත් ව සිටි කඩිජා අසල ගමේ සිටි කපටි නිමිත්තකාරයකු සොයා ගියා ය. ගමේ වයෝවෘද්ධයෝ මේ ගැන රහස් මන්ත්‍රණයක් පැවැත් වූහ.එහෙත් කිසි පලක් නො වීය.*

*(කෝරා සංගීතය)*

*අන්තිමේ දී එක් දිනක් නාමාන්ගෙන් ලිපියක් කඩීජාගේ නමට, ගමට ආවේ ය. සැමියාට කුමක් වී දැයි දැනගැනීමට නො ඉවසිලිමත් වූ ඕ තොමෝ ගමින් පිටත් වී පැය ගණන් මහන්සියෙන් ඇවිද එදා රෑ ම දිස්ත්‍රික්ක අගනුවරට පැමිණියා ය. එහි දී නමාන්ගේ ලිපිය පරිවර්තකයෙක් ඇයට කියවා දුන්නේ ය.*

*නාමාන් සිටියේ උතුරු අප්‍රිකාවේ ය. ඔහු සුවයෙන් සිටි. අස්වැන්න ගැන, ගඟ ගැන, නැටුම් ගැන, මන්ත්‍රණ ගහ ගැන ආරංචි, මුළු ගමම ගැන ආරංචි දන්වා එවන මෙන් ඔහු ඉල්ලුවේ ය.*

*(බලා ෆෝ සංගීතය)*

*එදා රෑ කඩිජාට ගෞරව දක්වනු වස්, ගමේ වයස්ගත ම ස්ත්‍රියගේ ගෙමිදුලට පැමිණ එහි දී සිරිත් පරිදි කෙරෙන කතා බහට ඇහුම්කන් දීමට ගමේ වයෝවෘද්ධ ස්ත්‍රීහු ඇට ඉඩ දුන්හ. නාමාන්ගෙන් ආරංචියක් ලැබීම ගැන සතුටට පත් ගම්පතියා ගම් පෙදෙසේ සිටි හිගන්නන් කැඳවා ඔවුන්ට මහා දානයක් දුන්නේ ය.*

*(බලා ෆෝ සංගීතය)*

*මාස ගණනක් ගෙවී ගියේ ය. නාමාන් ගෙන් තවත් ලිපියක් නොලැබීම ගැන ගම්මු නැවතත් දුක් වන්නට වූහ. නිමිතිකාරයා බැලීමට තවත් වරක යාමට කඩිජා සිතමින් සිටිත් ම ඇයට දෙවන ලිපියක් ලැබුණේ ය. කෝසිකා හා ඉතාලිය පසු කර ඔහු ජර්මනියට ගොස් තිබිණි. පදක්කමක් ලැබ, ඔහුගේ නිර්භීතකම පිළිගෙන ඇති හෙයින් ඔහු ආඩම්බර විය.*

*(බලා ෆෝ සංගීතය)*

*එහෙත් තෙවන වර, නාමාන් ජර්මන් හමුදාවන්ගේ සිර කරුවකු වී ඇති බව දන්වමින් තැපැල් පතක් ගමට ලැබුණේ ය. මේ ආරංචියෙන් මුළු ගම ම කනස්සල්ලට පත් විය. ඉක්බිති සම්මන්ත්‍රණයක් පැවැත් වූ වයෝවෘද්ධයෝ, මාලි වර්ගයාගේ ඉතිහාසයේ විවිධ අවධීන්ගේ හැම*

*පියවරක් ම නිරූපණය කරන මාලි අධිරාජ්‍යවරුන්ගේ නැටුම -ශුද්ධ ගිජුලිහිණි නැටුම, ඩූගා (Douga) නම් වූ ඒ නැටුම නටන්නට මින් මතු නාමාන්ට ද වර ඇති බව තීරණය කළෝ ය. යම් කිසි වීර ක්‍රියාවක් නොකළ කෙනෙකුට මේ නැටුම නැටීමට වර නොලැබෙන බව දත් කඩීජා තම සැමියා තම රටේවිරයකු වශයෙන් ගරු තත්වයකට පැමිණ සිටීම ගැන සිතමින් යම්තම් අස්වැසිල්ලක් ලබා ගත්තා ය.*

*(ගිතාර් සංගීතය)*

*කාලය ගෙවී ගියේ ය. වසරක් පසු වී වසරක් ගෙවී ගියේ ය. නාමාන් තවම ජර්මනියේ සිරකරුවෙකි. ඔහු දැන් ලිපි එවන්නේ නැත.*

*(ගීතාර් සංගීතය)*

*එක් සුබ දිනයක, නාමාන් නොබෝ දිනකින් ගෙදර එන බවට පණිවුඩයක් ගම්පතිට ඩකාර් නගරයෙන් ලැබුණේ ය. බෙර හඬ එවිගස ම නැගෙන්නට විය. පසු දා එළිවන තුරු ගැයීම් හා නැටිම් ගම්මානය පුරා වූහ. එහෙත් ඩූගා නැටුමේ ඇදීහිලිවන්තයන් වූ වයෝවෘද්ධයෝ ඒ සුප්‍රසිද්ධ නැටුම ගැන තවත් කතා නොකළ නිසා ගම් දැරියෝ නාමාන් ආපසු ගෙදර ඒම නිමිත්තෙන් අලුත් ගී තැනූහ.*

*(බෙර හඬ)*

*එහෙත් මසකට පසු නාමාන්ගේ ඉටු මිතුරෙක් වූ කෝප්‍රල් මවුස්සා බේද ජනක ලිපියක් කඩිජාට එවුවේ ය. ''අරුණාලෝකය පැතිරෙමින් තිබිණ. අප ටියරෝ- සු -ටෙයර්හි සිටියෙමු. ඩකාරයෙන් ආ අපේ සුදු නිලධාරීන් හා අප අතර පුළුල් අරගලයක් ඇති විය. ඒ අරගලයේ දී නාමාන්ට වෙඩි උණ්ඩයක් වැදුණි. ඔහු දැන් සෙනෙගාල් දේශයේ සදා නින්දේ සැතපේ.*

*(ගිතාර් සංගීතය)*

*ඔව් - අරුණාලෝකය පැතිරේ. හිරුගේ පළමු රැස් මුහුද මත වැටෙත් ම පෙණ කැටි මුදුන් ඇති කුඩා රළ රන්වන් සේ දීලෙන්නට විය.*

*එදා උදය වූ සටනින් ශෝකයට පත් වූවාක් මෙන් මඳ සුළඟේ සෙලවෙන ෆාම් ගස් මුහුද දෙසට නැඹුරු වූහ. එදා ටියුරෝහි අරුණාලෝකය රුධිරයෙන් කිලිටි කළ ඒ අපරාධී බේදවාචකය ගැන අසල්වැසියන්ට දැනුම් දෙන්නට මෙන් කාක් කාක් ගාමින් කපුටු රංචු ආවෝ ය. ගිනිගත් කලක මෙන් දිලිසුණු නිල් අහසේ නාමාන්ගේ සිරුර තිබූ තැනට උඩින් ගිජු ලිහිණියෙක් සැරිසරමින් සිටියේ ය. ඒ පක්ෂියා ''නාමාන්'' මගේ නම ගත් ඒ නැටුම නටන්නට නුඹට බැරි විය. එහෙත් අන් අය එය නටාවි. කියන්නාක් මෙන් හැගුණි.*

*(කෝරා සංගීතය)*

*මේ දීග කාව්‍යය මා උපුටා දැක්වූයේ, වැදගත් පාඩමක් අපට ඉගැන්වීමේ ශක්තියක් එහි ඇති බැවිනි. මෙහි සියලු දෙය ම පැහැදිලි යඃ එය නිශ්චිත අනාගතයකට යොමු කෙරුණු විවරණයකි. මේ කාව්‍යය වටහා ගැනීම බුද්ධිමය වර්ධනයක් පමණක් ම නොවේ. එය දේශපාලන වශයෙන් ද වර්ධනයකි. මේ කාව්‍යය වටහා ගැනීම තම තමාගේ හැසිරීම හා කාර්යයන් වටහා ගැනීම යි. තම තමන්ගේ ඉදිරි ගමන වටහා ගැනීම යි. ඒ මගින් තම අවි මුවහත් කර ගැනීම යි. මේ කාව්‍යයේ ගැබ් වී ඇති පණිවුඩය තේරුම් නො ගන්නා එක දු යටත් වැසියෙක් නො වන්නේ ය. යුරෝපීය සටන් බිමේ වීරයෙක් වූ නාමාන් සිය මවු රටට පැමිණෙන මොහොතේ දී ම පොලීසිය විසින් මැෂින් තුවක්කු වෙඩිවලින් මරා දමනු ලැබේ. මේ 1945 සෙටිෆ් සිද්ධිය යි. ෆෝර්ට් ලෙ*

*ප්‍රාන්ස්, සයිගෝන්, ඩකාර්, ලාගෝස් ආදී තැන්වලත් වූයේ මෙය ම යි. ප්‍රංශයේ නිදහස රැකීමට හෝ බ්‍රිතාන්‍ය ශිෂ්ටාචාරය ආරක්ෂා කිරීමට හෝ සටන් කළ සියලු කාපිරියෝ හා අරාබියෝ කයිතා ෆොඩේබා* (Keita Fodeba) *මේ කාව්‍යයෙන් තමන් ම හඳුනා ගනිති. (ෆැනොන්: 1961,159-164).*

භාරතීය සෞන්දර්ය වේදයන්ගේ සමීප ඇසුර නිසා ලාංකේය විචාර තුළ සෞන්දර්යාත්මක බව යන්න අධිනිශ්චය වී ඇත. අනෙක් අතට නිදහස් මානවවාදී පිළිගැනීම් හැරුණු කොට ව්‍යුහවාදය, ස්ත්‍රීවාදය, මනෝවිශ්ලේෂණවාදය වැනි නූතනවාද මෙරට තුළ සාහිත්‍ය විචාර සඳහා භාවිතයට පැමිණියේ නැත. මාක්ස්වාදය පැමිණිය ද එය **ට්‍රොට්ස්කිවාදී, ස්ටාලින්වාදී, මාවෝවාදී** ලෙස විවිධ කල්ලිවලට බෙදීණ. ලංකාවේ සිටි ප්‍රචලිත ම මාක්ස්වාදී විචාරකයා වූ සුචරිත ගම්ලත් ද භාරතීය සෞන්දර්යවේදය ප්‍රමුඛ තැනක ලා සැලකුවේ ය. එවැනි සන්දර්භයක විප්ලවයේ ජෛන්ද්‍රීය සම්බන්ධයක් ඇති නිර්මාණකරුවන් වඩා නිරෝගී හා කාලයට ඔරොත්තු දෙන කලා නිර්මාණ කරයි යන ෆැනොන්වාදී අදහස කවරෙකු විසින් හෝ ප්‍රශ්න කළ හැකිය. එනම් එවැනි නිර්මාණයක් සෞන්දර්යාත්මක ගුණයෙන් හීන, රසිකයාගේ භාව මණ්ඩලයට ප්‍රථම කොට ම ආමන්ත්‍රණය නො කරන ප්‍රචාරකවාදී කෘතියකැයි චෝදනා එල්ල විය හැකි ය (ගම්ලත්:1979,1995). ෆැනොන්ගේ දීර්ඝ උපුටා දැක්වීම සපුරාම මෙහි ද උපුටා දක්වනු ලැබුයේ එම චෝදනාවට පිළිතුරු වශයෙනි. **කයිතා ෆොඩේබා**ගේ අප්‍රිකානු අරුණෝදය ප්‍රචාරකවාදී, හැඟීම් හීන කෘතියකැයි කා හට නම් කිව හැකි ද? එය සෞන්දර්යාත්මක මෙන් ම ආවේශදායි ඥානයකින් ද සන්නද්ධ වූ ජෛන්ද්‍රීය කලාකරුවෙකුගේ කෘතියකි.

දේශීය සංස්කෘතියක් නිර්මාණය කිරීමේ යටත්විජිතහරණ ක්‍රියාවලිය තුළ නිර්මාණය වූ *මනමේ* නාටකය වැන්නක් හුදු සෞන්දර්යවාදී හා නිදහස් මානවවාදී මුහුණුවරක් ගනුයේ එය නිදහස් සටනක හෝ සක්‍රීය ජාතික ව්‍යාපාරයක ජෛන්ද්‍රීය කොටසක් ලෙස නිර්මාණය නොවූවක් වන නිසාය යන්න මේ අධ්‍යයනයෙන් තහවුරු කෙරේ. ඒ පිළිබඳ සවිඥානකත්වයක් පැවතියේ නම් *මනමේ* කථාව වැන්නක් සරච්චන්ද්‍ර විසින් සිය නාට්‍ය සඳහා භාවිත කරන්නේ ද නැත. (රංජිත් පෙරේරා: 2004 කොළඹ). සරච්චන්ද්‍ර ඉන්දියානු නිදහස් සටනේ උද්යෝගයෙන් ඔද වැඩුනෙක් වුව ලංකාව තුළ ක්‍රියාත්මක වූ කවර හෝ ජාතික ව්‍යාපාරයකට සම්බන්ධ වීමට ඔහුට අවශ්‍යතාවක් නොවී ය. ඉතා ම පසු කාලීන ව සරච්චන්ද්‍ර දේශපාලනයට සම්බන්ධ වන මුත් ඔහු නිර්මාණකරණයේ යෙදුණු අවදියේ **කල්පනාලෝකවාදී** සෞන්දර්යවාදයක නිමග්න ව සිට ඇත.

මෙලෙස දෘෂ්ටිවාදී තලයේ වූ උත්තේජනයක් හරහා නිර්මාණය කරන ඊනියා දේශීය සම්ප්‍රදාය ලංකාවේ ශාස්ත්‍රාල තුළ අධිපතිධාරී වන අතර ප්‍රායෝගික තලය වූ ප්‍රසාංගික කලාව තුළ නැතහොත් වේදිකා නාට්‍ය නිෂ්පාදන කාර්ය තුළ අභාවිත ව යයි. අද වන විට සරච්චන්ද්‍රගේ දේශීය නාට්‍ය සම්ප්‍රදායෙන් ප්‍රයෝජන ගන්නා නාට්‍යකරුවන් නැති තරම් වේ. මේ නිසා තවදුරටත් මතවාදී තලයේ සරච්චන්ද්‍ර පැවතීමත් භාවිතය තුළ නොපැවතීමත් දිගින් දීගට ම අත්විඳිය හැකි යථාර්ථයකි.

පාදක සටහන්:

1. මහනුවර යුගයේ චිත්‍රිත සිතුවම් අතර බොහෝ සෙයින් නූතන ජීවිතය ප්‍රති නිර්මාණය වනු දැකිය හැකි ය. දඹුළු ලෙනේ ඇති චිත්‍රවල මාර පරාජය සිතුවම් කළ ශිල්පියා තුවක්කුවක් අතැති මාර පුත්‍රයෙකු ද චිත්‍රණය කොට ඇත. එම ලක්ෂණය දකුණු පළාතේ මුල්කිරිගල විහාර සිතුවම් අතර ද එමෙන් ම ඊට සමකාලීන විහාරාරාම කිහිපයක ද දැකිය හැකි ය. නිට්ටඹුව පිළිකුත්තුව විහාරයේ ඇති දොරටුපාල සිතුවම්වලින් නිරූපණය කොට ඇත්තේ සුදු ජාතික හේවායෙකි.
2. ක්‍රි. ව. 1840 කාලයේ බ්‍රිතාන්‍යය තුළ සාහිත්‍ය අධ්‍යයන ආරම්භ වූයේ සාහිත්‍ය හදාරන්නා ඔහු ජීවත් වන අවධියේ හා අවකාශයේ පවතින පුරුදුවලින් සහ අදහස්වලින් නිදහස් වී සර්වකාලීන තිරසාර විශ්ව සත්‍යයන් හා සම්බන්ධ වේ, යන අදහස ඇතිවය. මේ අදහසේ සරල අර්ථය නම් සාහිත්‍ය නිර්මාණයක් සර්වකාලීන හා සාර්ව භෞමික සත්‍ය ප්‍රකාශයට පත් කරයි යන්න යි. සාහිත්‍ය නිර්මාණයක් අධ්‍යයනය කිරීමේ දී එය රචනා වූ

ඓතිහාසික සන්දර්භය හෝ එය කියවන විශේෂ ඓතිහාසික නිමේෂය සැලකිල්ලට ගත යුතු නැත යන අදහස් ද ඒ සමඟ ම අවධාරණය වේ.

සාහිත්‍ය අධ්‍යයනයේ පසු බිමෙහි වූ ඉහත සඳහන් අදහස්වලින් සමකාලීන යුරෝපීය මධ්‍යම පාන්තිකයන්ගේ හරපද්ධතීන් අභියෝගයට ලක් නොවී ආරක්ෂා විය. එමෙන් ම එම හර පද්ධති සමාජයේ වෙසෙන අනෙකුත් පන්තිවලට (විශේෂයෙන් නිර්ධන පන්තිය හා වැඩ කරන පන්තියට) සම්ප්‍රේෂණය කිරීම සඳහා එම හර පද්ධති විශ්වීය අදහස් නැතහොත් විශ්වීය හරපද්ධති ලෙස ප්‍රකාශ කිරීම හා අනෙක් පන්තිවලට ඒත්තු ගැන්වීම අනිවාර්යයෙන් අවශ්‍ය විය.මේ අදහස් පොදුවේ ලිබරල් මානවවාදය ලෙස හැඳින්වේ. වැඩි විස්තර සඳහා බලන්න, කාරියකරවන, සමන් එම්.(2015). සමකාලීන සාහිත්‍ය විචාර සිද්ධාන්ත -1, ලිබරල් මානවවාදය, කොළඹ:ගොඩගේ.

3. මඩුවන්වෙල දිසාවේගේ නිවස්න තවමත් මිද්දෙණිය පනාමුරේ මාර්ගයේ පිහිටා ඇත. දිසාවේ ඉතා මිටි පුද්ගලයෙකි. දිසාවේගේ අනුරුවට සමාන බොහෝ මනුෂ්‍යයන් තවමත් ඒ ප්‍රදේශවල වෙසෙන බව ප්‍රදේශයේ ඇතැම්හු පවසති. ප්‍රදේශයේ වැඩිහිටි පිරිස් සමඟ 2005 වසරේ මාර්තු මාසයේ දී මා විසින් සාකච්ඡා කරන ලදි. දිසාවේ ජන පීඩකයෙක් ලෙස හෝ ස්ත්‍රී දූෂකයෙක් ලෙස කවරෙකු විසින් හෝ සඳහන් නොකරයි. අප රටේ සංස්කෘතිය පිළිබඳ යුරෝපීයන්ගේ රචනා ප්‍රාචීනවාදී අර්ථකථන ලෙස හැඳින්විය හැකි ය. යටත්විජිත අවධියේ යුරෝපීයන් විසින් කරනු ලැබූ හැම අධ්‍යයනයකම මේ තත්වය දැකිය හැකි ය. ලංකාවේ කුල ධූරාවලියක් ඇති යන්න එලෙස නිර්මාණය කළ මිත්‍යාවකි. කුල බෙදීම ආර්ථිකමය කාර්යයක් වූ මුත් එහි ධූරාවලියක් නිර්මාණය වීම යටත්විජිත අවධියේ සිදු වූවකි. පූර්ව යටත්විජිත අවධියේ පැවති ධූරාවලී ඇතුළු නුවර හා පිට නුවර ප්‍රජාව අනුව වෙනස් විය. එම්.යූ සිල්වා, ලෝනා දේවරාජා ආදීන්ගේ අධ්‍යයනවලින් මේ කරුණ ගම්‍ය වේ.

4. රිචඩ් ඇටම්බරෝගේ: ගාන්ධි, ඩේවිට් ලීන්ගේ පැසේජ් ටු ඉන්ඩියා, බ්‍රිජ් ඔෆ් ද රිවර් ක්වායි, යන චිත්‍රපටත් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත ආසියාව තේමා කරගත් තවත් බොහෝ චිත්‍රපටත් ප්‍රාචිනවාදී වේ. මේ පිළිබඳ කරන ලද විග්‍රහයන් සල්මන් රුෂ්ඩිගේ Imaginary homelandsකෘතියේත්, සරා සුලෙරිගේ The Rhetoric of English Indiaකෘතියේත්, ජොනතන් වයිට්ගේ Recasting the World: Writing After Colonialism කෘතියේත් දැකිය හැකි ය.

5. සරච්චන්ද්‍ර සිය **කල්පනා ලෝකය** කෘතියේ ''*සැබෑ ලෝකය හා කල්පනා ලෝකය*'' යන ලිපියත් ''දුක නැති ලොවකි ඒ '' යන ලිපියත් පොදුවේ මනුෂ්‍ය ධර්මයන් ලොවට ම සම වේ යන ආස්ථානය පෙරදැරි කොට ලියැ වී ඇත.''සම්ප්‍රදායික නාට්‍ය ක්‍රමය හා නූතන වේදිකාව'' මැයින් වීමංසා එදිරිවීර සරච්චන්ද්‍ර උපහාර අංකයේ පළ ව ඇති ඒ.ජේ ගුණවර්ධන සරච්චන්ද්‍ර සමඟ කළ සාකච්ඡාව බලන්න.

6. කොම්ප්‍රදෝර් යන පෘතුගීසි වචනයේ අර්ථය ගැනුම්කාරයා යන්නයි. කොම්ප්‍රදෝරු යන යෙදුම මුල් කාලයේ භාවිත වූයේ විදේශීය සැපයුම්කරුවා හා දේශීය වෙළෙඳපොළ අතර සිටින අතරමැදියා හැඳින්වීමටයි. මාක්ස්වාදය විසින් මේ යෙදුම භාවිත කරනුයේ යටත්විජිත පාලනයට ගැති වී සිටිමින් වරප්‍රසාදිත තත්වයක් භුක්ති විඳින අතර ධනය උපයා ගන්නා ස්වදේශිය බූර්ෂුවා පන්තිය හැඳින්වීමටයි. පශ්චාත් යටත්විජිත සිද්ධාන්ත තුළ මේ යෙදුම වඩා පුළුල් අර්ථයක් වෙත තල්ලු වී ඇත. එහි දී ඊට බුද්ධිමය තත්වයන් (Intelligantsia) ද උරාගෙන ඇත. එනම් ශාස්ත්‍රාලීය උගතුන්, නිර්මාණශීලී රචකයන් හා චිත්‍ර ශිල්පීන් ඊට උදාහරණ වේ. ඔවුහු යටත්විජිත බලය හඳුනාගනිමින් ඒ කෙරෙහි විශ්වසනීය පදනමක පිහිටා නිදහස කේවල් කරති.

7. ''ග්‍රීක් නාට්‍යයේ කථකයා (කෝරස්) විසින් කෙරෙන කාර්යයක් ද, අපේ පොතේ ගුරුන්නාන්සේ වෙත පැවරිමි. ග්‍රීක් නාට්‍යයේ කථකයා, දෘෂ්‍ය ශ්‍රව්‍ය වශයෙන් දක්වන ලද සිද්ධි පිළිබඳ විවරණයක් කරයි. මනමේ නාට්‍යයේ පොතේ ගුරුන්නාන්සේ තැන් තැන්වල මෙබඳු විවරණයක් ඉදිරිපත් කරයි.''(සරච්චන්ද්‍ර, පින් ඇති සරසවි වරමක් දෙන්නේ 1985 මුද්‍රණය, 159-160 පිටු)

8. මාර්ටින් වික්‍රමසිංහ විසින් නිරූපණය කරනු ලබන 'අපේ ගම' රොමැන්ටිකරණය වූවකි. ඓන්ද්‍රීය ප්‍රකාශනයකට වඩා එය දෘෂ්ටිවාදී මැදිහත්වීමක් වේ. කොළඹ සිට පරිකල්පනය කළ ලාංකික ගම අපේ ගම ලෙස ගත හැකි ද යන ප්‍රශ්නය මෙන් ම නිව්ටන් ගුණසිංහ මතු කළ වැදගත් ප්‍රශ්නයක් වන, අඩු ම තරමින් වසර 300ක්වත්

යටත්විජිත ප්‍රදේශයක් ව පැවති කොග්ගල මලලගම වැනි ප්‍රදේශයක් තවමත් අපේ ගම ලෙස හඳුනා ගත හැකි ද යන්න ද මෙහි දී වැදගත් වේ.

9. 1981 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සස්ංථාවේ අධ්‍යාපන සේවයෙන් ප්‍රචාරය වූ, තිලක් ජයරත්න නිෂ්පාදනය කළ රූපණ වැඩසටහන, ගම්ලත් 1996. 146-147 (මනමේ නාට්‍ය සේවනය) කෘතියේ පළ කොට ඇත.

10. න් ගුගිවා තියොන්ගෝගේ *මතිගාරි* කෘතිය කෙන්යානු රජය විසින් තහනම් කරන ලදි. ඊට හේතුව වූයේ කෙන්යානු මධ්‍යම රහස් තොරතුරු කාර්යාංශය විසින් මතිගාරි නමැත්තෙකු ගොවියන් හා කම්කරුවන් අතර ප්‍රසිද්ධ වී ඇති අතර හෙතෙම කැරැල්ලකට සූදානම් වන්නේ යයි වාර්තා කිරීමයි. වැඩිදුර තොරතුරු සෙවීමේ දී මතිගාරි යනු තියොන්ගෝගේ නවකථාවේ කථා නායකයා බව හෙළි වේ. ඒ අනුව රජය විසින් කථාව තහනම්කරනු ලබන අතර සියලු පිටපත් අත්අඩංගුවට ගන්නා ලදි.

## ආශ්‍රිත මූලාශ්‍රය


අමුණුගම,සරත්.(1977).1999 මුද්‍රණය, *සංස්කෘතිය, සමාජය හා පරිසරය,* බොරැල්ල: සදීපා පොත්හල.

ගුණරත්න,දීප්ති කුමාර,ලීලාරත්න සුමිත් චාමින්ද සහ තවත් අය,2004, පරාගනය වෙනුවට ව්‍යාප්තිය:මනමේ සිංහබාහු සහ පත්තිනි අම්මා තුළ නිරූපිත''ස්ත්‍රිය''විසංයෝජනය කිරීම, ආරිය රාජකරුණා උපහාර ලිපි සංග්‍රහය, (සංස්) අමරසිංහ ජයන්ත, කාරියකරවන, සමන් එම්,කොළඹ: ගොඩගේ, පි.404-485.

ගම්ලත්, සුචරිත.(1995). *නාට්‍ය ප්‍රවේශය,* කොළඹ: ගොඩගේ.

ගම්ලත්, සුචරිත.(1989).1994 මුද්‍රණය, *බටහිර නාට්‍ය හා රංග කලාව,* කොළඹ: ගොඩගේ.

ගම්ලත්,සුචරිත.(1996). *මනමේ නාට්‍ය සේවනය,* කොළඹ: ගොඩගේ.

ජයවර්ධන,කුමාරි.(2006). සොක්කන් ලොක්කන් වූ වගයි,(පරි:) ප්‍රේමලාල් කුමාරසිරි, ආනන්ද වක්කුඹුර, කොළඹ: සමාජවිද්‍යාඥයින්ගේ සංගමය.

ඥානසීහ හිමි, හේන්පිටගෙදර.(1964) *සියබස්ලකර විස්තර වර්ණනාව,* කොළඹ: ස්වභාෂා ප්‍රකාශකයෝ.

පුඤ්ඤරතන හිමි, හාන්දුපැල්ලේ.(1941). *ලංකා ඉතිහාසය, ද්විතීය භාගය 1500-1940,* කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

ෆැනොන්, ප්‍රාන්ට්ස්.(1961).(ඉංග්‍රීසි පරිවර්ථනය-1973, The Wretched of the Earth) සිංහල පිරිවර්ථනය (1975) *මිහිතලේ අසරණයෝ,* කොළඹ 5: මාර්ග ආයතනය.

බන්ධුතිලක,මලල්ගොඩ.(1999).2004 මුද්‍රණය, *S.W.R.D.බණ්ඩාරනායක,* නුගේගොඩ: දීපානී ප්‍රකාශන.

සරච්චන්ද්‍ර ඊ.(1951).1997 මුද්‍රණය, *සිංහල නවකතා ඉතිහාසය හා විචාරය,* නුගේගොඩග: සරසවි පොත්හල.

සරච්චන්ද්‍ර ඊ.(1958).1986 මුද්‍රණය, *මනමේ,* කොළඹ: ලේක්හවුස්.

සරච්චන්ද්‍ර ඊ.(1958). 1987 මුද්‍රණය, *කල්පනා ලෝකය,* කොළඹ: ගොඩගේ

සරච්චන්ද්‍ර ඊ.(1968). 1999 මුද්‍රණය, *සිංහල ගැමි නාටකය,* කොළඹ: ගොඩගේ

සරච්චන්ද්‍ර ඊ.(1982).1999 මුද්‍රණය, *ධර්මිෂ්ට සමාජය,* කොළඹ: නිර්මල ප්‍රකාශන.

සරච්චන්ද්‍ර ඊ.(1985).1997 මුද්‍රණය, *පින් ඇති සරසවි වරමක් දෙන්නේ,* නුගේගොඩ: සරසවි පොත්හල.

සරච්චන්ද්‍ර ඊ.(1988) *දේශීය සංස්කෘතිය පිළිබඳ විමර්ශනයක්. ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජ අර්බුදය,* කොළඹ : සර්වෝදය පර්යේෂණ ආයතනය.

ගලහිටියාව.පී.බී, ධර්මදාස කේ.එන්.ඕ, කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

Amilcar, C. A. B. R. A. L. (1973). Return to the Source: Selected Speeches by Amilcar Cabral. *African Information Service Monthly Review, Press New York*, 664-65.

Amunugama, S. (1985). Anagarika Dharmapala (1864-1933) and the transformation of Sinhala Buddhist organization in a colonial setting. *Information (International Social Science Council)*, *24*(4), 697-730.

Ashcroft, B., Griffiths, G., & Tiffin, H. (2013). *P§t-colonial studies: The key concepts*. Routledge.

Barry Peter,1995,*Beginning Theory:AnIntroduction to Literary and Cultural Theory*,Manchester University Press, Manchester and New York.

Gombrich, R. (1978). Buddhism in Sinhalese Society, 1750-1900: A Study of Religious Revival and Change.

Gramsci, A. (1992). *Prison notebooks* (Vol. 2). Columbia University Press.

Malalgoda, K. (1976). *Buddhism in Sinhalese society, 1750-1900: a study of religious revival and change*. Univ of California Press.

Obeyesekere, G. (1970). Religious symbolism and political change in Ceylon.

Obeyesekere, G. (1963). The great tradition and the little in the perspective of Sinhalese Buddhism. *The Journal of Asian Studies*, *22*(2), 139-153.

Paul, B. (1957). The Political Economy of Growth. *Monthly Review*, *195*.Said Edward. 1978.

Perera Nihal, 1999,Decolonizing Ceylon: *Colonialism Nationalism and the Politics of Space in Sri Lanka,*Oxford University press,new york.

07

**ශ්‍රාවක රසවින්දනය උදෙසා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ශාස්ත්‍රීය සංග්‍රහය ඇතුළු නිර්මාණ ලබාදුන් දායකත්වය පිළිබඳ විමර්ශනයක්**

ඉන්දික ජයරත්න[7]

**හැඳින්වීම**

ගුවන් විදුලි ශ්‍රාවක ප්‍රජාවගේ උසස් රසවින්දනය වැඩිදියුණු කරනු පිණිස පුරෝගාමී මෙහෙවරක් කළ විද්වතෙකු වන්නේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයි. සාහිත්‍ය, වේදිකා නාට්‍ය, ගීත සාහිත්‍ය සහ විචාර කලාව පෝෂණය කිරීමෙහිලා අද්විතීය මෙහෙවරක් කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, සිය නිර්මාණකරණයෙහි ප්‍රමුඛ ආයතනයක් කොට ඇත්තේ ලංකා ගුවන් විදුලියයි. ඔහු ගුවන් විදුලියෙන් ග්‍රාහක ප්‍රජාවට සන්නිවේදනය කළ වැඩසටහන් අතරින් බොහොමයක් අදද ජාතික ගුවන්විදුලිය නිර්මාණාත්මක වෙනස්කම් කරමින් ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ සාහිත්‍ය මෙහෙවර උදෙසා ලංකා ගුවන් විදුලිය ලබාදී ඇත්තේ විශාල දායකත්වයකි. එලෙසම, ගුවන් විදුලියට උසස් වින්දනාත්මක වැඩසටහන් ආකෘති හඳුන්වාදීමේ පුරෝගාමියෙකු වන්නේද මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයි. මෙම ලිපියෙන් ශ්‍රාවක රසවින්දනය උදෙසා මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ ශාස්ත්‍රීය සංග්‍රහය ඇතුළු නිර්මාණ ලබාදුන් දායකත්වය පිළිබඳ විමර්ශනය කෙරේ.

**විමර්ශනය**

ගුවන් විදුලි ගීත කලාවේ වැදගත් සංධිස්ථානයක් වන්නේ 1950 දශකයේ දෙවන භාගයේදී ගීත නාටක හඳුන්වා දීමයි. තේවිස් ගුරුගේ සහ ඩන්ස්ටන් ද සිල්වාගේ මඟ පෙන්වීම මත ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විසින් මනෝහාරී ගීත නාටකය ලියන ලදී. මීට සංගීතය සපයා ඇත්තේ ඩන්ස්ටන් ද සිල්වා විසිනි. එය නිෂ්පාදනය කළේ තේවිස් ගුරුගේය. 1955 දෙසැම්බර් 08 වැනිදා මනෝහාරී ගීත නාටකය ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරය වූ බව නන්දන කරුණානායකගේ "හැටහය වසරක ගුවන් විදුලිය" කෘතිය පෙන්වා දෙයි. එහි වැඩිදුරටත් සඳහන් වන්නේ මනෝහාරී ගීත නාටකය දැඩි ශ්‍රාවක වින්දනයට හේතු වූ බවයි.

මානවසිංහ ලංකා ගුවන් විදුලිය සඳහා හඳුන්වා දුන් ගීත නාටක සම්ප්‍රදාය විමල් අභයසුන්දර තවදුරටත් ඉදිරියට ගෙන ආවේය. මහගම සේකර, ඩෝල්ටන් අල්විස්, තිලක් රත්නකාර, අරිසෙන් අහුබුදු, එදිරිවීර සරච්චන්ද්‍ර ආදීන් මුල් යුගයේ ගුවන් විදුලි ගීත නාටක සම්ප්‍රදාය පෝෂණය කළ සාහිත්‍යකරුවෝය. සුනන්ද මහේන්ද්‍ර, ධර්ම ශ්‍රී කුරුප්පු, අනුරාධ සෙනෙවිරත්න, ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, තලංගම ප්‍රේමදාස, සරත් විමලවීර, සුනිල් ආරියරත්න ආදීන් පසුකාලීන ගුවන් විදුලි ගීත නාට්‍ය සම්ප්‍රදාය තවදුරටත් පෝෂණය කිරීමට දායක වූ සාහිත්‍යකරුවන්ය. ලංකා ගුවන් විදුලිය, දේශීය ජන ගී පිළිබඳවද උනන්දුවක් දක්වා ඇත. මුල්ම අවදියේදී ලංකා ගුවන්විදුලියට ජන ගී හඳුන්වා දී ඇත්තේ රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් විසිනි. 1953 දී පත් කෙරුණු එන්. ඊ. වීරසූරිය කොමිසම ගුවන් විදුලිය දේශීය සංගීතයක් ගොඩනැගීමට ජන ගී ක්ෂේත්‍රය පිළිබඳව උනන්දු වූ බව පෙන්වා දී තිබේ. 1970 පෙබරවාරි මාසයේදී ගුවන් විදුලි සංස්ථාව විසින් සංගීත පර්යේෂණ අංශයක් පිහිටුවීම, ලංකා ගුවන් විදුලිය සංගීත ක්ෂේත්‍රය සඳහා දක්වන ලද වැදගත්

[7] සිංහල සේවා අධ්‍යක්ෂ, හිටපු ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
බී.ඒ. (කැලණිය), එම්.ඒ. (කොළඹ)

මැදිහත්වීමකි. මෙහි ප්‍රධානියා වශයෙන් පත්වූයේ සී. ද එස්.කුලතිලකය. ඔහු ඉන්දියාවේ විශ්වභාරතී සංගීත පීඨයේ උපාධිධරයෙකි. ලාංකීය ගුවන් විදුලි ශ්‍රාවකයාට ජන ගී වැඩි වශයෙන් ශ්‍රවණය කිරීමට අවස්ථාව ලැබුණේ සී. ද එස්. කුලතිලකගේ මැදිහත් වීම නිසාය. ලංකා ගුවන් විදුලිය මෙරට ශ්‍රාවක ප්‍රජාවගේ රසවින්දනය සඳහා සංගීත ක්ෂේත්‍රයෙන් විශාල දායකත්වයක් ලබාදී ඇත. සරල ගී ශිල්පීන් ජාතියට හඳුන්වා දී ඇත්තේ ලංකා ගුවන් විදුලිය විසිනි. විශිෂ්ට ශ්‍රේණිය, **A** ශ්‍රේණිය හා **B** ශ්‍රේණිය වශයෙන් සරල ගී ශිල්පීන් වර්ගීකරණය කරමින් ඔවුන්ගේ ගීත ප්‍රචාරය කිරීමටත්, නව ගී නිර්මාණ ගුවන් විදුලි සංගීත අංශය විසින් නිෂ්පාදනය කොට ප්‍රචාරය කිරීමටත් දැක්වූ දායකත්වය ලාංකිය ගුවන් විදුලි ශ්‍රාවකයාගේ සංගීතමය රසභාවයන් ප්‍රමුදිත කිරීමට විශාල දායකත්වයක් සපයා තිබේ.

සංගීතය පිළිබඳව ශ්‍රාවක ප්‍රජාව දැනුවත් කිරීම සහ ඔවුන් තුළ ඒ පිළිබඳ රසාස්වාදන ශක්තිය වර්ධනය කරන්නට ඉවහල්වන වැඩසටහන් බොහෝමයක් 1940 දශකය මැද භාගයේ සිට ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරය විය. මෙම වැඩසටහන්වලට අමතරව ශ්‍රාවක ප්‍රජාවගේ උසස් රසවින්දනය සඳහා ශාස්ත්‍රීය වැඩසටහන් මාලාවක්ද ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරය කිරීම 1950 දශකය මුල් භාගයේ සිට ආරම්භ වූයේය. ඒ අනුව,"1951 ජුනි මස 25 වෙනිදා සිට 'ශාස්ත්‍රීය සංග්‍රහය' ත්, 1952 ජනවාරි 31 වෙනිදා 'ද්විතීය සංග්‍රහය' ත් ආරම්භ කෙරිණි" (නානායක්කාර, 2008, පි-186). මේවා එදිරිවීර සරච්චන්ද්‍රගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද වැඩසටහන්ය. මීට පූර්වයෙන් එදිරිවීර සරච්චන්ද්‍රගේ මඟ පෙන්වීමෙන් 1950 අගෝස්තු මාසයේ "යෞවන සමාජය"නමින් වැඩසටහනක්ද ආරම්භ වී තිබේ. ශාස්ත්‍රීය ගායනා, වාදන, නාට්‍යය, විශ්ව සාහිත්‍යය කතා හා සාකච්ඡා මේවායේ ප්‍රධාන විශේෂාංගයෝ වූහ. කලාව හා රසවින්දනාත්මක තොරතුරු විවේචනාත්මක විශ්ලේෂණ, විමර්ශන හා ශාස්ත්‍රීය විග්‍රහයන් මඟින් මෙම වැඩසටහන්හි අන්තර්ගතය පෝෂණය විය.

ජාතික ගුවන් විදුලියේ අද දක්වාම ප්‍රචාරය වන වැඩසටහනක් වන්නේ ශාස්ත්‍රීය සංග්‍රහයයි. එදිරිවීර සරච්චන්ද්‍රගේ මඟපෙන්වීමෙන් මීට දශක 7 කට පෙර ආරම්භ වූ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන තවදුරටත් අඛණ්ඩව ග්‍රාහක ප්‍රජාව වෙත ගෙන ඒමට ජාතික ගුවන් විදුලිය කටයුතු කර ඇත. උසස් රසවින්දනයක් අපේක්ෂා කරන ගුවන් විදුලි ශ්‍රාවක ප්‍රජාව දැනුමෙන් පෝෂණය කිරීමට ශාස්ත්‍රීය සංග්‍රහය ලබාදෙන පිටිවහල විශාලය. එදිරිවීර සරච්චන්ද්‍රගේ මඟපෙන්වීමෙන් ආරම්භ වූ මෙම වැඩසටහන සඳහා එසමයෙහි මෙරට ප්‍රමුඛ පෙළේ විද්වතුන් රැසක් සහභාගී වී තිබේ. "මහාචාර්ය ජී. පී. මලලසේකර, මුදලිඳු ඊ. ඒ. අබේසේකර, පී. බී. අල්විස් පෙරේරා, චාල්ස් සිල්වා ගුණසිංහ, එල්. ටී. පී. මංජු ශ්‍රී, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, රෙජී සිරිවර්ධන, ඒ. පී. ගුණරත්න, මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය ආනන්ද ගුරුගේ, ආචාර්ය තෙන්නකෝන් විමලානන්ද, පණ්ඩිත ගුණපාල සේනාධීර, ආචාර්ය එම්. බී. ආරියපාල, ආචාර්ය හේමපාල විජේවර්ධන, ආචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න, ආචාර්ය එෆ්. ආර්. ජයසූරිය, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඩී. අමරදේව, පණ්ඩිත විලියම් අල්විස්, එම්. ජේ. පෙරේරා, ලයනල් අල්ගම, සදානන්ද පට්ටිආරච්චි, එඩ්වින් සමරදිවාකර, මඩවල එස්. රත්නායක, ආචාර්ය නන්දදාස කෝදාගොඩ, ආචාර්ය කේ. එන්. ජයතිලක, බී. වික්ටර් පෙරේරා, ආචාර්ය තිලක් රත්නකාර, ෂෙල්ටන් ප්‍රේමරත්න, එච්.ඩබ්ලිව් රූපසිංහ, ඩී. ආර්. පීරිස්, පී. වී. නන්දසිරි ආදි විද්වතුන් හා පූජ්‍ය මහාචාර්ය බඹරැන්දේ සිරිසීවලී, පූජ්‍ය කළුකොඳයාවේ පඤ්ඤාසේකර, පූජ්‍ය කඹුරුපිටියේ වනරතන, පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ, පූජ්‍ය රේරුකානේ චන්දවිමල, පූජ්‍ය ඉඳුරුවේ උත්තරානන්ද, පූජ්‍ය වැලිවිටියේ සෝරත, පූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත, පූජ්‍ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර, පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති යන ගෞරවණීය භික්ෂූන් වහන්සේ ද, පූජ්‍ය ඒ. ජේ. ද එස්. වීරසිංහ දේවගැතිතුමා හා ගරු මර්සලීන් ජයකොඩි පියතුමා ඇතුළු පිරිසක් ද විටින් විට එක්වූ හ" (නානායක්කාර, 2008, පි.186-187).

මහාචාර්ය සරච්චන්ද්‍රගේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන විශාල ශ්‍රාවක ප්‍රජාවකගේ ආකර්ෂණය දිනාගත් වැඩසටහනකි. ඔහු විසින් තරුණ තරුණියන් වෙනුවෙන් ආරම්භ කරන ලද යෞවන සමාජය වැඩසටහන තරුණ නිර්මාණකරුවන්ගේ කෙටි කතා, නාට්‍ය ආදී නිර්මාණ සඳහා අවස්ථාව ලබාදුන් වැඩසටහනකි.

පසු කලෙක සාහිත්‍ය ක්ෂේත්‍රයේ ජනප්‍රිය ලේඛකයන් වූ බොහෝ දෙනෙකුට සිය නිර්මාණ සඳහා යෞවන සමාජය වේදිකාවක් නිර්මාණය කර තිබුණේය. මහා බ්‍රිතාන්‍යයේ බී.බී.සී ආයතනයේ ප්‍රචාරය වූ ගුවන් විදුලි නාට්‍යවලට සවන්දීමේ මහත් ආස්වාදයක් ලද සරච්චන්ද්‍ර එසමයෙහි ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරය වූ ගුවන් විදුලි නාට්‍ය පිළිබඳව සිලෝන් ඔබ්සර්වර් පුවත්පතට විවේචනාත්මක ලිපි පෙළක් ලිව්වේය. ඔහු එම ලිපි මාලාවේ පෙන්වා දී ඇත්තේ බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයේ ගුවන් විදුලි නාට්‍ය වලට සාපේක්ෂව ලංකා ගුවන් විදුලියේ නාට්‍ය ගුණාත්මක ඒවා නොවුණ බවයි. මෙම ලිපි මාලාව පළවීමෙන් අනතුරුව එවකට ගුවන් විදුලි අධ්‍යක්ෂවරයා සරච්චන්ද්‍රට ලිපියක් යොමු කරමින් අලුත් වැඩසටහනක් ආරම්භ කිරීමට ආරාධනය කළ බව එදිරිවීර සරච්චන්ද්‍ර සිය "පිං ඇති සරසවි වරමක් දෙන්නේ" කෘතියේ සටහන් කර ඇත.

එදිරිවීර සරච්චන්ද්‍ර සමකාලීන සිංහල සාහිත්‍යයේ, නවකතාවේ සහ නාට්‍යයේ පුනර්ජීවය උදෙසා විශාල දායකත්වයක් ලබා දුන්නේය. ඔහු සන්නිවේදන මාධ්‍යයක් ලෙස ලංකා ගුවන් විදුලිය හරහා තවදුරටත් සිංහල සාහිත්‍යයේ ප්‍රබෝධය උදෙසා වෙසෙසි කාර්යභාරයක් කළේය. 1950 දශකය ආරම්භයේ ලංකා ගුවන් විදුලියේ වැඩසටහන් සඳහා සම්පත්දායකයෙකු ලෙස සම්බන්ධ වන ඔහු ගුවන් විදුලි නාට්‍ය මෙන්ම තවත් සාහිත්‍යමය වැඩසටහන් කිහිපයකට දායකත්වය ලබා දී තිබේ. ඔහු සම්බන්ධ වූ ප්‍රථම ගුවන් විදුලි වැඩසටහන් මාලාව වන්නේ "යෞවන සමාජය" යි. ශාස්ත්‍රීය සාකච්ඡා, ගායන, වාදන, නාට්‍ය හා කතා මෙහි ප්‍රධාන විශේෂාංග විය. කලාව සහ රසවින්දනය, විචාරය හා විමර්ශනය මගින් මෙම වැඩසටහන්හි අන්තර්ගතය පෝෂණය වූයේය. එදිරිවීර සරච්චන්ද්‍ර "ද්විතීය සංග්‍රහය" නම් වැඩසටහන ආරම්භ කරන්නේ 1951 ජනවාරි 31 වෙනිදාය. එම වැඩසටහනද විවිධ සාහිත්‍යමය නිර්මාණවලින් අන්තර්ගත වූවකි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රස්තුත වී ඇති ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන එදිරිවීර සරච්චන්ද්‍රගේ පුරෝගාමීත්වයෙන් ආරම්භ වන්නේ 1951 ජූනි මස 25 වැනිදාය. එදිරිවීර සරච්චන්ද්‍ර යනු ලාංකීය කලා සංස්කෘතියේ විවිධ ක්ෂේත්‍රයන්හි විසිර පැතිර ගිය දැවැන්ත චරිතයකි. ඔහු සාහිත්‍ය කලා ක්ෂේත්‍රය ප්‍රභාවත් කළ පහන් ටැඹක් වැනිය. සරච්චන්ද්‍රගේ ලංකා ගුවන් විදුලියේ සාහිත්‍ය මෙහෙවර වඩා උසස් තලයකට ගෙනඒමට මඟ විවර කළ කේන්ද්‍රීය වැඩසටහන වහානි ශාස්ත්‍රීය සංග්‍රහයයි. ලංකා ගුවන් විදුලිය ප්‍රථම වරට ගැමි සංගීතය සහ ජන සංගීතය පිළිබඳ පර්යේෂණ කළ ආයතනයයි. බටහිර සංගීතය, උත්තර භාරතීය සංගීතය හදාරා ඇති සරච්චන්ද්‍ර ලංකාවට පැමිණි පසු දේශීය සංගීතය ඇසුරින් පෝෂණය වූ ගැමි සංගීතයත්, ජන සංගීතයත් පිළිබඳව තම ශාස්ත්‍රීය කාර්යයන්ට ලංකා ගුවන් විදුලිය විසින් ඔහුට වටිනා අවස්ථාවක් සලසා දුන්නේය. එම අවස්ථාවෙන් ඔහු යෞවන සමාජය, ද්විතීය සංග්‍රහය සහ ශාස්ත්‍රීය සංග්‍රහය යන උසස් රසවින්දනාත්මක වැඩසටහන් ගුවන් විදුලි ශ්‍රාවකයාට හඳුන්වා දුන්නේය. ලංකා ගුවන් විදුලිය තුළ ගුවන් විදුලි නාට්‍ය පිළිබඳ සාධනීය ප්‍රවණතාවක් නොමැති අවදියක ඔහු සරච්චන්ද්‍ර ආකෘතියේ නාට්‍ය වේදිකාවට හඳුන්වා දීමට ප්‍රථම ලංකා ගුවන් විදුලිය සඳහා ගුවන් විදුලි නාට්‍ය රචනා කර ඇත. "නොරත රත" යනු සරච්චන්ද්‍ර ගුවන් විදුලියට රචනා කළ නාට්‍යයකි. වේදිකාවෙන් දෘශ්‍ය කාව්‍ය ඉදිරිපත් කිරීමට පෙර සරච්චන්ද්‍ර ගුවන් විදුලියෙන් ශ්‍රව්‍ය කාව්‍ය හෙවත් ගුවන් විදුලි නාට්‍යකරණයට පිටපත් සම්පාදනය කර ඇත්තේය. "රත්තරන්", "සත්ව කරුණාව", "තරුණ ලේඛකයා", "වළ ඉහගෙන කෑම" යනු සරච්චන්ද්‍ර ගුවන් විදුලියට ඔහු රචනා කළ නාට්‍ය අතුරින් කිහිපයකි.

එදිරිවීර සරච්චන්ද්‍ර සිය ගුවන් විදුලි වැඩසටහන් වෙතින් නව පරපුරක්ද ගුවන් විදුලියට හඳුන්වා දුන්නේය. පී. වැලිකල, ලොයිඩ් වාකිෂ්ඨ, චිත්‍රා වාකිෂ්ඨ, ජේ.එච්. ජයවර්ධන, වොලී නානායක්කාර ආදින් සරච්චන්ද්‍රගේ නාට්‍ය ශිල්පීන් වූ අතර, පසුකාලීනව මේ අය අතුරින් බොහෝ දෙනෙක් නාට්‍ය පිටපත් රචකයින් හා නාට්‍ය නිෂ්පාදකයින්ද වූහ. නව කතාව, කෙටි කතාව හා දෘශ්‍ය කාව්‍යයේදී භාෂාව පිළිබඳ සරච්චන්ද්‍ර විශේෂ අවධානයක් යොමු කළේ යම් සේද, ගුවන් විදුලි නාට්‍ය පිටපත් රචනයේදීද ඔහු ඒ පිළිබඳ උනන්දුවක් දැක්වූවේය. 1954-55 වසරේදී ඔහු ගුවන් විදුලියට රචනා කළ "පෙමතො ජායති සොකො" නාට්‍යය පසුකලෙක ඒ නමින්ම වේදිකා නාට්‍යයක් ලෙස සකස් කළේය. ගුවන් විදුලි නාට්‍ය හා වේදිකා නාට්‍ය අතර ඇති සමානතා මෙන්ම විසමතා පිළිබඳවද මනා අවබෝධයින් යුතුව අදාළ

ප්‍රේක්ෂකාගාරයට ගැළපෙන ලෙස වචන උපයෝගී කරගනිමින් නාට්‍ය නිෂ්පාදනයට සරච්චන්ද්‍ර දැක්වූයේ සුවිශේෂී දක්ෂතාවකි.

ගැමි කලාව ගුවන් විදුලියට ගෙන ඒමට මූලික වූ එදිරිවීර සරච්චන්ද්‍ර පසු කලෙක "සිංහල ගැමි නාටකය" (1968) යනුවෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථයක්ද සම්පාදනය කළේය. සරච්චන්ද්‍ර ගැමි කලාවන්, ජන කලාවන් ගුවන් විදුලි නිර්මාණ සඳහා උපයෝගී කරගත්තා සේම, එම කලාවන් ඇසුරින් ගුවන් විදුලි නිර්මාණයන්ද කළේය. 1956 වේදිකා ගතකරන ලද මනමේ නාටකය 1961 වේදිකා ගතකරන ලද සිංහබාහු වැනි දෘශ්‍ය කලා නිර්මාණ සඳහා නාඩගම් ශෛලිය අන්තර්ගත වී තිබේ. චාල්ස් ද සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ ප්‍රමුඛ ඔහුගේ පවුලේ බොහෝ දෙනෙකු ගුවන්විදුලියට සම්බන්ධ වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර සහ ඔවුන් අතර පැවති සම්බන්ධතාවයේ ප්‍රතිඵල වශයෙනි. චාල්ස් ද සිල්වා ගුණසිංහ සාම්ප්‍රදායික වාද්‍ය ශිල්පියෙකු වූ අතර, ඔහුගේ පාරම්පරික ඥානය සරච්චන්ද්‍ර සිය දෘශ්‍යකලා නිර්මාණ සඳහා උපයෝගී කර ගත්තේය. ඔවුන් සතු ශිල්පීය දැනුම, පාරම්පරික ඥානය ගුවන් විදුලි නිර්මාණ හරහා රටට දායාද කිරීමට සරච්චන්ද්‍ර කටයුතු කළේය. මහාචාර්ය රතන්ජංකර් ලංකාවේ සංගීත ශිල්පීන් ශ්‍රේණිගත කිරීම ආරම්භ කිරීමත් සමග, සංගීතය පිළිබඳ ශ්‍රාවකයා දැනුවත් කරන සහ ඔවුන්ගේ රසවින්දන ශක්තීන් වර්ධනය කරන විශේෂ වැඩසටහන් ගුවන් විදුලියේ ප්‍රචාරය කිරීම, 1950 දශකය පමණ වන විට ආරම්භ වූයේය. මෙම වැඩසටහන්වලට සමගාමීව සරච්චන්ද්‍රගේ මූලිකත්වයෙන් ආරම්භ වූ යෞවන සමාජය, ශාස්ත්‍රීය සංග්‍රහය සහ ද්වීතිය සංග්‍රහය රසවින්දනය සඳහා විශාල දායකත්වයක් සපයන ලද අලුත් ගුවන් විදුලි වැඩසටහන් විය. ශාස්ත්‍රීය ගායනය, ශාස්ත්‍රීය වාදනය, කතා, ප්‍රබුද්ධ සාකච්ඡා මෙම වැඩසටහන්හි විශේෂාංග විය. රසවින්දනාත්මක තොරතුරු, ශාස්ත්‍රීය විචාර හා විමර්ශනද මේවායේ අන්තර්ගතය පෝෂණය කළ තවත් විශේෂාංගයන්ය. එදිරිවීර සරච්චන්ද්‍ර ප්‍රමුඛ එසමයෙහි සිටි ප්‍රමුඛ විද්වත්හු රැසක් මෙම වැඩසටහන් සඳහා සහභාගී වූහ. මහාචාර්ය රතන්ජංකර් ගුවන් විදුලි ශිල්පීන් පර්යේෂණයට භාජනය කොට, ඔවුන් වර්ගීකරණය කිරීමෙන් පසු ලංකා ගුවන් විදුලියේ සංගීත, ගායන හා වාදන වැඩසටහන්හි ගුණාත්මක වර්ධනයක් ඇති වී තිබේ. 1953 නොවැම්බර් 03 වැනිදා ලංකා ගුවන් විදුලි සඟරාව මහාචාර්ය රතන්ජංකර්ගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් ඒ බව මෙසේ සටහන් කර තිබේ. "සිංහල ශාස්ත්‍රීය හා සිංහල සරල සංගීතය ඉදිරිපත් කළ ආකාරය තුන් අවුරුද්දකට කලින් තිබුණාට වඩා දියුණු වී ඇති බව සතුටින් වාර්තා කරමි". මහාචාර්ය රතන්ජංකර් දෙවන වරට ලංකාවට පැමිණ ඇත්තේ 1952 අප්‍රේල් මස 24 වැනිදාය. මේ වන විට එදිරිවීර සරච්චන්ද්‍රගේ ප්‍රධානත්වයෙන් උසස් රසවින්දනය සඳහා වූ ප්‍රධාන වැඩසටහන් ද්විත්වය වන ශාස්ත්‍රීය සංග්‍රහය සහ ද්වීතිය සංග්‍රහය ආරම්භ වී තිබුණි. මහාචාර්ය රතන්ජංකර්ගේ ඇගයීමෙන් තහවුරු වන්නේ ගුවන් විදුලියේ ශාස්ත්‍රීය වැඩසටහන්හි ගුණාත්මක වැඩි දියුණුවක් සිදුවී තිබෙන බවයි. ජනතා රසවින්දනය වැඩිදියුණුවට සේම, ඉහළ රසවින්දනයකට ඉවහල් වන ගුණාත්මක වැඩසටහන් ලංකා ගුවන් විදුලිය මෙසමයෙහි ශ්‍රාවකයාට සමීප කර ඇති බවද මෙමගින් තහවුරු වේ. තවද, ශිල්පීන්ගේ වර්ගීකරණය සහ දක්ෂතා පිරිපුන් ශිල්පීන් ශාස්ත්‍රීය වැඩසටහන් සඳහා සහභාගී වීමද මෙම වැඩසටහන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු වීමට බලපාන ලද වැදගත් හේතු සාධක ලෙස හැඳින්විය හැකිය.

1951 ජූනි මස 25 වෙනිදා ආරම්භ වූ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන ලාංකීය ගුවන් විදුලි ශ්‍රාවකයාට උසස් රසවින්දනය සහ නව දැනුම ලබාදීම අරමුණු කොටගත් වැඩසටහනක් වූවේය. මේ ලිපියෙන් අප අධ්‍යයනය කරන්නේ නූතන සිංහල සාහිත්‍ය රසවින්දනය සඳහා ශාස්ත්‍රීය සංග්‍රහය වෙතින් ලද දායකත්වයයි. 1951 සිට මේ දක්වා (2022) වසර 71 ක් ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන ලාංකීය ගුවන් විදුලි ශ්‍රාවකයාගේ රසවින්දන ශක්තිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කර තිබේ. ශාස්ත්‍රීය සංග්‍රහය වැඩසටහන ප්‍රචාරය වූ අවස්ථාවේදී ශ්‍රවණය කළ පිරිස හැර එම අවස්ථාවේදී ශ්‍රවණය කළ නොහැකි වූ පිරිසට නැවත ශ්‍රවණය කිරීමට නොහැකි වේ. තවද, ප්‍රචාරය වන අවස්ථාවේදී ශ්‍රවණය කළ ශ්‍රාවකයාට වුවද එහි අන්තර්ගතයන් තවදුරටත් අවබෝධ කරගැනීමට අවස්ථාවක් නොවූවේය. මෙම තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් එවකට ගුවන් විදුලි බලධාරීන් ලංකා ගුවන් විදුලියේ ප්‍රචාරය වූ ශාස්ත්‍රීය සංග්‍රහය ඇතුළු උසස් වැඩසටහන් ගුවන් විදුලි ශ්‍රාවකයාට මෙන්ම පාඨක ප්‍රජාවටද කියැවිය හැකි පරිදි

මුද්‍රිත පිටපතක් ලෙස ඉදිරිපත් කිරීමට පියවර ගත්තේය. ගුවන් විදුලි "තරංගණී" සඟරාව ආරම්භ වන්නේ මෙම කාරණාව පෙරදැරි කරගෙනය. තරංගණී සඟරාව ආරම්භ කිරීමට මුල් වූයේ ලංකා සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු වූ එම්.ජේ.පෙරේරාය. එහි ආරම්භක සංස්කාරකවරයා වූයේ කුලසිරි අමරතුංගයි.

සමකාලීන ගුවන් විදුලි කර්මාන්තය ශ්‍රාවක ප්‍රජාවට ඉදිරිපත් කරන බොහෝ සංදේශ හරයාත්මක අතින් අතිශය දුර්වල මට්ටමක පවතී. එහි ගුණාත්මකභාවය දුර්වල මට්ටමක පවතින අතර, මෙම බොහෝ වැඩසටහන් සැහැල්ලුකාරක පුරවැසි මානසිකත්වයක් නිර්මාණය කරනු ලබයි. එවැනි පසුබිමක ශ්‍රාවකයාගේ දැනුම, අවබෝධය, රසවින්දනය වැඩිදියුණු කරමින් ප්‍රබුද්ධ ශ්‍රාවක ප්‍රජාවක් බිහි කරනු පිණිස ශාස්ත්‍රීය සංග්‍රහය ලබාදෙන පිටිවහල වඩා විශාලය. බුද්ධිමත් ශ්‍රාවක ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණින් ඒ පිළිබඳව අධ්‍යයනය කොට මෙම තොරතුරු මෙහි ඉදිරිපත් කර ඇත.

**සමාලෝචනය**

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ලංකා ගුවන් විදුලියේ වැඩසටහන් සඳහා සම්බන්ධ වන්නේ 1950 දශකයේය. 1970 දශකය අග භාගය දක්වා ඔහු ගුවන් විදුලියේ උසස් රසවින්දනාත්මක වැඩසටහන් නිර්මාණකරණය සඳහා සෘජුවම සම්බන්ධ වී තිබේ. ලංකා ගුවන් විදුලියට උසස් රසවින්දනය පිළිබඳව අලුත් වැඩසටහන් ආකෘති සමුදායක් හඳුන්වාදීමට පුරෝගාමීවූවන් අතුරින් ප්‍රමුඛස්ථානයක් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රට හිමි වේ. ශාස්ත්‍රීය සංග්‍රහය, ගුවන්විදුලි රඟ මඬල, විශ්ව සාහිත්‍යය යනු තවදුරටත් ගුවන් විදුලිය ශ්‍රාවක ප්‍රජාවගේ උසස් රසවින්දනය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර හඳුන්වා දුන් වැඩසටහන් ආකෘතින්ය. ශ්‍රාවකයා නව දැනුමින් පෝෂණය කිරීමට සහ ඔහුට උසස් රසවින්දනය සඳහා සමීප අත්දැකීමක් ලබාදීමට සරච්චන්ද්‍ර හඳුන්වා දුන් වැඩසටහන් තවමත් පුරෝගාමී මෙහෙවරක් කරන බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**


ඇතුගල, ඒ. (2019). *සංවර්ධනය සඳහා සන්නිවේදනය*, කොළඹ 10: ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්.

කරුණානායක, එන්. (1990). *හැටහය වසරක ගුවන් විදුලිය*, මොරටුව: ජන කේන්ද්‍රය.

කොළඹගේ, ඩී. එම්. (1980). *ගුවන් විදුලි වංශය*. කොළඹ: සීමාසහිත ඇම් ඩී ගුණසේන සහ සමාගම.

නානායක්කාර, එස්. (2008). *ජාතික සංවර්ධනය හා ලාංකේය ගුවන් විදුලිය*, කොළඹ 10: සීමාසහිත ඇස් ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම.

මල්ලවාරච්චි, යූ., බාලසූරිය, එස්., මොරටුවේගම, එච්. එම්., සහ විජේසූරිය, එස්. (1987). *එදිරිවීර සරච්චන්ද්‍ර උපහාර අංකය විමංසා*, කොළඹ 10: සීමාසහිත ඇස් ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම.

විජිත, ඒ. (2003). කෝට්ටේ *යුගයේ සංදේශ විවරණය*, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

08

## සරච්චන්ද්‍ර සන්නිවේදන භූමිකාව

### සඳගෝමි කෝපරහේවා [8]

විසිවන සියවසේ සිංහල සාහිත්‍යය, විචාර කලාව හා නාට්‍ය කලාව යන ක්ෂේත්‍රවල අභිවර්ධනය වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක් හා බුද්ධිමය සම්ප්‍රදානයක් ලබා දුන් කීර්තිමත් ශාස්ත්‍රාලයීය විද්වතකු ලෙස සම්භාවනාවට පාත්‍ර වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර (1914 – 1996) තම ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ජීවිතය විශ්වවිද්‍යාල දේශනවලට පමණක් සීමා නොකෙළේය. සිය ශාස්ත්‍ර කලා ජීවිතයේ දි පුවත්පත, ගුවන්විදුලිය වැනි ජනමාධ්‍ය මෙන්ම නාට්‍යය වැනි කලා මාධ්‍ය භාවිත කරමින් පාඨක, ශ්‍රාවක හා ප්‍රේක්ෂක ජනයා අතර උසස් රසඥතාවක් ඇති කිරීම සඳහා අඩසියවසක පමණ කාලයක් මුළුල්ලේ එදිරිවීර සරච්චන්ද්‍රයන් ඉටු කළ සන්නිවේදන භූමිකාව විද්‍යාර්ථියකුගේ අවධානයට ලක් විය යුතු මාතෘකාවකි.ඒ මෙහෙවර ලුහුඬින් විමසා බැලීම මේ ලිපියේ අරමුණ යි. පුවත්පත් සඟරා ආදියට ලිපි සැපයීමෙන් ද එකල තිබුණු එක ම විද්‍යුත් සන්නිවේදන මාධ්‍යය වූ ගුවන් විදුලිය ඔස්සේ වැඩසටහන් සම්පාදනය කිරීමෙන් දසරච්චන්ද්‍ර සිදු කළ මෙහෙවර පිළිබඳ තොරතුරු ලබාගත හැක්කේ ඒ පිළිබඳව සිදු කරන වැඩිදුර ගවේෂණයකින් පමණි. මහාචාර්ය සරච්චන්ද්‍ර සිය ජීවිත කාලයේ දී පුවත්පත් සඟරා ආදියට ලියූ ලිපි හා සහභාගී වූ ගුවන් විදුලි වැඩසටහන්, සාකච්ඡා පිළිබඳ සම්පූර්ණ නාමාවලියක් සම්පාදනය වී නොමැති හෙයින් ඒ පිළිබඳ තොරතුරු ලබා ගත හැක්කේ අල්ප වශයෙනි. එවැනි ගවේෂණයක් සඳහා අවශ්‍ය මූලික පසුබිම සැකසීම ද මේ සටහනින් සිදු වේ. එසේ ම මේ රටේ ජනමාධ්‍ය හැසිරවිය යුතු ආකාරය ගැන සරච්චන්ද්‍ර දක්වා ඇති අදහස් කෙරේ ද මෙහි දි අවධානය යොමු කර ඇත.

1930 දශකයේ දී කොළඹ පිහිටි ලංකා යුනිවර්සිටි කොලීජියේ දී ශාස්ත්‍ර හදාරා ඉන්පසුව ඉන්දියාවේ ශාන්ති නිකේතනයෙන් ද ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ද ශාස්ත්‍රීය ශික්ෂණයක් ලැබ ලංකා විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු ලෙස 1940 දශකයේ සිට විශ්වවිද්‍යාල ප්‍රජාව සමඟ කටයුතු කළ එදිරිවීර සරච්චන්ද්‍ර නූතන සිංහල නාට්‍ය කලාවේ පුනරුදයක් ඇති කිරීමටත් සිංහල විචාර කලාවෙහි මංපෙත් හෙළිපෙහෙළි කරන්නටත් පුරෝගාමී මෙහෙවරක් සිදු කළේය. විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස තම ඉගැන්වීම කටයුතු සිදු කරන අතර නාට්‍ය නිෂ්පාදනය, ග්‍රන්ථ රචනය, ශාස්ත්‍රීය දේශන හා සාකච්ඡාවලට සහභාගී වීම මෙන්ම පුවත්පත් සඟරාදියට ලිපි සැපයීම හා ගුවන් විදුලි වැඩ සටහන් සම්පාදනය සඳහා දායක වෙමින් තම ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක මෙහෙවර පුළුල් පිරිසක් වෙත සන්නිවේදනය කිරීමට සරච්චන්ද්‍ර සමත් විය. විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස තම සේවාව දේශන ශාලාවට පමණක් සීමා නොවිය යුතු බවත් තම ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක කටයුතු පුළුල් මහජන අවකාශයක් වෙත සන්නිවේදනය කිරීමේ වැදගත්කමත් ඔහු අවබෝධ කර ගෙන සිටියේය.

සිය දිවියේ තුරුණු වියේ සිටම සරසවි වරම් ලබා ගැනීම සඳහා සරච්චන්ද්‍ර තුළ පැවැති නොතිත් ආශාව ඔහුගේ ජීවන චාරිකාව විමසන විට පැහැදිලි වන්නකි. ඒ පිළිබඳ බොහෝ තොරතුරු ඔහු විසින්1985 දී රචනා කරන ලද 'පිංඇති සරසවි වරමක් දෙන්නේ' කෘතියේ ඇතුළත් වේ. භාරතීය සංස්කෘතිය ඇතුළු පෙරදිග භාෂා සාහිත්‍යය පිළිබඳව මහත් ලෙස ආකර්ෂණය වී සිටි සරච්චන්ද්‍ර 1933දී යුනිවර්සිටි කොලීජියට ඇතුළු වූ පසු තම අධ්‍යයන විෂයයන් ලෙස තෝරා ගත්තේ සංස්කෘත, පාලි හා සිංහල යන ඉන්දු-ආර්ය විෂය

[8] ජ්‍යෙෂ්ඨ හා විශ්‍රාමික මහාචාර්ය, අංශ ප්‍රධාන, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
බී.ඒ. ගෞරව (කොළඹ), එම්.ඒ. (ලැන්කැස්ටර්), එම්.ෆිල්. (පේරාදෙණිය), පී.එච්.ඩී. (කේම්බ්‍රිජ්)

ක්ෂේත්‍රය යි. එසේ ම සංගීත විෂයයෙහි පැවති මහත් ආසාව නිසා මේලා හා ගාන්ධර්ව සභා ආදියේ කටයුතුවලටත් සම්බන්ධ වී ඇත. එකල යුනිවර්සිටි කොලීජියේ පෙරදිග භාෂා ඉගැන්වූ පූජ්‍ය රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් ජන ගී හා වන්නම් ගායනයේ දක්ෂයකු වූ අතර ගුවන් විදුලියට ජන ගී හඳුන්වා දෙමින් පාරම්පරික සිංහල ජන ගී තැටිගත කිරීමට ද උපකාර කර ඇත (කොළඹගේ 1981). මේ අවදියේ දි උපාධි අපේක්ෂකයකු ලෙස සිද්ධාර්ථ හිමියන් ළඟින් ඇසුරු කිරීමේ අවස්ථාව සරච්චන්ද්‍රට ලැබී ඇත. දේශීය කලා ශිල්ප හා සංස්කෘතිය කෙරේ ඇදී ගිය සිත් ඇතිවසිංහල ජනශ්‍රැතිය පිළිබඳ ලිපි කීපයක් පුවත්පත් සඟරාදියට සැපයූ බවත් ඒවා ඉදිරිපත් කෙරුණේ 'සරච්චන්ද්‍ර' යන නාමය යොදා ගෙන බවත් සඳහන් වේ (සරච්චන්ද්‍ර 1985).

1936 දි බී. ඒ. උපාධිය ලැබීමෙන් පසුව බම්බලපිටියේ සාන්ත පීතර විදුහලේ සේවය කොට පසුව ලේක්හවුස් ආයතනයේ රැකියාවකට යොමු වූ කාලයේ දි තම මුල් නම වූ ඉයුස්ටස් රෙජිනෝල්ඩ් ද සිල්වා යන්න වෙනස් කොට එදිරිවීර සරච්චන්ද්‍ර නමින් ප්‍රකට වන්නට විය. මේ කාලයේ දි ම සරච්චින්ද්‍ර සිංහලයන්ගේ බටහිරීකරණ සිරිත් විරිත් හා ආකල්ප පිළිබඳ ලිපි පෙළක් 'ප්‍රබුද්ධ ලංකා' නමින් *Daily News* පුවත්පතට සපයා ඇත. එකල ලේක්හවුසියේ සේවය කළ අවදියේ දි දිනමිණ කර්තෘ පදවිය දැරූ මාර්ටින් වික්‍රමසිංහ දැන හැඳින ගැනීමේ අවස්ථාව ද සරච්චින්ද්‍රට ලැබෙයි. වික්‍රමසිංහ තමා හමුවන්ට ආවේ " *Daily News* පුවත්පතට සැපයූ ලිපි කියවා මා ප්‍රකාශ කළ අදහස්වලට කැමති වූ" නිසා බව සඳහන් වේ (සරච්චන්ද්‍ර 1985: 80).

පුරා වසරක කාලයක් ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ සිට ලක්දිවට දෙවසරකට පසුව එනම් එදා 1942 දීයාපනයේ පළ වූ *Kesari*නම් සඟරාවට සරච්චන්ද්‍ර සැපයූ ලිපි පෙළින් පැහැදිලි වන්නේ පුවත්පත් සඟරාදි මාධ්‍ය මගින් තම අදහස් පාඨකයන් වෙත ඉදිරිපත් කිරීමට සරච්චින්ද්‍ර තුළ පැවැති අභිප්‍රායයි. Through Santiniketan Eyes (ශාන්ති නිකේතනයේ ඇසින්) නමින් ඉංග්‍රීසියෙන් ලියැවුණු එම ලිපි මගින් තම ඉන්දියානු අත්දැකීම්වල ස්වභාවය මෙරට ජනයා සමග බෙදා හදා ගැනීමට සරච්චන්ද්‍ර උත්සාහ දරා ඇත (කෝපරහේවා 2018).

ශාන්ති නිකේතනයේ සිට පැමිණි පසු කලක් ගල්කිස්සේ සාන්ත තෝමස් විදුහලේත් ඉන්පසුව සිංහල ශබ්දකෝෂයේත් සේවය කළ සරච්චන්ද්‍ර කොළඹ ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසුව 1944 දි එහි පාලි අංශයේ කථිකාචාර්යවරකු ලෙස තම සරසවි ඇදුරු දිවිය ආරම්භ කළේය. සරච්චන්ද්‍ර එම අවදියේ සිට ම වඩාත් උනන්දුවක් දක්වා ඇත්තේ නාට්‍ය නිෂ්පාදනය හා ලේඛන කලාව කෙරේය. උසස් රසඥතාවකින් යුක්ත ජන කොට්ඨාසයක් බිහි කර ගැනීම සඳහා පුවත්පත් ගුවන් විදුලිය වැනි මාධ්‍ය භාවිත කිරීමට සරච්චන්ද්‍ර තුළ පැවති උනන්දුව ඔහුගේ විශ්වවිද්‍යාල වෘත්තියේ දක්නට ලැබුණු වැදගත් ලක්ෂණයකි.

ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දී පශ්චාත් උපාධි අධ්‍යාපනය අවසන් කොට 1949 දි පමණ පෙරළා ලක්දිව පැමිණි සරච්චන්ද්‍ර ගුවන් විදුලි නාට්‍ය කෙරේ අවධානය යොමු කර ඇත. ඔහුගේ ' පිං ඇති සරසවි වරමක් දෙන්නේ' කෘතියේ එක් කොටසක් වෙන් කර ඇත්තේ ' රේඩියෝ වැඩ හා නාට්‍ය අභ්‍යාස' යනුවෙනි. " එංගලන්තයේදී ඇතිකරගත් පුරුද්ද අනුව මම කොළඹ දී රේඩියෝවට කන් දෙන්නට පටන් ගතිමි" යනුවෙන් එහි සඳහන් වේ (සරච්චන්ද්‍ර 1985: 154). පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා එංගලන්තයේ ගත කළ කාලයේ දී බීබීසී වැනිආයතනයක ගුවන්විදුලි ආකෘතිය හොඳින් අවබෝධ කර ගැනීමට සරච්චන්ද්‍රට අවස්ථාව ලැබී ඇත. එසේ ම බීබීසීආයතනයෙන් විකාශනය කළ රේඩියෝ නාට්‍යවලට සවන් දීමෙන් ලැබූ අවබෝධය මත " සිංහල රේඩියෝ නාට්‍ය" දියුණු කළ හැකි ආකාරය ගැන සිලෝන් ඔබ්සර්වර් පුවත්පතට

ලිපි සම්පාදනය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් විදුලියේ 'යෞවන සමාජය' නමින් අලුත් වැඩසටහනක් ආරම්භ කිරීමට සරච්චන්ද්‍රට ආරාධනාවක් ලැබිණි.

සරච්චන්ද්‍ර ගුවන් විදුලියට සම්බන්ධ වන්නේ එම සේවාව 'රේඩියෝ සිලෝන්' නමින් හැඳින්වුණු 1950 දශකය ආරම්භයේ දී ය. ගුවන් විදුලිය එකල තිබුණු එක ම විද්‍යුත් සන්නිවේදන මාධ්‍යය විය. 1949 දී ජෝන් ලැම්ප්සන් ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් බවට පත් වූ අතර සරච්චන්ද්‍ර සමඟ යුනිවර්සිටි කොලීජියේ දී අධ්‍යාපනය ලැබූ එම්. ජේ. පෙරේරා 1952 දිඅතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්වීම මෙරට ගුවන් විදුලි සන්නිවේදනයේ වැදගත් සන්ධිස්ථානයකි. සිංහල වැඩ සටහන්වල තත්ත්වය උසස් කිරීමට මෙන්ම ගුවන් විදුලි මාධ්‍යය භාවිත කරමින් සිංහල සංස්කෘතික අනන්‍යතාවක් සහිත නාට්‍ය, සංගීත, කාව්‍ය හා සාහිත්‍ය වැඩ සටහන් ප්‍රචාරය කිරීම එම්. ජේ. පෙරේරාගේ අරමුණ විය (කරුණාරත්න1990: 112). එම කටයුතු සඳහා සහාය ලබා ගත හැකි තම විශ්වවිද්‍යාල මිතුරකු වූ සරච්චන්ද්‍ර ගුවන් විදුලි ආයතනය සමඟ සම්බන්ධ වී සිටීම ද වැදගත් විය. එකල සරච්චන්ද්‍ර පදිංචි වී සිට ඇත්තේ කොළඹ හැව්ලොක් පෙදෙසේ ඉසිපතනාරාමයට ආසන්න ව හෙයින් ගුවන් විදුලි ආයතනය ද ඊට ආසන්නව පිහිටා තිබිණ.

සරච්චන්ද්‍ර සිය ගුවන් විදුලි සන්නිවේදන මෙහෙවර ආරම්භ වන්නේ 1950 දි ඇරඹුණු 'යෞවන සමාජය' වැඩසටහන් මාලාවෙනි. මේ වැඩ සටහන නිසා තරුණ කලාකරුවන් හා කලාකාරයන් කිහිප දෙනෙකු සොයාගැනීමටත් පසුව ඔවුන් සමග එක්ව ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය කිරීමටත් සරච්චන්ද්‍රයන්ට අවස්ථාවක් ලැබිණි. "ශ්‍රාවකයන්ගේ රුචිකත්වය උසස් මට්ටමකට නැංවීමට" සරච්චන්ද්‍රයන්ට තිබූ බලවත් වුවමනාව නිසා පී. වැලිකල වැනි ශිල්පීන් සමග එක්ව ගුවන් විදුලි නාට්‍ය දියුණු තත්ත්වයකට පත් කිරීමට කටයුතු කර ඇත (සරච්චන්ද්‍ර 1985:156). මේ අවදියේ දි සිංහල නාට්‍ය කලාවේ දේශීය රීතියක් සොයා පාදා ගැනීමට පර්යේෂණයේ දුන් සරච්චන්ද්‍ර, සිංහල නාඩගම් සංගීතයේ මිහිරි බව ගුවන් විදුලි ශ්‍රාවකයන් වෙත ඉදිරිපත් කිරීම සඳහා චාල්ස් ගුණසිංහ ගුරුන්නාන්සේගේ සින්දු හොඳ කටහඬ ඇති පිරිසකට පුහුණු කොට ගුවන් විදුලියෙන් ප්‍රචාරය කිරීමට ද පියවර ගෙන ඇත (සරච්චන්ද්‍ර 1985:159). එසේ ම 1953 දී එම්.ජේ. පෙරේරා ආරම්භ කළ 'තරංගණී' නම් මාසික ගුවන් විදුලි සඟරාවට දේශීය කලා ශිල්ප හා සංස්කෘතික අංග පිළිබඳව මහාචාර්ය සරච්චන්ද්‍ර ලිපි සපයා ඇති අතර එම සඟරාව උගතුන් හා උසස් අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීන් අතර බෙහෙවින් ජනප්‍රිය විය.

1950 – 60 දශකවල දී ගුවන් විදුලිය වෙනුවෙන් තම නිර්මාණ දායකත්වය ලබා දුන් වෙනත් වැඩසටහන් අතර ද්විතීය සංග්‍රහය, ශාස්ත්‍රීය සංග්‍රහය, ගුවන් විදුලි රඟමඬල හා විශ්ව සාහිත්‍යය යන වැඩසටහන් කැප වී ඇත්තේ දේශීය සංගීතය, නාට්‍ය හා බුද්ධිමතුන්ගේ අදහස් සාකච්ඡා කිරීම සඳහාය. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ හා වෙනත් උගතුන්ගේ සහාය ඇතිව සම්පාදනය කරනු ලැබූ ශාස්ත්‍රීය සංග්‍රහයට ඇතුළත් වූයේ වඩාත් ශාස්ත්‍රීය වූත්සංස්කෘතික හා අධ්‍යාපනික වටිනාකමින් යුත් වැඩ සටහන් ය. එමෙන්ම ඇතැම් විෂයන්හි පර්යේෂණාත්මක තොරතුරු ද 'ශාස්ත්‍රීය සංග්‍රහය' වැඩසටහන සඳහා යොදා ගත්තේය. එකල උසස් අධ්‍යාපනයේ යෙදී සිටි විද්‍යාර්ථීන්ගේ ආකර්ෂණය දිනා ගත්මේ වැඩසටහන් නිසා ගුවන් විදුලියට ඉහළ මට්ටමක ශ්‍රාවක ප්‍රතිචාර ලැබිණි. සරච්චන්ද්‍රගේ උපදෙස් සහිතව 'ශාස්ත්‍රීය සංග්‍රහය' සැලසුම් කොට නිෂ්පාදනය කිරීමේ වගකීම පැවරී තිබුණේ ප්‍රකට ගුවන් විදුලි සන්නිවේදකයකු වූ එච්. එම්. ගුණසේකරට ය.

සරච්චන්ද්‍ර මුලින් ම නාට්‍ය ලියා ඇත්තේ ද ගුවන් විදුලියේ ප්‍රචාරය කිරීම සඳහාය. ඒවා පසුව රංග භූමිය සඳහා සකස් කොට නිෂ්පාදනය කර ඇත. 'රත්තරන්', වළ ඉහගෙන කෑම, තරුණ ලේඛකයා, සත්ව කරුණාව, එලොව ගිහින් මෙලොව ආවා, පේමතෝ ජායතී සෝකෝ එවැනි නාට්‍ය අතර වෙයි. ගුවන්

විදුලියට නිර්මාණය කරන ලද බොහෝ නාට්‍ය කෘති ඒකාංගික නාට්‍ය වශයෙන් පසුව රංග භූමියට ගැනීම සන්නිවේදනසම්ප්‍රදායක් වූ අතර ගුවන්විදුලි මාධ්‍ය මගින් අපූරු රංග කාව්‍යයන් කළ හැකි වූ බවත් විධිමත් ලෙස පෙන්වා දෙන ලද්දේ සරච්චන්ද්‍ර විසිනි. එසේම රටේ ප්‍රකට සිංහල ලේඛකයන්ගේ නිර්මාණ රාශියක් ගුවන් විදුලියට සුදුසු පරිදි සකස් කොට ප්‍රචාරය කිරීම ද 1950 දශකයේ දී දක්නට ලැබුණකි. මාර්ටින් වික්‍රමසිංහගේ රෝහිණී, ගම්පෙරළිය වැනි නවකතා ද ගුවන් විදුලි නාට්‍ය ලෙස කොටස් වශයෙන් ප්‍රචාරය වී ඇත. ගුවන් විදුලි නාට්‍යවල තත්ත්වය දියුණු කිරීම සඳහා පිහිටුවන ලද නාට්‍ය අත්පිටපත් උපදේශක කමිටුවේ ද නාට්‍ය නිෂ්පාදන උපදේශක කමිටුවේ සරච්චන්ද්‍ර සාමාජිකයකු ලෙස කටයුතු කර ඇත ( කරුණාරත්න 1990; 238).

මේ අනුව එකල රේඩියෝ සිලෝන් ( Radio Ceylon) නමින් හැඳින්වුණු මෙරට ගුවන් විදුලි සේවාවේ ‘ස්වදේශික මුද්‍රාව’ තැබීමට දායක වූ විද්වතකු ලෙස සරච්චන්ද්‍ර සිදු කළ මෙහෙවර විද්වතුන්ගේ ඇගයීමට ලක් වී ඇත.

> ‘රේඩියෝ සිලෝන්’ ගුවන් විදුලි සේවය අයාලේ යමින් පැවති සමයක දී විදේශීය මුහුණුවර වෙනස් කරමින් ස්වදේශීය මුද්‍රාව තැබීමට පුරෝගාමී වූයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර යි. ඒ සඳහා ඔහු මුලින් ම කළේ ස්වදේශික වශයෙන් විසිර පැතිර පැතිර පවත්නා සංස්කෘතිකාංග ශ්‍රව්‍ය මාධ්‍යයක් වන ගුවන් විදුලිය මගින් ජනගත කිරීමට සැලසුම් කිරීම ය (මහේන්ද්‍ර 2011: 47).

එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය නිෂ්පාදන කටයුතුවලට පුවත්පත් හා ගුවන් විදුලි මාධ්‍ය මගින් ලැබුණු විවේචන හා ප්‍රතිචාර ගැන ද මෙහි දී අවධානය යොමු කළ යුතු ය. ‘‘කපුවා කපෝති ඉදිරිපත් කළ දා පටන් අප පුරුදු වී සිටියේ ඩේලි නිවුස් පුවත්පතෙහි රෙජී සිරිවර්ධන කුමක් කියයිද බලන්ටය’’ යනුවෙන් සරච්චන්ද්‍ර ප්‍රකාශ කර තිබීමෙන් එකල ඉංග්‍රීසි පුවත්පත් පවා සිංහල නාට්‍ය සම්බන්ධයෙන් දැක්වූ උනන්දුව පැහැදිලි වේ ( 1985: 162). එසේ ම සිංහල පුවත්පත්වලින් ලැබුණු ප්‍රතිචාර ගැන ද මෙසේ සඳහන් වේ.

> ‘පබාවතී’ නාට්‍යයට ලැබුණු පුවත්පත් ප්‍රතිචාරය දිරිගන්වන සුලු විය. සිංහල පුවත්පත්කරුවෝ නම් විශ්වවිද්‍යාලයේ නාට්‍යයක් ඉදිරිපත් කරන ලද හැම අවස්ථාවෙහි ම අවුත් බලා නිර්දය විවේචන ලියූහ. මටද පුද්ගලිකව ගැරහුවෝ ය. ‘පබාවතී’ ඉදිරිපත් කළ අවස්ථාවේ සිංහල පුවත්පත්වල ආරාධනා නොයැවීමට අපි තීරණය කෙළෙමු. එහෙත් එක් පුවත්පත්කරුවෙක්‘මම ටිකට් එකක් අරන් හරි ඇවිත් එයාට දෙනව’යි කියා අවුත් අභිමත පරිද්දෙන් නාට්‍යය විවේචනය කළේය ( සරච්චන්ද්‍ර 1985: 162).

විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාමය වඩාත් ප්‍රකට වන්නට වූයේ 1950 – 60 දශකවල දි මනමේ, සිංහබාහු වැනි නාට්‍ය නිෂ්පාදනය කිරීම නිසා ය. එම නිර්මාණ පිළිබඳ බොහෝ තොරතුරු හා විචාර එකල පුවත්පත්වල පළ වී ඇත. මනමේ නරඹා වන්ද්‍රරත්න මානවසිංහ ලංකාදීප පතට ලියූ ‘වගතුග’ තීරු ලිපිය එවැන්නකි. ගුවන් විදුලි ශිල්පීන් පමණක් නොව එකල සිටි සිංහල - ඉංග්‍රීසි පුවත්පත් කලාවේදීන් ද ළඟින් ඇසුරු කළ සරච්චන්ද්‍ර තම නිර්මාණාත්මක හා ශාස්ත්‍රීය දායකත්වය ඔවුන් සමඟ බෙදා හදා ගත්තේය.

1950 දශකයේ පමණ සිට සිංහල පුවත්පත් සඟරා සඳහා ලිපි සම්පාදනය කළ ලේඛකයන් අතර මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රට ලැබෙන්නේ ඉහළ තැනකි. ආරම්භයේ දි *Daily News, Observer* වැනි ඉංග්‍රීසි පුවත්පත්වලට මෙන්ම වෙනත් විදේශීය සඟරාවලට පවා ලිපි සපයමින් දේශීය භාෂා සාහිත්‍යය පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි උගත් සිංහල පාඨකයන් වෙත සන්නිවේදනය කිරීමට සරච්චන්ද්‍ර කටයුතු කර ඇත. **පියවර, සංස්කෘති, වීමංසා** වැනි විශ්වවිද්‍යාල මට්ටමින් පළ වූ සඟරා සඳහා පමණක් නොව දිනපතා හා සතිපතා

සිංහල පුවත්පත්වලට සරච්චන්ද්‍ර විසින් සපයන ලද ලිපි හා සාකච්ඡා නිසා නූතන සිංහල සාහිත්‍යය, නාට්‍ය කලාව හා සංස්කෘතිය පිළිබඳ බොහෝ අදහස් සිංහල පාඨක - විචාරක ප්‍රජාව වෙත සන්නිවේදනය විය. එකල සිංහල පුවත්පත් සඟරා සඳහා මහාචාර්ය සරච්චන්ද්‍රගෙන් ලිපියක් ලබා ගැනීමට එම සඟරාවේ ඉහළ තත්ත්වය රැක ගැනීමට හේතුවක් ලෙස සංස්කාරකවරු සිතූහ. එම ලිපි ලේඛන පිළිබඳ අසම්පූර්ණ ලැයිස්තුවක් පී.බී. ගලහිටියාව මහතා විසින් සම්පාදනය කරන ලද 'මහාචාර්ය සරච්චන්ද්‍ර සමඟ දශක හතරක්' කෘතියේ ඇතුළත් වේ. දශක හතරකට වැඩි කාලයක් මුළුල්ලේ පුවත්පත් සඟරාදියට සරච්චන්ද්‍ර විසින් සපයන ලද ලිපි ලේඛන එකතු කොට සාර සංග්‍රහයක් ලෙස පළ කරන්නේ නම් එය උසස් ශාස්ත්‍රීය සේවාවක් වනු ඇත.

නාට්‍ය කලාව වැනි දෘශ්‍ය කලා මාධ්‍යයක අභිවෘද්ධිය මෙන්ම රටේ ජනමාධ්‍යවල සන්නිවේදන භූමිකාව පිළිබඳවත් මහාචාර්ය සරච්චන්ද්‍ර දැක්වූ අදහස් වැදගත් වේ. උසස් ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කර ගැනීම සඳහා එම අදහස් විමසා බැලිය යුතු ය. වර්තමානයේ භාවිත වන ජනමාධ්‍ය යන යෙදුම වෙනුවට සරච්චන්ද්‍ර භාවිත කෙළේ 'බහුජන විඥාපන මාධ්‍ය' යන යෙදුම යි. රටක ජනතාවගේ රුචිකත්වය වර්ධනය කිරීම සම්බන්ධයෙන් රූපවාහිනී, ගුවන් විදුලි මාධ්‍ය වෙත පැවරී ඇති වගකීම ඔහු මෙසේ අවධාරණය කර ඇත.

> රජයේ බහුජන විඥාපන මාධ්‍යයන් පුද්ගල ව්‍යාපාර මෙන් ලාභ ලබාගැනීමේ චේතනාවෙන් පැවැත්විය යුතුද එසේ නැත්නම්, ජනතාවගේ හිත පිණිස ඔවුන්ගේ රුචිකත්වය වර්ධනය කරන අධ්‍යාශයෙන් සේවයක් කළ යුතු දැයි සිතා බැලීම වටී ( සරච්චන්ද්‍ර 1985: 282).

ජනතාවගේ රුචිකත්වය උසස් මට්ටමකට පත් කිරීම සඳහා ජනමාධ්‍ය ක්‍රියා කළ යුතු බව මෙහි අවධාරණය කෙරේ. වර්තමානයේ ලාභය පමණක් මුල් කරගෙන ජනමාධ්‍ය හසුරුවන ව්‍යාපාරිකයන් මෙන්ම බලධාරීන් ද රටක ජනමාධ්‍යවල සමාජ වගකීම සම්බන්ධයෙන් සරච්චන්ද්‍ර පවසා ඇති මේ අදහස් අවබෝධ කර ගත යුතු ය. රටේ උගතුන්ගේ දායකත්වය ලබා ගනිමින් සමාජ වගකීමෙන් හා උසස් මාධ්‍ය සදාචාරයකින් හෙබි ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කර ගැනීම සඳහා එදිරිවීර සරච්චන්ද්‍ර වැනි විද්වතුන්ගේ සන්නිවේදන භූමිකාව ගැඹුරින් විමසා බැලිය යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන**


කරුණාරත්න, නන්දන (1990) **හැටහය වසරක ගුවන් විදුලිය,** මොරටුව: ජන කේන්ද්‍රය

කොළඹගේ, ඩී. ඇම්. ( 1981) **ගුවන් විදුලි වංශය,** කොළඹ: ඇම්.ඩී. ගුණසේන

කෝපරහේවා, සඳගෝමි ( 2018) 'තාගෝර්, ශාන්තිනිකේතනය හා සරච්චන්ද්‍ර' (සංස්) අගලකඩ සිරිසුමන හිමි හා සඳගෝමි කෝපරහේවා, **එදිරිවීර සරච්චන්ද්‍ර ජන්ම ශත සංවත්සර ශාස්ත්‍රීය සංග්‍රහය,** කොළඹ : සමයවර්ධන, 65 – 80 පිටු.

මහේන්ද්‍ර, සුනන්ද ( 2011) 'සරච්චන්ද්‍ර. ගුවන් විදුලිය සහ ස්වදේශීය මුද්‍රාව'**හඬ - ගුවන් විදුලි සඟරාව** 1 ( 3), 46 – 47 පිටු.

සරච්චන්ද්‍ර, එදිරිවීර ( 1985) **පිංඇති සරසවි වරමක් දෙන්නේ,** කොළඹ : දයාවංශ ජයකොඩි

## 09

## මහ ඇදුරු සරච්චන්ද්‍රයන්ගේ ශ්‍රී ලාංකේය ගුවන් විදුලි සම්ප්‍රදාන භූමිකාව

සුරෝෂන ඉරංග [9]

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර යන නාමය ශ්‍රී ලාංකේය නාට්‍ය වංශයේ අමරණීය සලකුණක් වන නමුත් ශ්‍රී ලාංකේය ගුවන් විදුලි වංශකතාව තුළ සරච්චන්ද්‍ර නාමය පිළිබඳ සනිටුහන් වී ඇති තොරතුරු සමාජයේ එතරම් ප්‍රකට කරුණු නොවේ. විශේෂයෙන්ම දේශීය නාට්‍ය කලාව සහ සාහිත්‍යය කෙරෙහි සරච්චන්ද්‍රයන්ගේ සම්ප්‍රදානය මෙරට මහා සම්ප්‍රදායක් ලෙස හඳුනාගැනීමට හැකිවුව ද ඊට සාපේක්ෂව දේශීය ගුවන්විදුලි සම්ප්‍රදාය සහ සරච්චන්ද්‍රයන් අතර පැවති සම්බන්ධතාව චූල සම්ප්‍රදායක් ලෙස හෝ සැලකිය යුතු ප්‍රමාණයකින් ඇගයීමට ලක් නොවීම මෙරට ගුවන් විදුලි ඉතිහාසයේ වැදගත් පරිච්ඡේදයක් නොසලකා හැරීමක් බඳුය. එය එක්තරා දුරකට සරච්චන්ද්‍රයන්ගේ භූමිකාවට සිදුකරන අවම සැලකිල්ලක් වන අතර තවත් අතකින් වත්මන් පරපුර දැනුවත් විය යුතු මහගු තොරතුරු සමූහයක් සමාජගත වීමට පවත්නා අවස්ථාව අහිමි කිරීමකි. ඒ අනුව එවැනි සැඟවුණු තොරතුරු ඉදිරිපත් කරමින් සරච්චන්ද්‍රයන් සම්බන්ධයෙන් සැඟවී ඇති දැනුම පද්ධතියක් සමාජයට නිරාවරණය කිරීම මෙම ලිපියේ මූලික අභිප්‍රාය වන බව සඳහන් කළ යුතුය.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් උපත ලබන්නේ 1914 වර්ෂයේ ජූනි මස 03 වැනිදා ගාල්ල රත්ගම ප්‍රදේශයේදීය. උපතින් ඔහු ලද නාමය වන්නේ වැදිතන්ත්‍රිගෙ යූස්ටස් රෙජිනෝල්ඩ් ද සිල්වා ය. පවුලේ වැඩිමහල් පුත්‍රයා වූ ඔහුගෙන් පසුව පවුලට තවත් සහෝදරියන් දෙදෙනෙකු එක්විය. ඔහුගේ පියා තැපැල් ස්ථානාධිපතිවරයෙකු වූ අතර මව වෘත්තියෙන් ගුරුවරියක විය.

රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ලේ ඇලෝසියස් විද්‍යාලය, පානදුර ශාන්ත ජෝන් විද්‍යාලය හා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය යන පාසල්වලින් අධ්‍යාපනය ලැබූ හෙතෙම පාසල් කාලයේදී විද්‍යා විෂයන්වලින් අධ්‍යාපන කටයුතු සිදු කළේය. ඊට අමතරව ඉංග්‍රීසි, ලතින් හා ග්‍රීක භාෂා අධ්‍යයනයට ද හෙතෙම යොමු විය. පාසලෙන් ලන්ඩන් විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය සමත් වී 1933 වසරේදී කොළඹ යුනිවසිටි කොලීජියට ඇතුළත්ව පාලි, සංස්කෘත හා සිංහල භාෂාව හදාරා සිය මූලික උපාධිය ප්‍රථම පන්ති සාමාර්ථ්‍යයක් ලබාගනිමින් සමත් විය. දෙමව්පියන්ගෙන් ඇතිවූ බලපෑම මත ලංකා සිවිල් සේවා විභාගයට ද ඉදිරිපත් වූ හෙතෙම ඉන් සමත් වූයේ දිවයිනේ පළමු ස්ථානය ලබාගනිමිනි.

පාසල් අධ්‍යාපනයෙන් පසුව කෙටි කලක් කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේ ඉගැන්වීමේ යෙදුණු සරච්චන්ද්‍රයන් 1939 වසරේදී ලෙක්හවුස් ආයතනයේ සේවයට එක් විය. කෙසේ වෙතත් සංගීතය සහ භාරතීය දර්ශයනය හැදෑරීමේ දැඩි ආශාවෙන් පෙළුණු හෙතෙම ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ අධ්‍යාපනය ලැබීම සඳහා පිටත්ව ගියේය.

ශාන්ති නිකේතනයේ අධ්‍යාපනය ලැබීමෙන් පසුව නැවත මෙරටට පැමිණි සරච්චන්ද්‍රයන් ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ සිංහල ගුරුවරයෙකු ලෙස සේවයට එක් විය. කලක් සිංහල ශබ්ද කෝෂයේ උපසංස්කාරකවරයෙකු ලෙස ද කටයුතු කළ සරච්චන්ද්‍රයන්ට කෙටි කලකින් ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ධූරයක් හිමිවූ අතර ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති හා දර්ශනසූරි උපාධි ලබා 1952 වසරේදී පේරාදෙණිය සරසවියේ සේවයට එක්වුණි.

මහාචාර්ය සරච්චන්ද්‍රයන් සහ ගුවන්විදුලිය අතර ගොඩනැගෙන සබඳතාවයේ ආරම්භය එතුමා සරසවියේ ශිෂ්‍ය අවධිය ගතකරමින් සිටින සමය දක්වා දිව යයි. මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා වරක්

---

[9] සහකාර පුවත්පත් කොමසාරිස්
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
බී.ඒ. (ගෞරව) කොළඹ

සඳහන් කර ඇති පරිදි සරච්චන්ද්‍රයන් යුනිවර්සිටි කොලීජියේ විද්‍යාර්ථියෙකුව සිටින සමයේ ගුවන් විදුලියෙන් ශාස්ත්‍රීය වාදනයක් ඉදිරිපත් කර ඇති අතර එතුමා ගුවන් විදුලියේ දේශන පැවැත්වූ මුල් අවධියේ නීතිඥ ජෝන් ද සිල්වා මහතාගේ නාට්‍යවල ඇතුළත් පැරණි නූර්ති ගී ගණනාවක්ම නිදර්ශන සේ ගායනා කර ඇති බව ද සරච්චන්ද්‍රයන්ගේ සමකාලීනයෝ සඳහන් කරති.

1950 ගණන්වලදී මහාචාර්ය සරච්චන්ද්‍රයන් තුළ ගුවන් විදුලි නාට්‍ය කෙරෙහි උනන්දුවක් හා නැඹුරුවක් ඇතිවන බව එතුමාගේ කෘතිවලින්ම ප්‍රකට වේ. එතුමා පිං ඇති "සරසවි වරමක් දෙන්නේ" නමැති කෘතියේ සඳහන් කර ඇති පරිදි එංගලන්තයේ දී ඇතිකර ගත් පුරුද්දක් අනුව කොළඹ දී ගුවන් විදුලියට සවන් දීමට යොමුවී ඇති හෙතෙම බීබීසී ආයතනයෙන් ප්‍රචාරය කළ ගුවන් විදුලි නාට්‍යවලට සවන් දීමෙන් මහත් ආශ්වාදයක් ලබා තිබේ. එම නාට්‍ය හා සැසඳීමේදී සිංහල ගුවන් විදුලි නාට්‍ය හාස්‍යයට හා අවමානයට ලක්විය යුතු තත්ත්වයක පැවති බව සරච්චන්ද්‍රයන් සඳහන් කර ඇත.

ඒ අනුව එම නාට්‍ය විචාරයට ලක්කරමින් Sunday Observer පුවත්පතට ලිපි පෙළක් රචනා කිරීමට සරච්චන්ද්‍රයන් කටයුතු කළේය. එහි ප්‍රතිඵලය වූයේ එවකට ගුවන් විදුලියේ අධ්‍යක්ෂවරයා වූ බීබීසී ආයතනයේ සේවය කළ ජෝන් ලැම්ප්ඩන් මහතාගෙන් ලිපියක් ලැබීමය. ලංකා සිවිල් සේවා නිලධාරියෙකු වූ ඇම්.ජේ. පෙරේරා මහතා ද මේ වන විට ගුවන් විදුලියේ අතිරේක අධ්‍යක්ෂ ධුරයක් දැරූ අතර ඒ මහතා යුනිවසිටි කොලීජියේ සිටි සමයේ සරච්චන්ද්‍රයන්ගේ මිතුරෙකු වූ අතර හෙතෙම සරච්චන්ද්‍රයන්ගේ දක්ෂතා පිළිබඳ මනා දැනීමකින් යුක්ත විය.

සරච්චන්ද්‍රයන් ගුවන්විදුලියට නාට්‍ය රචනා කිරීම ආරම්භ වන්නේ මෙතැන් සිටය. "නොරත රත", "සත්ව කරුණාව", "තරුණ ලේඛකයා", "වළ ඉහගෙන කෑම" මෙන්ම "ඈ නුවන් ලැබුවා", "රත්තරං" හා "පෙමතො ජායති සොකො" සරච්චන්ද්‍රයන්ගේ මුල්කාලීන ගුවන් විදුලි නාට්‍ය වේ. සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කතා වස්තුව පදනම් කර ගනිමින් සරච්චන්ද්‍රයන් 1955 වසරේදී "පෙමතො ජායති සොකො" නාට්‍යය රචනා කළේය. පී. වැලිකල වැනි ගුවන්විදුලි නාට්‍ය ශිල්පීන්ගේ නොමඳ සහයෝගය ද මෙකල සරච්චන්ද්‍රයන්ට ලැබුණි. 1950 දශකයේ අගභාගයේ ගුවන් විදුලි නාට්‍ය අංශය ආරම්භ වේ. සරච්චන්ද්‍රයන් සිංහල සේවයේ සක්‍රිය සම්පත්දායකයෙක් ලෙස කටයුතු කරන සමයේ සුගතපාල ද සිල්වා මහතා භාවාත්මක ගුවන් විදුලි නාට්‍ය නිර්මාණය සඳහා පුරෝගාමී වන අතර පී. වැලිකල මහතා එකල නිෂ්පාදකවරයා ලෙස කටයුතු කළේය.

Radio නමැති ඉංග්‍රීසි යෙදුමට සිංහල භාෂාවෙන් "ගුවන් විදුලිය" ලෙස භාවිත වීම ද සරච්චන්ද්‍රයන්ගේ උපහාසයට බඳුන් විය. මේ බව එතුමාගේ ඇතැම් ලිපිවල ද සඳහන් වේ. මේ සඳහා නිසි වචනයක් නොමැති නම් "රේඩියෝව" ලෙස භාවිත කිරීමේ වරදක් නොපෙනෙන බව සරච්චන්ද්‍රයන්ගේ මතය විය. මේ අනුව "පිං ඇති සරසවි වරමක් දෙන්නේ" කෘතියේ ද එතුමා පරිච්ඡේදයක් සඳහා යොදා ඇත්තේ "රේඩියෝ වැඩ" යන්නයි.

ගුවන් විදුලිය සැබෑ රසෝද්පාදන මාධ්‍යයක් බවට පත්කරලීම සඳහා සරච්චන්ද්‍රයන් දැක්වූ දායකත්වය ප්‍රශංසනීය වේ. ඒ අනුව "රඟ සොබා" නමින් රසෝත්පාදන මෙන්ම ශාස්ත්‍රීය අංගයක් ද ආරම්භ කෙරිණි. ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිෂ්පාදකවරයෙකු වූ එච්.එම්. ගුණසේකර මහතා එම වැඩසටහන සම්පාදනයේදී ගුරුතන්ති තබා ගෙන කටයුතු කළේ සරච්චන්ද්‍රයන්ය.

සතියකට විනාඩි 15 ක කාලයක් ප්‍රචාරය වූ "රඟ සොබා" වැඩසටහන "තරංගණී" ගුවන්විදුලි සඟරාවේ ඇතුළත් විය. "විශ්ව සාහිත්‍යයෙන්" යන වැඩසටහනට පෙර අපර දෙදිග සම්භාව්‍ය කලා නිර්මාපකයින් පිළිබඳ සහ ඔවුන්ගේ කලා පිළිබඳ කෘති ඇතුළත් වූ අතර "යෞවන සමාජය" හා අතිශයින් ජනප්‍රිය වූ "කල්පනා" වැඩසටහන සරච්චන්ද්‍රයන් විසින්ම මෙහෙයවන ලදි. 1970 දශකයේදී ද "කල්පනා" වැඩසටහන අඛණ්ඩව ප්‍රචාරය කෙරිණි. මේ අනුව මෙරට බහුතර සිංහල ප්‍රජාවට ආමන්ත්‍රණය කරන සංස්කෘතික ධාරාවේ ගුවන්විදුලි වැඩසටහන් මාලාවක ආරම්භය සිදු වන්නේ සරච්චන්ද්‍රයන් ගුවන් විදුලිය පෝෂණය කිරීමේ කාර්යයට සම්බන්ධ වීමත් සමඟය. 1950 වසරේ අගෝස්තු මාසයේ ආරම්භ වූ "යෞවන සමාජය" වැඩසටහන සිංහල භාෂීය ගුවන්විදුලි නාට්‍යයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක්

ලෙස පෙන්වා දිය හැකි අතර එය කුසලතා පිරි යෞවනයන්ට සිය නිර්මාණ එළි දැක්වීමට අවස්ථාව ලබා දුන් වේදිකාවක් ද විය.

මහාචාර්ය සරච්චන්ද්‍රයන් වරක් සිය "කල්පනා" වැඩසටහනට ආරාධිතයා ලෙස කැඳවන ලද්දේ ලේඛක සයිමන් නවගත්තේගමයන්ය. නවගත්තේගමයන්ගේ අලුත්ම නවකතාව සම්බන්ධයෙන් එම වැඩසටහනේදී සාකච්ඡාවට බඳුන් විය. වැඩසටහන ආරම්භයේ දී සරච්චන්ද්‍රයන් විසින් නවගත්තේ ගමයන්ව හඳුන්වන ලද්දේ මෙලෙසිනි.

"අද අපේ සාකච්ඡාවට ආරාධිතයා වශයෙන් පැමිණ සිටින්නේ සයිමන් නවගත්තේගමයි. වාසනාවකට ඔහුගේ කෘතියකට ගිය අවුරුද්දේ සාහිත්‍ය තෑග්ග ලැබුණේ නෑ. ඒ හින්දම ඔහු හොඳ පොතක් අලුතින් ලියලා තියෙනවා. අද අපි සාකච්ඡා කරන්නේ එම පොත ගැනයි."

සරච්චන්ද්‍රයන් තුළ නිසර්ගයෙන්ම පැවති සදය උපහාසය එතුමා සිය ගුවන් විදුලි පූරක භූමිකාවේදී ද යොදාගනු ලැබුවේ ඉහත පරිදිය. සරච්චන්ද්‍රයන්ගේ සුවිශේෂී චරිත ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි මෙසේ උපහාසය පළකිරීමේ ලක්ෂණය ගුවන් විදුලි වැඩසටහන් තුළින්ද නොමදව ප්‍රකට වූ බව මෙවැනි නිදසුන්වලින් පෙනී යයි.

මේ අනුව සැලකීමේදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ගුවන් විදුලි සම්ප්‍රදාන භූමිකාව පැතිකඩ ගණනාවක් ඔස්සේ පැතිරී පවතී. විශේෂයෙන්ම දේශීය සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා ගුවන් විදුලිය ඔස්සේ එතුමා වෙතින් සිදුවූ සේවය අපමණය. එය ගුවන් විදුලියේ ගමන් මග දේශීය ආකෘතියක් ඔස්සේ හැඩගැස්වීමට සුවිශේෂී දායකත්වයක් සැපයූ බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.

**ආශ්‍රිත මූලාශ්‍රය**


ගලහිටියාව, පී.බී. (2019). මහාචාර්ය සරච්චන්ද්‍ර සමග දශක හතරක්, කොළඹ: නිර්මල ප්‍රකාශන.

බණ්ඩාර, ටී.කේ. (2022.01.11). සාහිත්‍ය තෝතැන්න බිහිවුණේ මෙහෙමයි, ඉරිදා ලංකාදීප.

සමරසිංහ, එස්. (2020.03.17). "අද තරුණයා ගුවන්විදුලි නාට්‍ය අහලා නෑ" , වජිර ඉන්දික කරුණාසේන. දිනමිණ.

## පෙමතො ජායති සොකො නාට්‍යයෙන් සංනිරූපිත සරච්චන්ද්‍රයන්ගේ පාරලෞකික චින්තනය

නාලක ජයසේන [10]

තවමත් කියවා අවසන් නොවූ කෘතියක් බඳු සරච්චන්ද්‍රයන්ගේ වෙසෙස් නිමැවුමක් වූ පෙමතො ජායති සොකො නාට්‍ය, ගුවන් විදුලි නාට්‍යයක් වශයෙන් පළමු වරට ජනගත වූ ජාතික ගුවන් විදුලියේ පිහිටි මැදිරිය සරච්චන්ද්‍රයන්ගේ නමින් නම් කරන අවස්ථාවේදී මෙම ලිපිය රචනා කරන්නට ලැබීම භාග්‍යයකි. මක්නිසාද යත් අවිධග්ධ සම්මත නාට්‍ය සම්ප්‍රදාය ප්‍රතිස්ථාපනය කරමින් සරච්චන්ද්‍රයන් සිදු කළ පර්යේෂණයේ සාර්ථකත්වය කොතෙක්ද යත් ජාලතන්ත්‍රවාදී වත්මන් ලෝකය තුළද ඒවා අසමින් බලමින් මෙන්ම කියවමින්ද රසයට පත්වීමට හැකියාව ඇති නාට්‍යෝචිත අවස්ථා සුවහසක් ඔහු විසින් ගෙන හැර පා ඇති බැවිනි. පෙමතො ජායති සොකො ඊය මනා නිදසුනකි. තවද නාටකීය රසාස්වාදාපේක්ෂිත ප්‍රේක්ෂක ජන සංඝය විෂයක එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සතත භාවිත ඉව මගින් නිමැවූ නාට්‍ය කෘති අතර පෙමතො ජායති සොකො සුවිසෙස් වන්නේ එමගින් සසල කරනු ලබන මනෝභාව ලෞකිකත්වය ඉක්මවා ලෝකොත්තරත සත්‍යාවබෝධයට සමපාත වන බැවිනි.

දෙවැනි ධර්මකීර්ති සංඝරාජ හිමිපාණන් විරචිත යැයි සැලකෙන සද්ධර්මාලංකාර නම් බණකතා ග්‍රන්ථයෙහි පැනෙන ස්වර්ණතිලකා කතා වස්තුව කේන්ද්‍ර කරගෙන එහි තිබූ ඇතැම් සාම්ප්‍රදායික දෘෂ්ටි නිශේධනය කරමින් සරච්චන්ද්‍රයන් ප්‍රණීත පෙමතො ජායති සොකො නාටකය උත්පාදනට වන්නේ 1957 දී පමණ ගුවන් විදුලි ගීත නාටකයක් ලෙසිනි. එම ගීත නාටකය ලංකා ගුවන් විදුලියේ සිංහලාංශයෙන් 1957 අප්‍රේල් 11 වැනිදා අපරභාග 7.30ට පමණ ප්‍රචාරය වූ බව ඉතිහාසයේ දැක්වෙයි. ඒ නැවත 1969 දී වේදිකාමස්තක නාට්‍යයක් ලෙස ප්‍රතිනිර්මාණය වන්නේ මෙරට දෙවැනි ඔපෙරාව වශයෙනි. එහි නව නිෂ්පාදනය 1972 සැප්තැම්බර් 30 දා පේරාදෙණියේ සුබාවතී රඟහලේදී රසිකයනට දානනය කෙරිණ. ප්‍රමාතෘන් ආලෝලනය කරන නිසග කවිත්වයක් ජන්ම වාසනාවෙන් ලත් සරච්චන්ද්‍රයෝ චක්ෂුප්‍රසාදය සහ සෝතප්‍රසාදය පිනැවුමෙන් ඔබ්බට ගොස් මනැසට සරු පණිවුඩයක් ඉතුරු කරමින් තමන්ගේ සෑම නිෂ්පාදනයක්ම පරිසමාප්ත කළෝය. පේරාදෙණි සරසවි ජනනිය ඇසුරෙහි නිර්මාණය වූ සරච්චන්ද්‍ර නාට්‍ය සියල්ලක්ම පාහේ සහෘදයාගේ භාව මණ්ඩලය පිහිටි හදවතට මෙන්ම ශ්‍රෙය්‍යා මණ්ඩලය පිහිටි මනසටද ලබා දුන්නේ නවීන වුත් අදීන වුත් අතුල්‍ය වුත් දර්ශනයකි. මෙම කෙටි ලිපියෙන් පෙමතො ජායති සොකො කෙරෙන් සූචනය වන සරච්චන්ද්‍රයන්ගේ ලෝකොත්තර චින්තනයත් එමගින් ග්‍රාහකයාගේ ප්‍රේක්ෂකයාගේ චිත්ත චෛතසික කෙරේ ඒ චින්තනයේ දාර්ශනිකාලෝකය පතනය වන්නේ කෙසේද යන්නත් විභාග කෙරේ.

පළමුව මෙහිලා ලෝකෝත්තර චින්තනය යනු කවරේදැයි අර්ථගන්වා ගත යුතුය. ලෝකෝත්තර යන්නෙහි දනු අරුත ලෝකයෙන් එතෙරට යාම යන්නයි. එහි වැසි අරුත මතු කරගන්නට සිදුවනුයේ බුදුසමයෙනි. නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය යනු බුදුදසුනට නමකි. ඒ කිමෙක්ද යත්? සෝතාපන්න සකදාගාමී අනාගාමී අරහත් යන මග හා සතර පලත් නිවනත්ය. එනයින් ගත් කල සසරෙහි රුඳෙන, රඳන හා රඳවන සිතුවිලි ආවලියක් (චින්තනයක්) වේ නම් එය ලෞකිකය. මාර්ගඵල උදාවන්නේ සසරෙන් එතෙරට යන කලය. එනයින් සසරෙන් මිදෙන මුදන මුදවන සිතුවිලි ආවලියක් (චින්තනයක්) වේ නම් එය අලෞකිකය. පාරලෞකිකය. නැත්නම් ලෝකෝත්තරය.

දෙවනුව සම්මර්ශනය කළ යුතුව ඇත්තේ කලාකරුවෙක් වූ සරච්චන්ද්‍රයන්ට සත්ත්වයන් (මිනිසුන්) නැත්නම් තම ආදරණීය රසිකයන් නිවන් දැකීමේ පරමාර්ථයක් චේෂ්ඨාවක් ආරම්මණයක් තිබුණේද යන්නයි. ඊට දිය හැකි සරල පිළිතුර නැත යන්නයි. එසේ නම් අපගේ තේමාව සංධිග්ධ වෙයි. මක්නිසාදයත් හෙතෙම තම නාට්‍ය මතු නොව සකලවිධ නිර්මාණ කෙරෙන් තැත් කෙළේ අන් කිසිවක් නොව තම

[10] බී.ඒ.ගෞරව (කොළඹ), ජාත්‍යන්තර එන්.එල්.පී ඩිප්ලෝමා (අයි.අයි.ටී.සී.)

නිර්මාණාලෝලිත හදවත් තුළ සාහිත්‍යික රස ජනනනයි. එහෙත් පෙමතො ජායතී සෝකෝ වින්දනයෙන් සාහිත්‍යමය වශයෙන් භාවමය වශයෙන් රසික ගුඪ චිත්තයේ රෝපණය වන චින්තනයක් ඇත යන්න මෙහිලා යෝජනා කෙරෙයි. ඒ ඔස්සේ සරච්චන්ද්‍රයන්ගේ පාරලෞකික චින්තනය පිළිබඳ ප්‍රවාදයක් සකසා ගැනීම මෙහි අරමුණයි.

එහිලා පෙමතො ජායති සොකො ශෛලිගත නාට්‍යයෙහි ඇසි දිසි මෙන්ම සූච්‍ය මාධ්‍යයෙන්ද ස්නිග්ධව සූක්ෂ්මව හා ඉසිහින්ව ලෝකෝත්තර චින්තනය සංනිරූපණය වී ඇති ආකාරය අන්වේෂණය කරගත යුතුය. එඅරුතෙන් සරච්චන්ද්‍රයන්ගේ අවිඥ්ඥාණය ඇමැතීමට හා ඊට කිඳා බැසීමට සිදුවෙයි. අනෙක් අතට සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ කෙරෙහි අනවරතව බලපෑවේ බෞද්ධ සාහිත්‍ය යන්නත් ඔහුගේ නිර්මාණ භුක්ති විඳි හා විඳින බහුතර සමාජය බෞද්ධ සංස්කෘතික එකක් බවත් අමතක නොකළ යුතුය. එබැවින් අපගේ සූත්‍රය සනිදර්ශනාත්මකව තහවුරු කිරීමෙහිලා එම සාධකද්වය අතිප්‍රබල බැව් සටහන් කොට තැබිය යුතුය.

සරච්චන්ද්‍රයන් රචිත පෙමතො ජායති සොකො මගින් ඊට මූලාශ්‍රය වූ ස්වර්ණතිලකා වස්තුව මගින් ස්ත්‍රිය විෂයක සාම්ප්‍රදායික බ්‍රාහ්මණ දෘෂ්ටිය නිෂේධනය කළේය යන මතයත් නව නිර්මාණය කෙරෙන් මතුකර ඇති නව දෘෂ්ටියත් හඳුනා ගැනීමට පහත මූලාශ්‍රයත්‍රය ඇසුරෙන් සිද්ධි සහසන්දනය කරනු ලැබේ.

1 ස්වර්ණතිලකා වස්තුව

2 පෙමතො ජායති ගුවන් විදුලි නාට්‍ය පිටපත - 1957

3 පෙමතො ජායති සොකො වේදිකා නාට්‍ය පිටපත

සරච්චන්ද්‍රයන් සංවේදී කරුණක් වූ ප්‍රේමය ඔස්සේ ගැටුමක් නිර්මාණය කරමින් සිය කවීත්වය පාන්නට සමත් වෙයි. ඊට ආභාසය ලැබූ ස්වර්ණතිලකා වස්තුවෙහි උද්දාල ස්වර්ණතිලකා පළමු හමුව කියැවෙන්නේ පහත පරිදිය.

> එකල්හි එනුවර යට කී උද්දාල බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට නුදුරු ව බඳපුටුවෙක පළසක් මත්තෙහි හුන්නේ ය. ගන්ධර්ව බ්‍රාහ්මණයා ද රජහු වැඳ අවසර ගෙන වීණා ගායනා කෙරෙමින් ස්වර්ණතිලකාව හා සමග එකත්පස ව හුන්නේය. එකෙණෙහි තමා පියාණන් පිටිපස්සෙහි හුන්නා වූ ස්වර්ණතිලකා තොම උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරුදැයි විචාරා තෙල හඳ පීඨය මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැයි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී කොඳ කැකුළු මෙන් සුදු සිනිඳු දත් පෙළෙහි මනහර සුදුරසින් භින්නවර්ණ වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳමඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරවගෙන උන් පළස මඳක් පහ කොට ශරීරප්‍රභා විහිදුවාලුව. හිරු රස් කබලක් වැනි ඒ ශරීරාලෝකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යවත්ව කවර ආලෝකයෙක් දෝ හෝ යි විස්මය පත්ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශෝකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුළු ධාරාවෙන් තෙත් වූ නේත්‍ර ඇති ව විසංඥ විය.

උද්දාලයන්ගේ මනෝධාතුව ස්වර්ණතිලකා අබියසය ප්‍රකම්පනයට පත්වීම ශෘංගාරාත්මකව එහි දැක්වෙයි. එමතු නොව රාගයේ ප්‍රාබල්‍යත්වය සහ ඒ ගින්නක් මෙන් ඇවිලෙන බව ස්ඵුට කරමින් එම ප්‍රථම දර්ශනයෙන්ම උද්දාල සිතට වූ විපත එහි ගෙන හැර පාන අතර ඒ කොතෙක් භයංකරද යත් එම උමතු වීම සිහි තොර වීමෙන් අවසන් වෙයි. එනයින් සලකන කල ප්‍රේමය විෂයක චිත්ත ක්‍රියාකාරිත්වයත් ප්‍රේමයේ විපාකයත් එම වස්තුවේ නිරූපිතය. එය වූ කලී ප්‍රේමය විෂයයක ලෞකික දෘෂ්ටියක් නොවේ. ප්‍රේමය ලෝකාස්වාදට සාපේක්ෂව රසයකි. සුවයකි. ප්‍රේමාග්නියෙන් විසංඥ වීම ලෞකික දෘෂ්ටියෙන් හා ලෞකික චින්තනයෙන් ගත් කල කමනීය වූත් වර්ණනීය වූත් සුඛිය වූත් එකකි. එහෙත් ඒ රමණීය ප්‍රේමය

ලෝකෝත්තර චින්තනයෙන් මරණීය වේ. එමතු නොව ඒ අරබයා බුද්ධ ඥානයෙන් දේශනා කොට ඇත්තේ මෙසේය.

"මහණෙනි ස්ත්‍රී රූපය තරම් පුරුෂයන් ගේ සිත් ඇලුම් කරන බැඳෙන මත් කරවන ගොඩ එනු නො හැකි ලෙස එරෙන අනිකක් මම නො දනිමි. මහණෙනි, ස්ත්‍රී රූපයට වසඟ වූ එහි ඇලුණා වූ බැඳුණා වූ එරුණා වූ සත්ත්වයෝ දීර්ඝ කාලයක් ශෝක කරන්නාහ.

මහණෙනි, ස්ත්‍රී ශබ්ද-පෙ-ස්ත්‍රී ගන්ධය-පෙ-ස්ත්‍රී රසය-පෙ- ස්ත්‍රී ස්පර්ශය තරම් පුරුෂයන්ගේ සිත් ඇලුම් කරන බැඳෙන මත් කරවන ගොඩ එන් නො හැකි සේ එරෙන අන් එක් දෙයකුදු මම නො දකිමි. මහණෙනි, ස්ත්‍රී ස්පර්ශයට වසඟ වූ එහි ඇලුණා වූ බැඳුණා වූ එරුණා වූ සත්වයෝ බොහෝ කල් ශෝක කරන්නාහ.

මහණෙනි, ස්ත්‍රිය යන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නීය. සිටින්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. හිඳින්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. නිදන්නී ද පුරුෂයාගේ සිත් ගන්නීය. සිනහ වන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. කථා කරන්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. ගායනය කරන්නී ද පුරුෂයාගේ සිත් ගන්නී ය. හඬන්නී ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. මව ද පුරුෂයා ගේ සිත් ගන්නී ය. මහණෙනි, මාරයා ගේ තොණ්ඩුව" ය යි කිය යුත්තේ ස්ත්‍රියට ය.

අංගුත්තර නිකායේ පඤ්චක නීවරණ වග්ගයේ දැක්වෙන එම ධර්මය ස්වර්ණතිලකා කතා වස්තුව විෂයයක බලාත්මකය. සරච්චන්ද්‍රයන් ස්වර්ණතිලකා උද්දාල ප්‍රථම හමුව කරණ කොට බමුණු සිතේ ඇති වූ ක්ෂෝභය මෙසේ දක්වයි.

ස්වර්ණතිලකා වී ය ඇගෙ නම
ස්වර්ණ වර්ණය ඇගෙ දේහය
සද්වර්ණ මාලා කලඹ සදිසිය
සිහින් සිරුරින් නිකුත් රස්මිය
මෝහ කරවන දනන් චිත්තය
වර්ණ ගන්ධය ශබ්ද ස්පර්ශය
දුටු ඇසිල්ලෙහි රාග මොලවන
ඇගේ නම වීය ස්වර්ණතිලකා

ඒ දෙදෙනාගේ හමුව අරබයා ගුරුවරයා හා සිසුන් අතර වූ සංවාදය ගුවන් විදුලි නාට්‍යයේ මෙසේ දැක්වෙයි.

ගුරු ශිෂ්‍යයිනි ශිෂ්‍යයිනි අද මට සිදු වූයේ මහත් විපතක්. කුමක් කරන්න ද කියලා දන්නෙ නෑ. මම නිතර ම ඔබ හැම දෙනාට උපදෙස් දෙනවා. දැන් මට ඔබ හැමගෙන් උපදෙස් ඇසීමටයි සිදු වී තිබෙන්නෙ. හනික යමක් කියන්න. මා අස්වසනන්න.

අග්නිදත්ත - කුමක් ද සිදු වුණේ ඇදුරුතුමනි

දප්පුල - ඔබතුමා ගේ මුළු ශරීරයම වෙවුලනවා

අග්නිදත්ත - මේ අසුනේ වාඩි වෙන්න ගුරුතුමනි

ගුරු - මට අසුනක් වුවමනා නෑ. අග්නිදත්ත මට සිහිසන් නැති වුණා සේ දැනෙනවා. මම යහන් ගබඩාවට ගොහින් ස්වල්ප වේලාවක් සැතපිලා, නොපමාව ආපසු එන්නම් ඔබ පාඩම් බැලීමට

මෙම සංසිද්ධියම පෙමතො ජායතී සොකො නාට්‍යයෙහි සංනිරූපණය වන්නේ මෙසේය

පිය සිසුනි සිදු වූයෙ
විපතක්ය මට මහත්
නොදැනේය පුවත් කිසි
සිත මාගේ වියවුල්ය
මෙතෙක් කල් ඔබ හැමට
දුන්නෙ උපදෙස් මාය
දැන් ඔබෙන් උපදෙසක්
මට ලබාගන්ට වේ

බමුණු සමාජයේ ස්ත්‍රිය කෙරේ දැක්වූ ආකල්පය වන්නේ හැකි තරම් ස්ත්‍රියගෙන් ඈත්ව සිටීමයි. බුදු සමය ස්ත්‍රීහරණය කළ යුතුයැයි නිර්දේශ කොට ඇත්තේ පැවිද්දන්ටය. බමුණා තත් ස්ත්‍රීය (ස්වර්ණතිලකා) හඳුන්වා ඇත්තේ කාලකන්නියක ලෙසය. ස්ත්‍රිය ඇසක ගැටීම පවා බමුණු සමාජයේ පිළිකෙව් කර ඇති බව එයින් ගම්‍ය වේ. එහෙත් මෙවර සිදුව ඇත්තේ විරුද්ධාභාසයකි. බමුණු චෛතසිකාවලියේ පළමුව මේ හමුවුණේ (දුටුවේ) කාලකන්නියක බව හට ගනී. එහෙත් සැණෙකින් ඈ කෙරේ කාරුණ්‍යයක් හට ගනී. ගුවන් විදුලි නාට්‍යයේ ඒ මෙසේ නිරූපිතය.

> කරදර වෙන්න එපා අග්නිදත්ත මම අද කාලකන්නියක් දුටුවා මහත් අභාග්‍යයක් කවර කටයුත්තක් සඳහා මේ පළාතට ආවා ද දන්නෙ නෑ කිසි කලක ස්ත්‍රියක් තබා පුරුෂයෙක්වත් නො හැසිරෙන අර පාළු පැත්තෙ මම සක්මන් කරමින් සිටියා ඈ මලුලු පුරුෂයෙකුත් සමග මා ඉදිරියට ආවා ඒ දෙන්නා මං මුළා වෙලා ද දන්නෙ නෑ

එයම වේදිකා නාට්‍යයට සරච්චන්ද්‍රයෝ මෙසේ ප්‍රතිනිර්මාණය කළහ.

උද්දාල කාලකන්නියක් දුටුවෙමි මම අද
කවර පාපයක් දෝ පෙර නොදනිමි
සක්මන් කරමින් හුන්නෙමි උයනේ
හුදකලා පෙදෙසක්ය
කිසි කෙනෙකු නොහැසිරෙන
මහලු මිනිසෙකු කැටුව
හුන්නා
පියා දෝ ඇගෙ නොදන්නෙමි ඔහු
මං මුලා වී දෝ එදෙදෙනම ?

බමුණකුට ස්ත්‍රියයක් ගැටුණහොත් කළහොත් පුරාණ සම්මත චාරිත්‍ර ඇත. සාමාන්‍ය අවස්ථාවකදී බමුණු ඇසක් කාන්තා කයක් කෙරේ ගැටුණහොත් කළ යුතු දේ කොට එය තවත් එක් සිද්ධියක් සේ අවසන් වීම සම්මුතියයි. නමුත් මෙවර ඒ සම්මුතිය අතික්‍රමණය වන අයුරු ගුවන් විදුලි නාට්‍යයේත් වේදිකා නාට්‍යයේත් පිළිවෙලින් දැක්වෙන්නේ මෙසේය.

පෙර මෙන් කිරි පැනින් සෝදා ඉවත් කළ හැකි කිලුටකින් නෙව් මම මේම් වර කිලුටු වුණේ පිංගල. කිරි පැනින් සෝදා පහ කළ හැක්කේ ශරීරයේ කිලුටක් පමණයි. ඇහැට වැටුණු දූලි රොදක් නම් පිහ දමා හරින්න පුළුවන් නැත්නම් සෝදා දමන්න පුළුවන්

කිරි පැනින් මුව දොවා
ඉවත් කළ හැකි කිලුටු මලකින්
නොවේ මේ වර මලින වූයේ

සිත් සතන් මගෙ, ශිෂ්‍යයිනි ප්‍රිය
පෙර කතක දුටු විගස
කිරි පැනින් මුව දොවා
කිලුට පහ කර ගතිමි
ඇස වැටුණු දූලි රොද
පිස දමා හරින මෙන්
මෙවර නම් කිරි පැනින්
සත් වරක් දෙවූවද
ඇතුළත හටගත් කිලුටු මල නැත
පහ වී යන්නෙ පහසුවෙන් මගෙ

එනයින් බලන කල සිදුව ඇත්තේ චිත්ත විපර්යාසයකි. මේ විපරිවර්තනය ලෞකික චිත්ත ස්වභාවයයි. පාරලෞකික හෙවත් ලෝකෝත්තර තත්ත්වයට සිත නංවන තෙක් එනම් රාදොස් පහ කරන තෙක් නැතහොත් පෘථග්ජන භූමිය ඉක්මවන තෙක් ඒ ස්වභාවයට මුහුණ පෑමට සිදු වෙයි. ඒ බව නාට්‍යයේ කාව්‍යාකාරයෙන් මෙසේ දැක්වෙයි.

සතුරන් සහසක් කළද පරාජය
තම හට තම සිත වේ පසමිතුරා
ශිල්ප ශාස්ත්‍ර හැම පරතෙර දුටුවද
දතමනා දේ ගෙවා දත්තද
රාග දෝස දුරලන තුරු සිතිනා
නැත පිළිසරණක් පුහුදුන් සතහට

කෙසේ වෙතත් බමුණාට තම සිත දමජය කර ගන්නට මෙන්ම සමාජ සාධකයක්ද දමනය කරගන්නට මේ අවස්ථාව නොවිණ. ඒ බ්‍රාහ්මණ සමාජයේ පාදම වූයේ කුල ගර්වයයි. බ්‍රාහ්මණයා උතුම් යැයි සම්මත කුලයකද ස්වර්ණතිලකා පහත් යැයි සම්මත කුලයකද විය. සර්වතෝභද්‍ර වූ මැවුම්කාර බ්‍රාහ්මණයාගේ දැනුම උගන්වන පරපුරෙන් පරපුරට ගෙන යන ඇදුරා වෙත ස්වර්ණතිලකාගේ පියා ඔවුනගේ සමාජ තත්ත්වය මෙසේ හෙළි කරයි.

පින්වත් ඇදුරු සඳ
සෙත් වේවා ඔබට
පීඩාවක් කිසිදු කරනට නොසිතුවෙමු
උත්තර මධුරාවෙ කුලයක චණ්ඩාල
ගඳඹෙක් වේ ම පිය
යන්නෙමු තනතුරක් සොයා
රජ වාසලෙ
පංච මධුරා පුර රජිඳාගෙ සේවයෙ

කෙසේ නමුත් අවසන සම්මතයට අනුව කුලීන බමුණා සිය සිතට වහල් වී සමාජ සම්මුතියද මැඩ සම්මතයට අනුව කුලහීන ස්වර්ණතිලකා පාවා ගනියි. ඉන් පසු සිසුන් කෙරේ දයාවෙන් ශිල්පදානය පමා වෙයි. එයින් උරණ වන සිසුහු තමනගේ ඉගෙනුම වන හානියට මෙන්ම ගුරු බැතියත් මතු කොට ඇයගෙන් තම ගුරුට සිදු වූයේ අවැඩකැයි සිතා උපක්‍රමශීලීව ඇය මරා දමයි. ඒ අනුව නාට්‍ය ශෝකාන්තයකින් අවසන් වෙයි. පෙර කී පරිදි රමණීය ප්‍රේමය මරණීය වෙයි. සිසුහු කුමන්ත්‍රණය කළේ කුමක් නිසාද? ගුරු ගෞරවය නිසාය. නැත්නම් ඒ හා බැඳි තමනට ශිල්ප ලබා ගැනීමේ අවස්ථාව මග හැරෙන නිසාය. එහෙත් ඒ ආසන්න සාධකවලට මූල සාධකය වූයේ අන්කිසිවක් නොව ගුරුවර සිත

හටගත් ප්‍රේමයයි. එනිසා ඒ ප්‍රේමයම ස්වර්ණතිලකාගේ පශ්චාද් මරණ පරීක්ෂණයේ මරණයට හේතුව වන්නේය. ඒබ ව උද්දාල බමුණා මෙසේ පවසයි.

එසේ වී නම් ස්වර්ණතිලකා
මැරුම් කෑයේ මා අතින් ම
යි
මගේ පණ හා සරිව ඉන්නා
සිසුන්ගෙන් නම් මැරුම් කෑවේ
මා අතින්මයි මැරුම් කෑවේ
ස්වර්ණතිලකා ළඳුනි මම ඔබ
කුරිරු මරුගේ මුවෙහි හෙළුවෙමි
පිය සිසුනි ඔබ කෙරේ නැත මා
සිතෙහි අල්ප වූ වෛරයක් වත්
දෙමි සමා මම ඔබට

මේ අනුව සරච්චන්ද්‍රයන්ගේ මෙම කාව්‍යයෙන් සත්නිවේදනය වන ගැඹුරු දහම් පණිවුඩයක් දැකිය හැකිය. ඒ නාට්‍යයේ නාමයෙන්ම අර්ථවත් වූ ප්‍රේමය ශෝකය ජනනය කරන බවයි. එය නිර්වාණගාමී ප්‍රතිපදාවේදී ප්‍රත්‍යක්ෂ වන ප්‍රේමය ශෝකය හා බිය ඇති කරන්නේය යන්නත් ප්‍රේමයෙන් විනිර්මුක්ත වූ කල සෝකයක් නැත බියක්ද කොයින්ද යන දර්ශනයයි. මේ අනුව සනාථ වන්නේ පෙමතො ජායතී සොකො නිර්මාණය මගින් සරච්චන්ද්‍රයන්ගේ අප හසු නොකරගත් විචාරයට නතු නොකළ පාරලෞකික චින්තනයක් සංනිරූපණය වන බවයි.

ප්‍රේමය නිසා අකලට මිලින වූ ජීවිත එදාත් අදත් බෙහෙවි. වර්තමානයේ ප්‍රධාන මාධ්‍යයෙන් මෙන්ම සමාජ මාධ්‍යයෙන්ද ප්‍රේමයේ ශෝකාන්ත වෙනදාටත් වඩා වැඩියෙන් ඇසෙන බව බොහෝ අය විශ්වාස කරති. එවන් පසුබිමක පෙමතො ජායති සොකෝ නාට්‍යයෙන් ලැබෙන පණිවුඩය තීව්‍ර ලෙස සමාජගත කළ යුතු නොවේදැයි අප කල්පනා කළ යුතුය. උසස් පෙළට නිර්දිෂ්ට නාට්‍ය පෙළ ලෙසළු ඒ තිබීම එහිලා යහ ප්‍රවණතාවක් වුවද එය කලා අංශයටත් එයින්ද සිංහල විෂය හදාරන්නන්ටත් පමණක් සීමා වෙයි. පෙමතො ජායති සොකො නාට්‍ය මතු නොව එහි ගුවන් විදුලි නාටකය මෙකල ගුවනින් නැවත ප්‍රචාරය වන්නේ නම් එයින් අනිර්වචනීය වූ මාහැඟි වූ මෙහෙවරක් ඉටු වනු ඇතැයි සුනන්ද මහේන්ද්‍රයන්ද ලියා ඇත. ඒ සියල්ලෙන් විශද වන්නේ සරච්චන්ද්‍රයන්ගේ පෙමතො ජායති සොකො නාට්‍යයේ සාර්වත්‍රික සාර්වභෞමික සර්වකාලීන විශ්වව්‍යාපී අගයත් ඒ අගය ඊට ලැබී ඇති බොදු හරය වූ පාරලෞකික චින්තනයත්ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**


ගලහිටියාව, පී. බී. (2017) පෙමතො ජායතී සෝකෝ රසාස්වාදය හා විචාරය, කොළඹ : නිර්මල.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය (2005) නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මහේන්ද්‍ර, සුනන්ද (2021) සරච්චන්ද්‍ර රැස් වළල්ල, මරදාන : දයාවංශ ජයකොඩි.

සරච්චන්ද්‍ර, එදිරිවීර (2010) පෙමතෝ ජායතී සෝකෝ සහ තවත් නාට්‍ය, කොළඹ : ප්‍රදීප.